පාර්ලිමේන්තු ප්‍රකාශනමාලා අංක 90

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

අට වැනි පාර්ලිමේන්තුව

(පළමු සැසි වාරය)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ පළමුවන වාර්තාව

(2016.01.26 සිට 2016.04.08 දක්වා)

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා විසින්

2016 අගෝස්තු මස 09 වන දින

ඉදිරිපත් කරන ලදී.

2016 අගෝස්තු මස 09 වන දින ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණය කළ යුතු යැයි නියෝග කරන ලදී.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
අට වැනි පාර්ලිමේන්තුව (පළමු සැසිවාරය)

අටවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය සඳහා වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 24 දෙනෙකුගේ සාමාජිකත්වයෙන් යුක්තව 2015 නොවැම්බර් මස 26 දින පත් කරන ලදි. එහි වර්තමාන සාමාජිකත්වය පහත පරිදි වේ.

1. ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා (සභාපතිතුමා)
2. ගරු රවුෆ් හකීම් මහතා
3. ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
4. ගරු දයාසිරි ජයසේකර මහතා
5. ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා
6. ගරු රවීන්ද්‍ර සමරවීර මහතා
7. ගරු සුජීව සේනසිංහ මහතා (2016.07.07 දින පත් කරන ලදී)
8. ගරු වසන්ත අලුවිහාරේ මහතා
9. ගරු ලසන්ත අලගියවන්න මහතා
10. ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා
11. ගරු අජිත් පී. පෙරේරා මහතා
12. ගරු රන්ජන් රාමනායක මහතා
13. ගරු අශෝක් අබේසිංහ මහතා
14. ගරු අනුර දිසානායක මහතා
15. ගරු චන්ද්‍රසිරි ගජදීර මහතා
16. ගරු මහින්දානන්ද අළුත්ගමගේ මහතා (2016.05.17 දින පත් කරන ලදී)
17. ගරු බිමල් රත්නායක මහතා
18. ගරු වීරකුමාර දිසානායක මහතා
19. ගරු මාවෙ සෝ. සේනාධිරාජා මහතා
20. ගරු අබ්දුල්ලාහ් මහ්රූෆ් මහතා (2016.04.07 දින පත් කරන ලදී)
21. ගරු එස්. ශ්‍රීතරන් මහතා
22. ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
23. ගරු හෙක්ටර් අප්පුහාමි මහතා
24. ගරු වේලු කුමාර් මහතා (2016.07.05 දින ඉල්ලා අස්වන ලදී)
25. ගරු (වෛද්‍ය) නලින්ද ජයතිස්ස මහතා
26. ගරු ප්‍රසන්න රණතුංග මහතා (2016.04.07 දින පත් කරන ලදී - 2016.05.17 දින ඉල්ලා අස්වන ලදී)
27. ගරු හර්ෂණ රාජකරුණා මහතා
28. ගරු ඥානමුත්තු ශ්‍රීනේසන් මහතා

පටුන

පිටු අංක

සභාපතිතුමාගේ සටහන... v

පෙරවදන.. vii

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට මුහුණ දීමට සිදු වී ඇති පොදු ගැටලු…………………………………………………… ix

පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවේ උන්නතිය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග……………………………………… xi

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වැඩ කටයුතුවල තත්ත්වය නගා සිටුවීම සඳහා කමිටුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග…………………………………………….. xiii

විමර්ශනය කරන ලද ආයතන.. 1

ලංකා බැංකුව.. 3

ලංකා විදුලිබල මණ්ඩලය.. 7

එල්.ටී.එල්.හෝල්ඩින්ස් සමාගම... 19

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම............................ 31

ශ්‍රී ජයවර්ධනපුර රෝහල් මණ්ඩලය....................................... 37

ජාතික වැඩිහිටි ලේකම් කාර්යාලය.. 41

සීමාසහිත ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගම................................ 45

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව.. 53

ජනතා වතු සංවර්ධන මණ්ඩලය... 61

ශ්‍රී ලංකා මහ බැංකුව.. 67

කෘෂිකර්ම සහ කෘෂි රක්ෂණ මණ්ඩලය.................................. 73

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය.. 77

තල් සංවර්ධන මණ්ඩලය.. 83

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව.................................... 87

ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව.. 91

ජාතික චිත්‍රපට සංස්ථාව.. 99

සීමාසහිත ඇල්කඩුව වැවිලි සමාගම.. 103

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය........................ 107

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව... 111

සභාපතිතුමාගේ සටහන

මීට ප්‍රථම බොහෝ අවස්ථාවලදී පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳව කාරක සභාවේ වාර්තා සභාගත කෙරුණේ වාර්ෂිකව හෝ විශාල කාල පරාසයකට අදාළව වුවත් මෙවර කාර්තුවක් තුළ (කෙටි කාලීනව) වාර්තාවක් සභාගත කිරීමට හැකිවීම සභික මන්ත්‍රීවරුන්ගේත්, ලේකම් කාර්යාලයේ නිළධාරී මණ්ඩලයේත් සාමූහික උත්සාහයේ ජයග්‍රාහී ප්‍රතිඵලයකි.

මෑත කාලීනව පාර්ලිමේන්තුවේ ප්‍රධාන කටයුතු තරමටම පොදු ව්‍යාපාර පිළිබඳව කාරක සභාවේ කටයුතු පිළිබඳවත් පොදු ජනතාව තුළ ඇත්තේ අතිමහත් උනන්දුවකි. එම උනන්දුවම මෙම කාරක සභාවේ කටයුතු වලින් ජනතාව අපේක්ෂා කරන සාධාරණය ඉටු වීමක් ලෙස සළකමි.

බොහෝ දෙනා පොදු ව්‍යාපාර කාරක සභාව "හොරු අල්ලන තැනක්" ලෙස දැකීමට පුරුදු වී සිටියත් අපගේ කාර්යභාරය රාජ්‍ය මූල්‍ය පාලනය සහ පාර්ලිමේන්තුවේ බලය ප්‍රායෝගිකව ක්‍රියාවට නැඟීම බව අප හොඳින් තේරුම් ගෙන ඇත. වංචා දූෂණ මුළුමනින්ම, පවතින ක්‍රමය තුල මැඩ පැවැත්විය නොහැකි බව පිළිගත යුතු යථාර්තයයි. නමුත්, රාජ්‍ය ව්‍යාපාර වලින් දැනට වඩා ප්‍රගතියක් හා මහජන සේවාවක් ජනතාවට ලබා දිය හැකි ආකාරයේ ක්‍රමවේද සකස් කල හැකිව ඇත.

අපගේ අධීක්ෂණයට ලක්වන 450 ක් පමණ වන රාජ්‍ය ව්‍යාපාර, ආර්ථිකයේ මර්මස්ථාන බව පැහැදිලිය. එම රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය තුලින් ජනතාවට උපරිම ප්‍රතිඵල ලඟා කර දීම අපගේ උත්සහය යි. ඒ සඳහා මගේ කාරක සභාවේ සියළුම සභික මන්ත්‍රීවරුන් පක්ෂ විපක්ෂ භේදයකින් තොරව ලබා දෙන සහාය මම අගය කරමි. එසේම, සීමිත ඉඩකඩක සීමිත සම්පත් යටතේ තම වගකීම උපරිම ලෙස ඉටු කරන ලේකම්තුමිය ඇතුළු කාරක සභා කාර්ය මණ්ඩලයේ උපරිම දායකත්වය නොවන්නට මෙම වාර්තාව මේ තරම් කෙටි කාලයකින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ හැකි නොවනු ඇත.

පොදු ව්‍යාපාර පිළිබඳව කාරක සභාවට විගණකාධිපතිතුමා හා එතුමාගේ දෙපාර්තමේන්තුවේ සියළු නිළධාරීන් වෙතින් ලබා දෙන සහාය නොවන්නට පොදු ව්‍යාපාර කාරක සභාව අද දකින ප්‍රගතිය ජනතාවට අත් විඳීමට නොලැබෙන බව පැහැදිලිය.

අප මහජන නියෝජිතයින් ලෙස වගකිව යුත්තේ අපගේ තනතුරු වලට හෝ අප ලබන වරප්‍රසාද වලට නොව අප පාර්ලිමේන්තුවට පත් කළ ජනතාවට යි. ජනතාව රාජ්‍ය ව්‍යාපාර වල අයිතිකරුවන්ය. ඔවුන් රාජ්‍ය ව්‍යාපාර වල සත්‍ය කොටස් හිමියන්ය. එම නිසා ඔවුන්ගේ බදු මුදල්, වඩා සාධාරණ ප්‍රතිලාභ ජනතාවට ලැබෙන ලෙස රාජ්‍ය ව්‍යාපාර තුලින් යෙදවෙන බවට අපි වග බලා ගත යුත්තෙමු.

මෙම වාර්තාව, සළකා බැලීමට ලක් කෙරෙන ආයතන පිළිබඳව සම්පූර්ණ වාර්තාවක් නොවන අතර යථාරූපී ලෙස ක්ෂණික වෙනස්කම් වලට ලක් කිරීමට අදාල කරුණු ප්‍රමාණයක් සාරාංශ කළ ලේඛණයක් ලෙස සලකන මෙන් ගරු පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටිමි.

සුනිල් හඳුන්නෙත්ති, පා.ම.,
සභාපති
පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව

<u>පෙරවදන</u>

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වන වගන්තිය ප්‍රකාරව මහජන මුදල් සම්බන්ධ පූර්ණ බලතල ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සතු වන අතර පාර්ලිමේන්තුව මගින් සම්මත කරන ලද නීතියකට පරිබාහිරව බදු පැනවීමට කිසිදු පළාත් හෝ ප්‍රාදේශීය පාලන අධිකාරියකට බලය නොමැත.

විවිධ ව්‍යවස්ථාපිත ප්‍රතිපාදන යටතේ විධායකය පාර්ලිමේන්තුවට වගවීමෙන් බැඳී සිටී. විසර්ජන පනත මගින් වෙන් කරන ලද මහජන මුදල් රජය මගින් අපේක්ෂිත අරමුණු වෙනුවෙන් වියදම් කරන්නේද යන්න සහ අපේක්ෂිත අරමුණු ලඟා කර ගත්තේද යන්න දැන ගැනීමට පාර්ලිමේන්තුවට හිමිකමක් ඇත.

විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියළු රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළඳ ව්‍යාපාර සහ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස් වලින් 50% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව විගණනය කරනු ලැබිය යුත්තේය.

ඊට අමතරව වර්තමානයේදී කමිටුව විසින් අයතනයන්හි කාර්ය සාධනය සහ ඒවායේ වත්මන් කටයුතු ද පරීක්ෂාවට ලක් කරනු ලබයි.

ඒ සඳහා ස්ථාවර නියෝග 126 ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් බලය පවරනු ලැබූ ව්‍යවස්ථාදායක ව්‍යුහය වනුයේ **<u>පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවයි.</u>**

වර්ෂ 1979 දී පිහිටුවන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව රාජ්‍ය ආයතනවල යහපාලනය නංවනු වස් මැත ඉතිහාසය තුළ ලබා දෙන ලද දායකත්වය අතිමහත්ය.

පසුගිය වසරවල නිකුත් කරන ලද විගණන වාර්තා, එකී ආයතනවල සහ අදාල රේඛීය අමාත්‍යාංශවල නිලධාරින්ගෙන් ලබා ගන්නා ලද ලිඛිත සහ වාචික පැහැදිලි කිරීම්, විමර්ශනයට ලක් කරන ලද දිනය වන විට ඒ ඒ ආයතනවල පැවති කාර්යය සාධනය සහ වර්තමාන කරුණු මත පදනම්ව මෙම වාර්තාව පිළියෙල කර ඇත.

මෙම වාර්තාව 2016.01.26 දින සිට 2016.04.08 වන දින දක්වා සිදු කළ විමර්ශන පදනම් කරගත් අතුරු වාර්තාවක් වන අතර, මෙය ආයතන සම්බන්ධයෙන් කරන ලද විමර්ශනවල සංක්ෂිප්ත කරුණු අඩංගුවක් පමණි.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට මුහුණ දීමට සිදු වී ඇති පොදු ගැටලු

- අමාත්‍යාංශ මට්ටමෙන් සහ ආයතනික මට්ටමෙන් කමිටුවේ නිර්දේශ වලට, එකඟ වූ කාල සීමාව තුළදී ප්‍රතිචාර නොදැක්වීම.

- ඇතැම් අමාත්‍යාංශ සහ අමාත්‍යාංශවල විෂයය පථය යටතේ ඇති ආයතන අතර ඇති සම්බන්ධීකරණය සතුටුදායක මට්ටමෙන් නොපැවතීම.

- කමිටුව විසින් කරනු ලබන නිර්දේශ අදාල ආයතන මගින් නොසලකා හරින අවස්ථාවලදී ඔවුන්ට එම නිර්දේශවලට අනුගත වන ලෙස බල කිරීමේ බලතල කමිටුව සතු නොවීම.

- කමිටුවේ වැඩ කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමටත් එහි වැඩි දියුණුව පිණිස මෙන්ම එම කාරක සභාව පිහිටුවීමේ මූලික අරමුණු නිසි පරිදි ඉටු කර ගැනීමට ස්ථාවර නියෝග වලින් ඇති අවහිරතා

- විගණන කාර්යය පිළිබඳ මනා අවබෝධයක් ඇති විශේෂඥ කණ්ඩායමක සහාය ලබා ගැනීමේ අවශ්‍යතාව කමිටුව මගින් පෙන්වා දි ඇතත් මෙතෙක් එම සහාය කමිටුවට නොලැබීම.

- කාරක සභාව හමුවට ආයතන කැඳවා විමර්ශනය කිරීමේදී ආයතන තුළ ඇති ගැටලු ගැන සාකච්ඡා කරන විට නොයෙකුත් ආකාරයේ නීතිමය ප්‍රශ්න පැන නගින අතර එවැනි අවස්ථාවලදී බොහෝ විට නීතිපතිගේ මතය විමසීම සිදු වන බැවින් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරියෙකුගේ සහාය ලබා ගැනීමට නීතිපති වෙත ඉල්ලීමක් කර ඇතත් මෙතෙක් එම ඉල්ලීම සඳහා නිසි ප්‍රතිචාර නොලැබීම.

- පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මහජන මුදල් නිසි ලෙස සහ ඥානාන්විත ලෙස අපේක්ෂිත අරමුණු අනුව වැය වන බවට වග බලා ගැනීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීන් ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන් සතු වගකීමකි. යම් අක්‍රමිකතාවයක් දේශපාලන අධිකාරියේ බලපෑම මත හෝ ආයතනවල අවශ්‍යතාවය මත අමාත්‍යාංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතියකින් තොරව ගනු ලැබූ තීරණ

මත සිදු ව තිබූ පමණින් අමාත්‍යාංශ ලේකම්වරුන්ට එකී අක්‍රමිකතාවයන් සම්බන්ධ වගකීමෙන් බැහැර වීමට නොහැකි වන්නේ මුදල් පිළිබඳ පාලන බලය ඔවුන් සතු වන බැවිනි. නමුත්, මූල්‍ය පාලනය පිළිබඳව පාර්ලිමේන්තුවට අදාල ගණන් දීමේ නිලධාරින්ගේ වගකීම ගැන සෑහීමකට පත් විය නොහැකිය. ඒ සඳහා අමාත්‍ය මණ්ඩලය ඇතුළු විධායකයේ ප්‍රමාණවත් අවධානයක් නොතිබීම.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ උන්නතිය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග

- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සාමාජිකත්වය දරනු ලබන මන්ත්‍රීවරුන්ට විදේශීය රටවල ඇති මෙවැනි කාරක සභාවල ක්‍රියාකාරිත්වය පිළිබඳව අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව සැලසීම මෙන්ම දේශීය පුහුණුව ලබාදීම.

- පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභා කාර්යාංශයේ කාර්ය මණ්ඩලයට ප්‍රමාණවත් පහසුකම් ලබා දීම සහ වෙනත් රටවල මෙවැනි කාරක සභා ක්‍රියාත්මක වන ආකාරය ගැන අත්දැකීම් ලබා ගැනීමට අවස්ථාව ලබා දීම සහ දේශීය පුහුණුව ලබාදීම.

- පරිහරණය කරන්නාට පහසුවෙන් භාවිතා කළ හැකි මෙන්ම සහ පහසුවෙන් තොරතුරු ගලායාමට සහ තොරතුරු ගලාඒමට හැකි වන සේ පරිගණක වැඩ සටහනක් හඳුන්වා දීම.

- කාරක සභාවට අනුයුක්ත කර ඇති කාර්ය මණ්ඩලය ඉතාමත් සීමිත බැවින් එම සංඛ්‍යාව කාරක සභවේ ඇති අධික වැඩ කටයුතුවලට සමගාමී ලෙස ප්‍රමාණාත්මකව වැඩි කිරීම.

- කාරක සභා කාර්යංශය ගබඩා පහසුකම් සහිත වඩාත් ඉඩ කඩ ඇති ස්ථානයක ස්ථාපිත කිරීම.

- පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛනය ‘‘ආ’’ අංක 9 හි සඳහන් පරිදි ‘‘පාර්ලිමේන්තුවේ කාරක සභාවක කටයුතු කිසිවක් පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට පෙර , ඒවා ප්‍රකාශනය කිරීම’’ වරදක් වන අතර එය සංශෝධනය කර කාරක සභාවේ විමර්ශන කටයුතු මාධ්‍ය ඔස්සේ ජනතාවට විවෘත කිරීමට අවශ්‍ය කටයුතු කිරීම සහ පාර්ලිමේන්තුවේ වාර්තා සභාගත කිරීමට පෙර විමර්ශන කටයුතුවලින් අනාවරණය වූ කරුණු පාර්ලිමේන්තුව තුළදී සහ ඉන් පිටතදී කතා කිරීමට අවශ්‍ය බලය ලබාදීම.

- කාරක සභාවල කටයුතු නිරීක්ෂණය කිරීම සඳහා මාධ්‍ය වලට සහභාගී වීමට ඉඩ සලසා දීමට ඇති බාධාවන් ඉවත් කිරීම පිණිස ස්ථාවර නියෝග සංශෝධනය මගින් අවස්ථාව ලබාදීම.

- කාරක සභා වාර්තා සභාගත කළ විට ඒ පිළිබඳව විවාද කිරීමේ අවස්ථාව ලබාදීම.

- කාරක සභාව මගින් අදාල ආයතන සම්බන්ධයෙන් කරනු ලබන නිර්දේශ එම ආයතන මගින් ක්‍රියාත්මක කරවීමට හැකි වන සේ, කාරක සභාවට දැනට ඇති සීමිත බලතල වැඩි කිරීම.

- කාරක සභාව මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්තා මුදල් විෂයය භාර අමාත්‍යවරයා සහ අනෙකුත් විෂයයන් භාර අමාත්‍යවරුන් වෙත යවනු ලබන අතර එම අමාත්‍යවරුන් විසින් මාසයක් ඇතුළත වාර්තාවට ප්‍රතිචාර දක්වා, ක්‍රියාත්මක කිරීමට අදාල කාල රාමුවක්ද සහිතව කුමන නිර්දේශ පිළිගනු ලබන්නේද යන්න දක්වනු ලැබිය යුතුය. ක්‍රියාත්මක කළ නොහැකි නිර්දේශ සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සපයනු ලැබිය යුතු අතර, එලෙස මතු කරන ලද ගැටලු සම්බන්ධයෙන් ඒ වෙනුවට ගනු ලබන ප්‍රතිකර්මීය පියවර පිළිබඳ විස්තරයක්ද ඒ සමග සපයනු ලැබිය යුතුය.

- දැනට ස්ථාවර නියෝග මගින් සළකා බලනු ලබන්නේ වියදම් පමණක් බැවින් ආදායම් සම්බන්ධයෙන්ද අවධානය යොමු වීමේ අවශ්‍යතාව පැන නැගී ඇත.

- රජය හෝ රාජ්‍ය ආයතන සතු සමාගම් පිළිබඳව විගණනයට විගණකාධිපතිට බලය දී ඇතත් ඒ ආයතන සම්බන්ධව ක්‍රියා කිරීමට 126 ස්ථාවර නියෝගය යටතේ නිශ්චිත බල පැවරුමක් නොමැත. එය ආවරණය වන පරිදි බල පැවරුමක් කිරීමට 126 ස්ථාවර නියෝගය සංශෝධනය කිරීම අවශ්‍ය වේ.

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ වැඩ කටයුතුවල තත්ත්වය නගා සිටුවීම සඳහා කමිටුව විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග

- කමිටුවේ වැඩ කටයුතු විධිමත් ලෙස පවත්වාගෙන යාමටත් එහි වැඩි දියුණුව පිණිස මෙන්ම එම කාරක සභාව පිහිටුවීමේ මූලික අරමුණු නිසි පරිදි ඉටු කර ගැනීමට ස්ථාවර නියෝග සංශෝධනය කිරීම සඳහා පත් කර ඇති ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට අදහස් දැක්වීම සඳහා අවස්ථාව සලසා දෙන ලෙස සභාපතිතුමා විසින් ගරු කථානායකතුමාගෙන් ඉල්ලීමක් කිරීම.

- විගණන කාර්යය පිළිබඳ මනා අවබෝධයක් ඇති විශේෂඥ කණ්ඩායමක සහාය ලබා ගැනීමේ අවශ්‍යතාව කමිටුව මඟින් පෙන්වා දීම.

- කාරක සභාව හමුවට ආයතන කැඳවා විමර්ශනය කිරීමේදී ආයතන තුළ ඇති ගැටලු ගැන සාකච්ඡා කරන විට නොයෙකුත් ආකාරයේ නීතිමය ප්‍රශ්න පැන නගින අතර එවැනි අවස්ථාවලදී බොහෝ විට නීතිපතිගේ මතය විමසීම සිදු වන බැවින් නීතිපති දෙපාර්තමේන්තුවේ නීති නිලධාරියෙකුගේ සහාය ලබා ගැනීමට නීතිපති වෙත ඉල්ලීමක් කිරීම.

- කමිටුව විසින් මෙතෙක් කැඳවන ලද ආයතන සම්බන්ධයෙන් දෙනු ලැබූ සියලුම නිර්දේශ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමාගේ අවධානය යොමු කිරීම සහ කමිටුවේ උන්නතිය සඳහා ගත හැකි ක්‍රියාමාර්ග ගැන ගරු අග්‍රාමාත්‍යතුමා සමග 08.06.2016 වන දින සාකච්ඡා කිරීම.

- කමිටුව විසින් මෙතෙක් කැඳවන ලද ආයතන සම්බන්ධයෙන් දෙනු ලැබූ සියලුම නිර්දේශ පිළිබඳව ගරු අග්‍රාමාත්‍යතුමා මගින් කැබිනට් මණ්ඩලයේ අවධානය යොමු කිරීමට කටයුතු කිරීම.

- කාරක සභාව යටතට ගැනෙන සියලුම ආයතන වෙත ඔවුන්ගේ ආයතනය ලබා ඇති ස්ථානය නිර්ණය කිරීමට හැකි වනු පිණිස විගණකාධිපති දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් සකසන ලද ප්‍රශ්නාවලියක් යැවීම.

- ආයතනයක් කැඳවනු ලැබීමෙන් පසු කාරක සභාවේදී දෙන ලද නිර්දේශ ඇතුළත් සාරාංශගත වාර්තාවක් සභාපතිතුමා, අදාල ලේකම්, ආයතන ප්‍රධානියා, විගණකාධිපති ඇතුලු අනෙකුත් නිලධාරීන් වෙත ඉතාමත් ඉක්මනින් ලැබීමට සැලැස්වීම.

- කාරක සභාවේ වැඩ කටයුතු ප්‍රසාරණය කරමින් අනෙකුත් කාරක සභා සමග නිසි සම්බන්ධීකරණයෙන් සහ සහයෝගයෙන් යුතුව වැඩ කටයුතු කිරීම.

  නිදසුන- කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ සභාපති ගේ ලබැඳියා ගැටුම (conflict of interest) පිළිබඳව උසස් නිලතල පිළිබඳ කාරක සභාව වෙත කරුණු ඉදිරිපත් කිරීම

- කාරක සභාවේ සභික මන්ත්‍රීවරුන්ගේ සහ පාර්ලිමේන්තු කාර්යය මණ්ඩලයේ දැනුම වර්ධනය කිරීමේ වැඩමුළුවලට සහභාගි වීම.

- ආයතන කැඳවනු ලබන රැස්වීම් සතියට පෙර සතියේ සභාපතිතුමා, කමිටුවේ ලේකම් ,විගණකාධිපති සහ ඔහුගේ අදාල කාර්යය මණ්ඩලය සහ කමිටුවේ අදාල පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සමග ඉදිරි සතියේ කැඳවීමට අදාල ආයතනවල කාර්ය සාධනය හා මූල්‍ය තත්ත්වය පිළිබඳව සලකා බැලීමේ පූර්ව සමාලෝචන රැස්වීමක් පැවැත්වීම.

අටවැනි පාර්ලිමේන්තුවේ පළමු සැසිවාරය

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව
පළමුවැනි වාර්තාව

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව එහි අටවැනි පාර්ලිමේන්තුවේ පළමුවැනි වාර්තාව ඉදිරිපත් කරන්නේ සතුටිනි.

විගණකාධිපතිවරයා විසින් ආණ්ඩුවේ සියළු රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස් වලින් 50% ක් හෝ ඊට වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය සමාගමක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම්ද ඒවායේ ගිණුම් ඇතුළුව, පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව යටතේ පරීක්ෂාවට භාජනය කරනු ලබයි.

ඒ අනුව, 2016.01.26 දින සිට 2016.04.08 දක්වා කාල සීමාව තුළ කමිටුවේ විමර්ශනයට ලක්වූ පහත සඳහන් ආයතන 19 ට අදාල නිරීක්ෂණ සහ නිර්දේශ මෙම වාර්තාවට අන්තර්ගත කර ඇත.

2016 වර්ෂයේ පොදු ව්‍යාපාර කාරක සභාව මගින් විමර්ශනය කරන ලද ආයතන

	ආයතනය	විමර්ශනය කරන ලද දිනය
1	ලංකා බැංකුව	**2016.01.26**
2	ලංකා විදුලිබල මණ්ඩලය	**2016.01.28**
3	එල්.ටී.එල්.හෝල්ඩින්ස් පුද්ගලික සමාගම	**2016.02.09**
4	සි/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම	**2016.02.09**
5	ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය	**2016.02.10**
6	ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය	**2016.02.11**
7	සී/ස ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම	**2016.02.12**
8	රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව	**2016.02.23**
9	ජනතා වතු සංවර්ධන මණ්ඩලය	**2016.02.24**
10	ශ්‍රී ලංකා මහ බැංකුව	**2016.02.25**
11	කෘෂිකර්ම සහ කෘෂි රක්ෂණ මණ්ඩලය	**2016.02.26**
12	ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය	**2016.03.08**
13	තල් සංවර්ධන මණ්ඩලය	**2016.03.11**
14	ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව	**2016.03.23**
15	ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව	**2016.03.23**
16	ජාතික චිත්‍රපට සංස්ථාව	**2016.03.24**
17	සි/ස ඇල්කඩුව වැවිලි සමාගම	**2016.04.06**
18	ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	**2016.04.07**
19	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව	**2016.04.08**

ලංකා බැංකුව

විමර්ශනය සිදු කළ දිනය - 2016.01.26

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. ගනුදෙනුකරුවන් 10 කගෙන් ලැබිය යුතු රු. මිලියන 322 ක් වූ අක්‍රිය ණය අය කර ගැනීමේ ප්‍රමාදයක් සහ ක්‍රමවේදයේ අඩුපාඩු පැවතීම

2014 දෙසැම්බර් 31 දිනට අක්‍රිය ගනුදෙනුකරුවන් 10 දෙනකුගෙන් ලැබිය යුතු මුළු අක්‍රීය ණය ශේෂය රු. 322,142,856/- ක් බවට කරුණු අනාවරණය විය. 2014 වසරේදී කපා හරින ලද ණය මුදලේ අගය රු. 54,690,892/- ක් වූ අතර ඊට අදාලව කපා හරින ලද පොළී මුදල රු. 67,615,763/- විය. කාරක සභාව කළ කරුණු විමසීමේදී ණය අය කර ගැනීමේ ක්‍රමවේදයේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

- ණය ලබා දීමේදී සහ අය කර ගැනීමේදී සාර්ථක ක්‍රමවේදයක් සහ පාලන පද්ධති නිසි පරිදි හඳුන්වා දීම සිදු නොවීම
- නීතිමය ක්‍රමවේදය නිසි පරිදි අනුගමනය නොකිරීම
- පුද්ගල ඇප මත පමණක් ණය දීම රැදී තිබීම
- දිගටම ණය නොගෙවූ ණයගැතියන්ගේ ණය නැවත නැවතත් අළුත් කිරීම
- ණය ලබා දීමේ ක්‍රමවේදය පිළිබඳ ආයතනය සැලකිලිමත් නොවීම
- කළමනාකරණ තීරණවල දුර්වලතා
- වැඩි කාලයක් ණය නොගෙවන ආයතන පිළිබඳව විශේෂ නිරීක්ෂණ කණ්ඩායමක් යොදවා ඔවුන් පිළිබඳව විමසා නොබැලීම

නිර්දේශ

විගණකාධිපති සහ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගනිමින් ණය අය කර ගැනීම සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් පැවැත්වීමට රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත නියෝග කළ අතර ඉදිරියේදී මෙවැනි තත්ත්වයන් ඇති වීම වැලැක්වීමට ගත හැකි ක්‍රියාමාර්ග ඇතුළත් සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට මාසයක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ද නියෝග කරන ලදි.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

ලබා දී ඇති වාර්තාවට අනුව අමාත්‍යාංශයේ ලේකම් විසින් ලංකා බැංකුවේ වත්මන් ණය අය කර ගැනීමේ ක්‍රමවේදය පිළිබඳව අධ්‍යයනය කර ණය අය කර ගැනීමේ ක්‍රමවේදයේ දියුණුව වෙනුවෙන් ලංකා බැංකුවට උපදෙස් ලබා දී ඇති බව දන්වා ඇත. ඒ පිළිබඳව නැවත වාර්තාවක් ලබා දෙන බව ද දන්වා ඇත. නමුත් එම වාර්තාව 2016.05.13 දින වන විටත් කාරක සභාව වෙත එවා නැත.

2. දිගින් දිගටම පාඩු ලබමින් ලන්ඩන් නගරයේ සහ අවදානමක් සහිතව සීෂෙල්ස් නගරයේ විදෙස් ශාඛා පවත්වාගෙන යෑම

විදෙස් ලංකා බැංකු ශාඛාවන් සම්බන්ධව කරුණු විමසීමේදී අනාවරණය වූයේ ලන්ඩන් ශාඛාව දිගින් දිගටම පාඩු ලබන බවයි. 2014 වසරේ එහි බදු වලට පසු ශුද්ධ පාඩුව රු. 122,031,000/- දක්වා ඉහල ගොස් තිබුණි.

සීෂෙල්ස් ශාඛාව දැනට ලාභ ලබා තිබුණත් මුළු තැන්පතු වලින් 62% ක අයිතිය ගනුදෙනුකරුවන් 03 දෙනකු පමණක් සතු වීමෙන් ව්‍යාපාර කටයුතු අවදානම් තත්ත්වයක පවතී. එමෙන්ම එම ශාඛාව පවත්වාගෙන යෑම වෙනුවෙන් විශාල පිරිවැයක් දරනු ලබයි.

නිර්දේශ

මෙම ශාඛා දෙක තවදුරටත් පවත්වාගෙන යෑමේ අවශ්‍යතාවය විමර්ශනය කර අමාත්‍යාංශ මට්ටමින් ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම.

සීෂෙල්ස් ශාඛාවෙහි වියදම් සහ ලාභයේ අනුපාතය, ශාඛාව සඳහා කර ඇති මූලික වියදම් ඇතුළත් වාර්තාවක් සති 02 ක් ඇතුළත කාරක සභාවට ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් ලබා දුන් වාර්තාව අනුව ලන්ඩන් ශාඛාව තවත් වසර දෙකක් පමණ ක්‍රියාත්මක වීමට ඉඩ ලබාදී ප්‍රගති සමාලෝචනයකින් පසුව තීරණයක් ගැනීම සුදුසු බවත් සීෂෙල්ස් ශාඛාව තවදුරටත් පවත්වාගෙන යෑමට ඉඩදිය යුතු බවටත් රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් නිර්දේශ ලෙස දන්වා ඇත.

3. බඳවා ගැනීම් පටිපාටි උල්ලංඝණය කරමින් කළමනාකරණ අභ්‍යාසලාභීන් 200 ක් බඳවා ගැනීම

2013 වසරේදී කළමනාකරණ අභ්‍යාසලාභීන් 200 ක් බඳවා ගැනීම විනිවිදභාවයකින් යුක්තව අපක්ෂපාතීව සිදු කර නොමැති බව ඒ පිළිබඳව කරුණු විමසීමේදී අනාවරණය විය.

මෙම බඳවා ගැනීමට අදාල 2013/10/03 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාව අනුව දෙවන පරීක්ෂණය ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සිදු කළ යුතු වුවද ඉහල කළමනාකරණයේ අවශ්‍යතාව මතම සාවද්‍ය තොරතුරු යොදා ගනිමින් පෞද්ගලික ආයතනයක් සම්බන්ධ කරගෙන විභාගය පවත්වා තිබුණි. ප්‍රශ්න පත්‍ර සැකසීම සහ ඇගයීම වෙනුවෙන් එම ආයතනයට ගෙවා තිබුණු මුදල රු. 2,098,800/- කි.

මෙහි දී බඳවා ගැනීමේ පටිපාටින් උල්ලංඝණය වී ඇති බවත් ඉහල කළමනාකරණ මට්ටමේ නිලධාරීන්ගේ දරුවන් හා ඥාතීන් ඇතුළත් කිරීමේ අභිලාශයෙන් ක්‍රියා කර ඇති බවත් නිරීක්ෂණය විය.

<u>නිර්දේශ</u>

i. රාජ්‍ය ආයතනයක, විභාග දෙපාර්තමේන්තුවට හෝ ඒ හා සමාන මට්ටමේ රජයේ විභාග පවත්වනු ලබන ආයතනයකට හැර වෙනත් ආයතනයකින් විභාග පැවැත්වීම නොකළ යුතු බව.

ii. එවැනි බඳවා ගැනීම් නිසා සුදුසුකම් සහිත ඉල්ලුම්කරුවන්ට සිදු වන අසාධාරණය පිළිබඳව යලි පරීක්ෂා කිරීම.

iii. විභාගය සමත්වූ අයදුම්කරුවන් 200 දෙනාගේ ජාතික හැඳුනුම්පත්වල සඳහන් ලිපින ඇතුළත් නාම ලේඛනයක් ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මේ සම්බන්ධව වගකිව යුතු නිලධාරීන්ට විනයානුකූලව කටයුතු කර ඇති බවත් බඳවාගත් අභ්‍යාසලාභියෙකු ආයතනයේ සේවය කරන නිලධාරියකුගේ දියණියක් බැවින් ඇය විසින් වන්දි ගෙවා සේවයෙන් ඉවත් වූ බවත් වැරදි නිවැරදි කිරීමට උපදෙස් ලබා දුන් බවත් එම වාර්තාවේ දැක්වේ.

2016.05.13 දින වන විටත් විභාගය සමත්වූ අයදුම්කරුවන් 200 දෙනාගේ ජාතික හැඳුනුම්පත්වල සඳහන් ලිපිනයන් ඇතුළත් නාම ලේඛනය කාරක සභාව වෙත ලැබී නොමැත.

ලංකා විදුලිබල මණ්ඩලය

විමර්ශනය සිදු කළ දිනය - 2016.01.28 හා 2016.03.24

හඳුනා ගත් ප්‍රධාන ගැටලු

1 විදුලි ඒකකයකට වැයවන මුදල රු 4/- ක්ව තිබියදී විදුලි ඒකකයක් සඳහා වැඩි මිලක් ගෙවීමට සිදුවීම.

විදුලි ඒකකයක් සඳහා සත්‍ය වශයෙන් වැය වන පිරිවැය රු 4/- ක් බව කාරක සභාව නිරීක්ෂණය කළ අතර පාරිභෝගිකයාට තමා පරිභෝජනය කරනු ලබන විදුලි ඒකකයක් සඳහා වැඩි මිලක් ගෙවීමට සිදුවීම සඳහා හේතු පාදක වන වැදගත් කරුණු කීපයක් කාරක සභාවට අනාවරණය විය.

ණය ලබා ගැනීම්

පසුගිය කාලයේ විවිධ ව්‍යාපෘති සඳහා විශාල වශයෙන් ණය ලබා ගැනීමට සිදුවීම නිසා එම ණය පියවීමට මණ්ඩලයේ මුදල් වැය කිරීමට සිදුවීමෙන් පිරිවැය ඉහල යාම නිසා විදුලිය එකකයක් වැඩි මිලකට නියම කිරීමට එක් හේතුවක් වී ඇති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

ණය ලබා ගැනීම් - (රු. මිලියන)	2013	2014	2015 (ඔක්තෝබර්)
බැංකු වලින් ණය ලබා ගැනීම	27,579	27,000	318
ණය සඳහා ප්‍රමාද ගෙවීම් මත පොළී	10,560	6,979	3,808
බැංකු ණය ගෙවීම්	22,963	16,612	10,728
නොපියවූ බැංකු ණය	44,404	54,791	44,381
ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හා නිදහස් විදුලි සැපයුම්කරුවන්ට ගෙවිය යුතු ණය	23,950	16,140	13,570

ණයගැතිභාවය හා ලැබිය යුතු ණය ශේෂ පැවතීම

විදුලිය සැපයීම වෙනුවෙන් රාජ්‍ය අංශයේ හා පුද්ගලික අංශයේ ආයතන වලින් මණ්ඩලයට ලැබිය යුතු ණය ශේෂ ප්‍රමාණය පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

2014 දෙසැම්බර් මස 31 දිනට වසර 2 ½ කට වඩා කල් ගත වූ විදුලිය බෙදාහැරීමේ අංශවලට අයත් රුපියල් මිලියන 4,132.3ක ණයගැති සහ වෙනත් ලැබිය යුතු ශේෂ ඇති බව පිළිබඳ කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

නිර්දේශ -

- මෙම මිලියන 4,132.3 සෑදී ඇති අකාරය පිළිබඳව සවිස්තරාත්මක වාර්තාවක් ලබා දීම.
- පෞද්ගලික අංශය සහ රාජ්‍ය ආයතනවල වසර 2 ½ ට වැඩි ණය ගැතියන් ගැන විමර්ශනයක් සිදු කිරීම.
- මෙම අයකර ගැනීම් සිදු නොකිරීමට වගකිව යුතු අංශ ප්‍රධානීන්/නිළධාරීන් හඳුනා ගැනීම.
- මේ පිළිබඳව වහාම විමර්ශනයක් විගණකාධිපතිවරයා විසින් සිදු කිරීම.
- ණය පියවා නැති ගණුදෙනුකරුවන්ගේ වෙනම ලේඛනයක් විගණකාධිපති වෙත ලබා දීම.
- එසේ ණය නොගෙවූ ගණුදෙනුකරුවන් හට සිහි කැඳවීම් යවා තිබේද? ඔවුන්ට විරුද්ධව ගත් ක්‍රියාමාර්ග මොනවාද යන්න සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම -

2016.03.18 දින වාර්තාවක් එවා ඇත. 2016 පෙබරවාරි මස 12 දින ඉහත කරුණු සම්බන්ධයෙන් සතියක් ඇතුලත කාරක සභාවට වාර්තාවක් ලබා දීම සඳහා තොරතුරු ලබාදෙන ලෙස විදුලිබල මණ්ඩලයේ සමාන්‍යාධිකාරී විසින් අදාල අංශ භාර අතිරේක සාමාන්‍යාධිකාරීවරුන් අමතන ලද ලිපියෙහි පිටපතක් එවා ඇත.

2. ඒකකයක් රු. 35 - 40 වැනි වැඩි මුදලකට පුද්ගලික අංශයෙන් විදුලි බලය මිලදී ගැනීමට යොමු වීම

දිවයිනෙහි දැනට පවතින අධික විදුලි ඉල්ලුම සඳහා සැපයුම ලබා දීම සඳහා ඇඹිලිපිටිය, පුත්තලම හා මාතර ප්‍රදේශයන්හි පවතින බලාගාර පුද්ගලික අංශයෙන් නැවත මිලදී ගැනීම විදුලිබල මණ්ඩලයේ අවධානය යොමු වී ඇත. කෙසේ වුවද එකී බලාගාර සඳහා රජය විසින් කලින් ගෙවීම් සිදු කර ඇති බැවින් නැවත ගෙවීම් සිදු කිරීමට අවශ්‍යතාවයක් ඇති වන්නේ කෙසේද යන්න කාරක

සභාව විමසීම් කරන ලදී. එකී බලාගාර පැවරුම් ගිවිසුම අනුව අදාල කාලයෙන් පසුව නැවත විදුලිබල මණ්ඩලයට පවරා දීම පිළිබඳව සඳහන් වී නොතිබීම හේතුවෙන් නැවත වටිනාකම තක්සේරු කර ඒවා මිලදී ගැනීමට සිදුව ඇත.

2014 හා 2015 වර්ෂවලදී පිළිවෙලින් රු.මි. 80, 519 හා රු. මි. 38,694 ක පමණ විදුලිය පෞද්ගලික අංශයෙන් මිලදී ගැනීම සිදු වුවද එම මිලදී ගැනීම් පිළිබඳවද, ඒවා මිල සූත්‍රයන් හා එකඟ වීම පිළිබඳවද ඒ පිළිබඳ විධිමත් පරීක්ෂණයක් සිදු නොවීම පිළිබඳවද, විගණන කටයුතු සඳහා ප්‍රමාණවත් තොරතුරු ලබා නොදීම ආදිය පිළිබඳවද කාරක සභාව කරුණු නිරීක්ෂණය කරන ලදී.

නිර්දේශ

- ක්‍රමවත් අධ්‍යානයකින් පසු මෙම බලාගාර මිලදී ගැනීම විදුලිබල මණ්ඩලයට වාසිදායක වේ යැයි නිරීක්ෂණය වන්නේ නම්, ඒ පිළිබඳ කාරක සභාවට වාර්තාවක් සැපයීම.
- එම සියලුම කරුණු පිළිබඳ අදාල තොරතුරු ලබා ගෙන විදුලිය මිලදී ගැනීම පිළිබඳ විධිමත් විගණනයක් සිදු කරන ලෙස විගණකාධිපතිට උපදෙස් ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.12 දින දක්වා වාර්තාව එවා තිබුනේ නැත.

3. අධික පරිපාලන වියදම්

1990 මාර්තු 09 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 15/90 ට සහ 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක පී.ඊ.ඩී./12 ට පටහැනි ලෙස සේවකයින් 333 ක් බඳවාගෙන ඇත.

අනුමත සේවක සංඛ්‍යාවක් නොමැතිව මිනිස් බල සැපයුම් සමාගම් වලින් සේවකයින් බඳවාගෙන තිබුණි.මණ්ඩලයේ අනුමත පිරිස් පාලන සැලසුම ඉක්මවා පිටතින් සේවකයින් සේවයේ යොදවාගෙන ඇති අතර නුපුහුණු ක්ෂේත්‍ර සේවකයින් අනුමත සේවක සංඛ්‍යාව ඉක්මවා තිබුණි.
(ඇමුණුම 01 - ආයතනයේ සේවක සංඛ්‍යා දත්ත)

අමාත්‍ය මණ්ඩලයේ හෝ මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව සේවකයන්ට විවිධ දීමනා 39ක් ගෙවීම සඳහා රු. මිලියන 849 ක් වැය කර ඇත.

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ නිර්දේශ නොමැතිව 2015 ජනවාරි 01 සිට "E-Scale" ලෙස නව වැටුප් තලයක් ඉන්ජිනේරුවරුන් සඳහා පිහිටුවා ගෙවීම් කිරීම.

<u>නිර්දේශ</u>

- දීමනා ගෙවීම සඳහා මේ වන විට අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන තිබේ නම් එහි පිටපතක් සතියක් ඇතුළත කාරක සභාවට ලබා දීම.
- කැබිනට් මණ්ඩල තීරණයක් පදනම් කර ගනිමින් ඒ අනුව එක් එක් ආයතනවලට සුවිශේෂ වන ලෙස විවිධ දීමනා ගෙවීම් නිසා ඇති වන විෂමතාවයන් පිළිබඳ නැවත සමාලෝචනයක් කිරීම.
- මේ පිළිබඳව මණ්ඩලයේ ස්ථාවරය සහ ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව කාරක සභාව වෙත ලිඛිතව දැනුම් දීම.
- විගණකාධිපති සමග සාකච්ඡා කොට මණ්ඩලයේ නිර්දේශය කාරක සභාව වෙත දැන්වීම.

❖ රාජ්‍ය ව්‍යවසායන්හි සේවකයන්ගේ උපයන විට ගෙවීම් බදු අයකර ගන්නා ලෙස මහා භාණ්ඩාගාරයේ ලේකම් විසින් සියළුම රාජ්‍ය ආයතන වල ලේකම් වරුන් වෙත 2016.04.29 දිනැති ලිපිය මගින් දන්වා ඇත.

<u>වර්තමාන තත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

- විවිධ දීමනා 39ක් ගෙවීම සඳහා අමාත්‍යමණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම සම්බන්ධයෙන් 2016.03.18 දින වාර්තාවක් එවා තිබුණි. මේ සම්බන්ධයෙන් විමර්ශනය කොට නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ නිර්දේශ, ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිසමේ කොන්දේසි වලට යටත් ව ක්‍රියාත්මක කළ යුතු බව දැනුම් දුන් බවට වන විදුලිබල හා බල ශක්ති අමාත්‍යාංශයේ ලේකම් විසින් විදුලි බල මණ්ඩලයේ සභාපති අමතන ලද 2008.04.17 දිනැති ලිපියේ පිටපතක් හා ඒ ආශ්‍රිත ලේඛන එවා ඇත.
- “E-Scale” ලෙස නව වැටුප් තලයක් ඉන්ජිනේරුවරුන් සඳහා පිහිටුවා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් පවරා ඇති බව සඳහන් කර ඇති අතර එම නඩුවේ තීන්දුව ලද පසු ඒ අනුව කටයුතු කරන බව දන්වා ඇත.
- මෙම ගෙවීම් සම්බන්ධයෙන් මණ්ඩලයේ ඇති වන වැටුප් විෂමතාවන් සම්බන්ධයෙන් ගතයුතු පියවර සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කර නැත.

<u>4. විදුලි බල මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන පරිපාලිත හා උප පරිපාලිත සමාගම්වල අත්තනෝමතික ක්‍රියා කලාපය සහ එම සමාගම් විදුලිබල මණ්ඩලයට වග නොකියන තත්වය</u>

විදුලිබල මණ්ඩලය යටතේ ක්‍රියාත්මක වන පරිපාලිත සමාගම් 20 ක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් සම්බන්ධයෙන් කාරක සභාව අධ්‍යයනයක් කරන ලද අතර එම සමාගම් බොහොමයක අධ්‍යක්ෂ මණ්ඩලයන්හි එකම පුද්ගලයන් නියෝජනය කරන ලද බව නිරීක්ෂණය කළාය. (ඇමුණුම -02) නිදසුනක් ලෙස විදුලිබල මණ්ඩලයේ සභාපතිවරයා එහි අනු සමාගම් 6 ක අධ්‍යක්ෂ

මණ්ඩලයන්හි සාමාජිකත්වය දරනු ලබන බවත් එවිට ඔහුට එකම ගැටලුව සම්බන්ධයෙන් ස්ථාවරයන් කීපයක් දැරිය හැකි බවත් එහිදී පාරිභෝගිකයන්ට ගුණාත්මක හා දැරිය හැකි මිලකට විදුලිය ලබාදීම යන ප්‍රධාන අරමුණ මග හැරී යා හැකි බවත් කාරක සභාව නිරීක්ෂණය කළාය. විදුලිබල මණ්ඩලය යටතේ පවතින අනු සමාගම්වල පහත ලක්ෂණ හඳුනාගන්නා ලදී.

- ලාභාංශ වැඩි ප්‍රමාණයක් එම සමාගම්වල රඳවා තබා ගැනීමට ක්‍රියා කිරීම
- විදුලි බල මණ්ඩලයට එම සමාගම් සම්බන්ධයෙන් පාලනයක් නැතිකම - එම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා විදුලිබල මණ්ඩලයේ හෝ අමාත්‍යාංශයේ නියෝජිතයකු හෝ භාණ්ඩාගාරයේ නියෝජිතයකු හෝ සහභාගී නොවන බව නිරීක්ෂණය විය. විශේෂිත කරුණු පමණක් එකී ආයතන දැනුවත් කරන බව දැනුම් දෙන ලදි.
- විදුලි බල මණ්ඩලය වැඩි කොටස් ප්‍රමාණයක් දැරුවද එම සමාගම්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලයට වගකීමට ඇති නොකැමැත්ත (ඇමුණුම 03 - විදුලි බල මණ්ඩලය යටතේ ඇති උප සමාගම්වල ව්‍යුහය හා එම සමාගම්වල විදුලිබල මණ්ඩලයට අයත් කොටස් ප්‍රමාණය)

<u>නිර්දේශ</u>

- විදුලිබල මණ්ඩලයේ සභාපතිගේ යෝජනාවක් අනුව අනු - සමාගමක් වන එල්.ටී.එල් සමාගමේ 27% ක කොටස් අයිතිය රජයට පැවරීමට එකඟතාවය ඇති බව සඳහන් වූ අතර, ඒ පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීමට කැබිනට් මණ්ඩලයට යොමු කිරීමට අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම.
- මෙම ආයතනයේ අයිතිය පිළිබඳව අදාල සමාගම විසින් සිදු කරන ලද අභියෝගය සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලයේ ස්ථාවරය කුමක්ද යන්න සම්බන්ධයෙන් ලිඛිතව දැනුම් දීම.
- බහුතර අයිතිය 63%ක් තිබියදී විදුලිබල මණ්ඩලයට මෙම ආයතනයේ කටයුතු සම්බන්ධයෙන් මැදිහත්වීමට ඇති නීතිමය බාධාවන් නිරවුල් කර ගැනීමට මේ පිළිබඳව නීතිපතිවරයා වෙත යොමු කිරීම
- ව්‍යවස්ථානුකූලව සහ ස්ථාවර නියෝග අනුව කාරක සභාවට පවරා ඇති බලතල ප්‍රකාරව අනු සමාගමක් වන එල්.ටී.එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම 2016 පෙබරවාරි 09 වන දින කාරක සභාව හමුවට කැඳවීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

- එල්.ටී.එල් සමාගමේ 27% ක කොටස් අයිතිය රජයට පැවරීමට ඇති හැකියාව අධ්‍යක්ෂ මණ්ඩලය සමග සාකච්ඡා කොට යථා කාලයේදී කාරක සභාවට දැනුම් දීමට කටයුතු කරන බව දන්වා එවා ඇත.
- කාරක සභාවේ උපදෙස් පරිදි අනු-සමාගම්වල කටයුතු සඳහා ඇති බාධාවන් නිරාකරණය කර ගැනීමට ගතහැකි පියවර සම්බන්ධයෙන් නීති උපදෙස්

සඳහා නීතිපතිවරයා වෙත යොමු කරන ලද 2016 පෙබරවාරි මස 05 දිනැති ලිපියෙහි පිටපතක් කාරක සභාවට යොමු කර ඇත.

- එල්.ටී.එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම 2016 පෙබරවාරි මස 09 වන දින කාරක සභාව ඉදිරියට කැඳවන ලදී.

5. මෑතකදී අවස්ථා 3 කදී මුළු දිවයිනටම බලපාන අයුරින් විදුලිය බිඳ වැටීම

විමර්ශනය සිදු කළ දිනය - 2016.03.24

මෑත ඉතිහාසයේ අවස්ථා 3 කදී මුළු දිවයිනටම බලපාන විදුලිය බිඳවැටීමට ප්‍රධාන හේතුව ට්‍රාන්ස්ෆෝමර් ප්‍රශස්ථ ආකාරයෙන් නඩත්තු කර නොතිබීම බවත් ආයතනයට අයත් යන්ත්‍ර සූත්‍ර නඩත්තු කටයුතු සැලසුම්කරණයේදී බොහෝ අඩුපාඩු ඇති වී ඇති බවත් ආයතනයේ නිලධාරීන් සමග කරන ලද සාකච්ඡාවේදී නිරීක්ෂණය විය. ට්‍රාන්ස්ෆෝමර් නඩත්තු කරනු ලැබූයේ ඒවා නිෂ්පාදනය කරන ලද ජපන් සමාගමෙහි උපදෙස් මත වන බවත් ඒ සඳහා ලැබුණු උපදෙස් නිවැරදිද හා ප්‍රමාණවත්ද යන්න ප්‍රශ්න සහගත බවත් පැවසීය.

විදුලිය බිඳ වැටීමට නොරෙච්චෝලේ තාප බලාගාරයේ පහත සඳහන් කර ඇති අඩුපාඩුද හේතු වූ බව තවදුරටත් නිරීක්ෂණය කරන ලදී.

- චීන ආධාර යටතේ ඉදි කළ නොරෙච්චෝලේ බලාගාරයට සැපයුම්කරුවෙකු චීනය විසින්ම තෝරාදීම
- එම බලාගාරයේ 1 වන අදියර ඉදිකරනු ලැබූයේ අඩු පරීක්ෂාව යටතේ වීම සහ ශ්‍රී ලංකා රජය මගින් කළ යුතුව තිබූ පරීක්ෂණ කටයුතු පවා සිදු නොකිරීම.
- 2 වන සහ 3 වන අදියර සඳහා අලුත් කණ්ඩායම් පත් කිරීම සහ විදුලි බල මණ්ඩලයට තිබූ අධීක්ෂණ බලය ඉතා අඩු මට්ටමක පැවතීම
- නියමානුකූල බලය පැවරීමකින් තොරව 2 වන අදියර ආරම්භ කිරීම නිසා පැවති අඩුපාඩු නිවැරදිකර ගැනීමට තිබූ අවස්ථාව මග හැරීම.

නිර්දේශ

- දිවයිනෙහි ඇති සියළු ට්‍රාන්ස්ෆෝමර් භාවිතයට ගනු ලැබූ දිනය, නඩත්තු කළ යුතු දින, නඩත්තු කළ දිනය යනාදී විස්තර ඇතුලත් වාර්තාවක් ලබා දෙන ලෙස කාරක සභාව දැනුම් දෙන ලදී.

- ඉදිරියේදී ට්‍රාන්ස්ෆෝමර් ඇතුළු යන්ත්‍ර සූත්‍ර නඩත්තු කළ යුතු ආකාරය පිළිබඳ දින වකවානුද සහිතව විධිමත් සැලසුමක් සකස් කරන ලෙස කාරක සභාව නිර්දේශ කරන ලද අතර එහි පිටපතක් ද සමග ඒ සම්බන්ධ වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී.

<u>වර්තමාන තත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

එම වාර්තාව 2016.05.11 දින තෙක් කාරක සභාවට එවා නොතිබුණි.

ඇමුණුම 01

<u>සේවක සංඛ්‍යා දත්ත</u>

සේවක කාණ්ඩය		ස්ථිර සේවක සංඛ්‍යාව			මිනිස්බල සැපයුම් සමාගම් වලින් යෙදවීම	කොන්තාත් පදනම/ තාවකාලික	2015 ජූනි 30 දිනට මුළු ඇබෑර්තු / (අතිරික්තය)
		අනුමත	සත්‍ය	පුරප්පාඩු/ (අතිරික්තය)			
විධායකයින්	විදුලි ඉංජිනේරු	861	756	105	-	02	103
	කාර්මික ඉංජිනේරු	94	86	8	-	-	8
	සිවිල් ඉංජිනේරු	57	54	3	-	2	1
	ගණකාධිකාරීන්	108	90	18	-	-	18
	විගණකයින්	12	9	3	-	-	3
	මානව සම්පත්	37	24	13	-	-	13
	වෙනත්	53	34	19	-	3	16
	කණිෂ්ඨ විධායක	510	312	198	-	1	197
උප එකතුව		**1,732**	**1,365**	**367**	**-**	**9**	**358**
මධ්‍යම පෙළ කාර්මික කාණ්ඩය		1,644	1480	164	10	17	137
ලිපිකරු සහ ආශ්‍රිත කාණ්ඩ		3,377	2,868	509	951	82	(606)
කාර්යාල සේවක කාණ්ඩ		414	367	47	131	12	(96)
රියදුරන්		1,292	1,264	28	467	12	(451)
පුහුණු කාර්මික සේවය		4,737	4,090	579	697	108	226
අර්ධ පුහුණු කාර්මික සේවය		3,186	1,496	1,599	213	-	1,386
නුපුහුණු ක්ෂේත්‍ර සේවය		1,833	3,189	(2,076)	2,746	64	(734)
අනෙකුත් පුහුණු ශ්‍රේණි		38	4	34	8	-	26
උප එකතුව		**16,521**	**14,758**	**1,763**	**5,223**	**295**	**(3,755)**
මුළු එකතුව		**18,253**	**16,123**	**2,130**	**5,223**	**304**	**(3,397)**

ඇමුණුම 02

එකම පුද්ගලයන් විදුලි බල මණ්ඩලය යටතේ පවතින උප පාලිත සමාගම් කීපයක අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් වී ඇති ආකාරය දක්වන සටහන

Directors Names	LTL ESOT Ltd	Ante LeCo Metering Company PVT Ltd.	LECO Project Pvt LTD	Lanka Electricity Company Pvt/ Ltd	LTL Holdings Pvt	LTL Transformers Pvt. Ltd	Ltl Galvernizers Pvt. Ltd	Lanka Industrial Products	Lakdhanvi Ltd	Infra engineering Pvt Ltd	Raj Lanka Power Company Ltd	Lakdhanavi Bangla Power Ltd	Helandhanavi Ltd	Bright Intl Pvt. Ltd	LTL Energy Pvt. Ltd	Navidhu Pvt Ltd	Navidhu Assupniella Pvt . ltd	Pawan Danavi Pvt ltd	Paan Danavi Pvt ltd	Lanka Coal Company pvt ltd	Lanka Coal Company	Sri Lanka energis	Lanka Energies Pvt. Ltd	Kambulgamuwa Mini Hydro Pvt	TPCL Board	Total no of companies
Kandana Arachchige Bandula Chandrasekar		1		1																						2
Maddumage Chandrasiri Wickramasekar		1		1																					1	3
H. S Somathilake		1																								1
Li Jlanwu		1																								1
Shen Dingquing		1																								1
W D A S Wijepala					1															1	1	1	1	1	1	8
Benedic K Ullwishewa				1																						1
J S A Wickramasinghe				1																						1
M C Wickramasinghe					1																					1
U D Jayawardena					1	1	1	1	1	1			1	1	1	1	1	1	1							13
M J M N Marikkar					1	1	1	1	1	1	1	1	1	1	1	1	1	1	1							15
Ravindra Pitigalage					1	1	1																			3
Dehiwalage Sriyani Anestine Maristella Perera					1	1	1																			3
Nirmala Prera					1																					1
Bamunuwita Gamage Lalith Deepthi Kumara					1	1	1																			3
Wijekoon Bandara Ganegala						1	1																			2

Directors Names	LTL ESOT Ltd	Ante LeCo Metering Company PVT Ltd.	LECO Project Pvt LTD	Lanka Electricity Company Pvt/ Ltd	LTL Holdings Pvt	LTL Transformers Pvt. Ltd	LtL Galvernizers Pvt. Ltd	Lanka Industrial Products	Lakdhanvi Ltd	Infra engineering Pvt Ltd	Raj Lanka Power Company Ltd	Lakdhanavi Bangla Power Ltd	Helandhanavi Ltd	Bright Intl Pvt. Ltd	LTL Energy Pvt. Ltd	Navidhu Pvt Ltd	Navidhu Assupniella Pvt . ltd	Pawan Danavi Pvt ltd	Paan Danavi Pvt ltd	Lanka Coal Company pvt ltd	Lanka Coal Company	Sri Lanka energis	Lanka Energies Pvt. Ltd	Kambulgamuwa Mini Hydro Pvt	TPCL Board	Total no of companies
W J Lasantha Shavindranath Fernando						1	1																			2
Jamburathugoda Gamaarachchige Samith Shantha Liyanage						1	1																			2
R K Pitigalage									1	1	1	1	1	1	1	1	1	1	1							11
U G Sarath									1	1	1	1														4
R D Abeywardena									1	1																2
Abdul Wadud											1															1
Monowara Begum											1															1
Daya sumith Arangala											1	1				1	1	1	1							6
Kanthimany Maheshwaran											1	1														2
D A J Nanayakkara											1	1	1													3
Sudath Annasiwatta											1	1														2
M A Wijethunga												1														1
Sudath Annasiwatta												1	1													2
B Reiner														1												1
K Maheshwaran																		1	1							2

Directors Names	LTL ESOT Ltd	Ante LeCo Metering Company PVT Ltd.	LECO Project Pvt LTD	Lanka Electricity Company Pvt/ Ltd	LTL Holdings Pvt	LTL Transformers Pvt. Ltd	LtL Galvernizers Pvt. Ltd	Lanka Industrial Products	Lakdhanvi Ltd	Infra engineering Pvt Ltd	Raj Lanka Power Company Ltd	Lakdhanavi Bangla Power Ltd	Helandhanavi Ltd	Bright Intl Pvt. Ltd	LTL Energy Pvt. Ltd	Navidhu Pvt Ltd	Navidhu Assupniella Pvt . ltd	Pawan Danavi Pvt ltd	Paan Danavi Pvt ltd	Lanka Coal Company pvt ltd	Lanka Coal Company	Sri Lanka energis	Lanka Energies Pvt. Ltd	Kambulgamuwa Mini Hydro Pvt	TPCL Board	Total no of companies
Udesh Prasad Pani																									1	1
Athul Sri Wasthawa																									1	1

ඇමුණුම 03

Subsidiary and Sub-subsidiary Structure of the Ceylon Electricity Board



එල්.ටී.එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම

විමර්ශනය සිදු කළ දිනය - 2016 .02. 09

එල්.ටී.එල් හෝල්ඩින්ස් පුද්ගලික සමාගම යනු ලංකා විදුලිබල මණ්ඩලයෙහි උප සමාගමක් වන අතර විදුලිබල මණ්ඩලයේ විදුලිය බෙදාහැරීමේ පද්ධතිය සඳහා ට්‍රාන්ස්ෆෝමර් නිෂ්පාදනය අරමුණු කරගනිමින් 1982 වසරේදී පිහිටුවා ගන්නා ලද සමාගමකි. ලංකා විදුලිබල මණ්ඩලය මෙම සමාගමෙහි 63% ක කොටස් භාරකාරීත්වයක් දරනු ලබයි. ඊට අමතරව එල්.ටී.එල් සමාගමේ 27% ක කොටස් හිමිකාරීත්වයක් එල්.ටී.එල්. ඊ සොට් ලිමිටඩ් ආයතනය විසින්ද සේවා දායකයින් නියෝජනය කරන භාරය මගින් 10% ක කොටස් හිමිකාරීත්වයක්ද දරයි.

එල්.ටී. එල් සමාගම යටතේ පවතින උප සමාගම් 15 ක් කාරක සභාව විසින් නිරීක්ෂණය කරන ලද අතර ඒවායේ මව් සමාගමට අයත් කොටස් දායකත්වය ඇතුලත් ආයතන ව්‍යුහයෙහි සැකිල්ල කාරක සභාවට එවා ඇත. (ඇමුණුම 04)

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1.එල්.ටී.එල් සමාගම හා එම සමාගම යටතේ ක්‍රියාත්මක වන උප සමාගම් ඒවායේ ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වගකීමට ඇති බලවත් නොකැමැත්ත

විදුලිබල මණ්ඩලය මෙම සමාගමෙහි 63% ක කොටස් භාරකාරීත්වයක් දැරුවද මෙම සමාගමෙහි ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලයට පවතින්නේ සීමාසහිත වූ මැදිහත්වීමේ බලයකි. 2014 ජුනි මස 03 වන දින පැවති කාරක සභාවේදි මෙම සමාගම සම්බන්ධයෙන්ද මෙම සමාගමෙහි පරිපාලිත හා උප-පරිපාලිත සමාගම් පිළිබඳව තොරතුරු ඉදිරිපත් කරන ලෙස දැනුම් දුන්නද තමන් ඇතුළු සමාගම් ස්වාධීනව කටයුතු කරන සමාගම් වන බවත් තම පුද්ගලික නීති උපදේශකයන්ගේ අදහස අනුව තමන් පාර්ලිමේන්තුවට තොරතුරු ඉදිරිපත් කිරීම අනවශ්‍ය බව සඳහන් කරමින් එකී තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණි. තමන් ඇතුළු සමාගම් පාර්ලිමේන්තුවට වගකීමට අවශ්‍ය නොවන බව ද දැනුම් දී තිබුණි. කෙසේ වුවද රජයට අයත් මුදල් පරිහරණය කරන සමාගම්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් අධීක්ෂණය කිරීමේ බලය අත්‍යවශ්‍යයෙන්ම කාරක සභාවට පැවතිය යුතු බව කාරක සභාවේ මතය විය.

2014.06.03 විදුලි බල මණ්ඩලය යටතේ ඇති උප සමාගම් පිහිටුවීම සඳහා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම පිළිබඳව කාරක සභාවේ සාකච්ඡාවට භාජනය වූ අතර කාරක සභාවේ මතය වූයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ

148 වගන්තිය අනුව රාජ්‍ය මූල්‍ය පිළිබඳ පාලනය පාර්ලිමේන්තුව සතුවන බැවින් විගණකාධිපති විසින් ගිණුම් විගණනය කළත් නැතත් පොදු ව්‍යාපාර යටතට ගැනෙන සෑම ආයතනයක්ම පොදු ව්‍යාපාර කාරක සභාව හමුවට පැමිණීම අත්‍යාවශ්‍ය වන බව කාරක සභාව විසින් අවධාරණය කළාය.

LTL සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් පිළිබඳව විදුලිබල මණ්ඩලය දැනුවත් නොවීම හා විශේෂ කරුණු ගැන පමණක් විදුලි බල මණ්ඩලය හා මහා භාණ්ඩාගාරය දැනුවත් කිරීම කරනු ලැබීම පිළිබඳව කාරක සභාව අවධානය යොමු කළාය.

<u>නිර්දේශ</u>

- විගණකාධිපති සමග සාකච්ඡා කර මෙම සමාගම්වල ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවට වග කියන ක්‍රමවේදයක් සකස් කිරීම.
- එම සමාගම් පිහිටුවීම සඳහා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය අනිවාර්යයෙන්ම ලබා ගැනීම
- LTL සමාගම යටතේ ඇති ආයතනවලට විදුලිබල මණ්ඩලයේ නියෝජිතයකු මින් ඉදිරියට පත් කිරීමට කටයුතු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

සාංගමික ව්‍යවස්ථාවලිය අනුව ආයතනයේ කටයුතු සඳහා මහා භාණ්ඩාගාරයේ හෝ ලංකා විදුලි බල මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීම අවශ්‍ය නොවන බව දන්වා ඇත. එලෙස අනුමැතිය ලබා ගැනීම අනිවාර්යයෙන් සිදු විය යුතු නම් ඒ සඳහා සාංගමික ව්‍යවස්ථාවලිය වෙනස් කළ යුතු බව දන්වා ඇත.

ආයතනයේ වත්කම් රාජ්‍ය අරමුදල් වලට අයත් නොවන නිසා ආයතනයේ කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට වගකීමට අවශ්‍ය නොවන බව දන්වා ඇත.

2. <u>ලැබෙන ලාභාංශ වලින් වැඩි ප්‍රමාණයක් උප සමාගම් වල රඳවා ගැනීම හා ලංකා විදුලි බල මණ්ඩලයට නිෂ්පාදන මිල තීරණය කිරීමට ඇති හැකියාව සීමිත වීම</u>

එල්.ටී.එල් හෝල්ඩින්ස් සමාගම හා එහි උප සමාගම් ලාභාංශ වැඩි ප්‍රමාණයක් බුක්ති විඳීමට කටයුතු කිරීම නිසා විදුලිබල මණ්ඩලයට ලැබෙන ලාභාංශයන්හි පහළ යාමක් විය හැකි බව කාරක සභාවේ අදහස විය. විදුලි බල මණ්ඩලයට එහි උප සමාගම්වල කටයුතු සඳහා මැදිහත් වීමේ බලය සීමා සහිත වීම නිසා ලාභාංශ ගලා යාම කොටස් භාරකාරත්වයට සමානුපාතික ලෙස සිදුවන්නේද යන්න කාරක සභාවේ අවධානයට ලක්විය.

<u>නිර්දේශ</u>

ඒ අනුව එල්.ටී.එල් සමාගම එහි උප සමාගම් සඳහා ගෙවා ඇති ලාභාංශ පිළබඳ වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දැනුම් දෙන ලදී.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.03.08 දින ගෙවන ලද ලාභාංශ පිළිබඳ වාර්තාවක් කාරක සභාවට එවා තිබුණි. (ඇමුණුම - 05)

මෙම වාර්තාව පදනම් කරගෙන ලංකා විදුලි බල මණ්ඩලයේ කොටස් හිමිකාරීත්වයට සමානුපාතිකව ලාභාංශ ලැබී ඇත්ද යන්න විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් පරීක්ෂා කරන ලද අතර එම ගණනය කිරීම් අනුව රු.මිලියන 7,184 ක ලාභාංශයක් ලැබිය යුතුය. (ඇමුණුම 6) එසේ වුවද ලංකා විදුලි බල මණ්ඩලයේ ගිණුම් අනුව රු.මිලියන 6,952 ක් පමණ ලැබී තිබුණි.

3. <u>විදුලි බල මණ්ඩල යටතේ ඇති උප පාලිත සමාගම් පිහිටුවා ඇති පදනම</u>

LTL සමාගම යටතේ ඇති උප පාලිත සමාගම් පිහිටුවා ඇති පදනම පිළිබඳව කාරක සභාවේ දැඩි නොසතුට පළ වූ අතර ඒ සම්බන්ධයෙන් විදුලිබල මණ්ඩලයට ඇති බලතල කවරේද යන්න පිළිබඳ කාරක සභාවේ දැඩි අවධානයට යොමු විය. කාරක සභාවේ මතය වූයේ එම සමාගම් පිහිටුවීම සඳහා විදුලිබල මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීම අනිවාර්යෙන් සිදුවිය යුතු බවයි.

<u>නිර්දේශ</u> -

උප සමාගම් පිහිටුවීම සඳහා ඇති කර ගත් ගිවිසුම්වල පිටපත් කාරක සභාවට ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.03. 08 දින උප - සමාගම් 15න් 14 ක් සමග ඇති ගිවිසුම් වල පිටපත් කාරක සභාවට එවා තිබුණි. මෙම ගිවිසුම් පිටපත් අධ්‍යයනය කර ඒ පිළිබඳ නිරීක්ෂණ විගණකාධිපතිවරයා විසින් කාරක සභාවට ඉදිරිපත් කරනු ඇත.

4. එල්.ටී.එල් සමාගම යටතේ ඇති උප පාලිත සමාගම්වල ගිණුම් වාර්තා

LTL සමාගමේ සහ එහි අනු - සමාගම්වල මූල්‍ය කටයුතු විනිවිදභාවය සම්බන්ධයෙන් කාරක සභාවේ විශේෂ අවධානය යොමු විය.

නිර්දේශ

විගණකාධිපති සහ ආයතනයේ පුද්ගලික විගණනය කරනු ලබන සමාගම සම්බන්ධ වී විධිමත් විගණන ක්‍රමවේදයක් සකස් කිරීම

වර්තමාන තත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.03.16 දින එල්.ටී.එල්. සමාගම හා එහි උප- සමාගම් 15 න් 14 ක ගිණුම් වාර්තා කාරක සභාවට එවා ඇත.

ඇමුණුම **04**

Subsidiary and Sub-subsidiary Structure of the LTL Holdings (Pvt) Ltd



ඇමුණුම 05

DIVIDENDS PAID TO SHARE HOLDERS BY SUBSIDIERIES OF LTL HOLDINGS (PVT) LTD.

1	**LTL Transformers (Pvt) Ltd**									
	Financial Year	**2010/11**	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**			
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	38,000,000	50,000,000	50,000,000	750,000,000	15,000,000	110,000,000			
	Gross Dividend	38,000,000	50,000,000	50,000,000	750,000,000	15,000,000	110,000,000			
2	**LTL Galvernizers (Pvt) Ltd**									
	Financial Year	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**				
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	25,000,000	30,000,000	100,000,000	15,000,000	200,000,000				
	Gross Dividend	25,000,000	30,000,000	100,000,000	15,000,000	200,000,000				
3	**Lanka Industrial Products Engineering (Pvt) Ltd**									
	Financial Year	**2007/08**	**2008/09**	**2009/10**	**2010/11**	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	4,100,000	3,500,000	24,000,000	15,000,000	6,500,000	9,000,000	250,000,000	3,200,000	155,000,000
	Dividend	4,100,000	3,500,000	24,000,000	15,000,000	6,500,000	9,000,000	250,000,000	3,200,000	155,000,000

DIVIDENDS PAID TO SHARE HOLDERS BY SUBSIDIERIES OF LTL HOLDINGS (PVT) LTD.										
4	**Lakdhanavi Limited**									
	Financial Year	**1998/99**	**1999/00**	**2004/05**	**2007/8**	**2008/9**	**2009/10**	**2010/11**	**2011/12**	**2012/13**
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	25,000,000	30,000,000	428,921,372	142,973,791	81,699,309	653,594,472	245,097,927	326,797,236	1,633,986,181
	-L T L Group Employee Share Ownership Trust	-	-	96,078,628	32,026,209	18,300,691	146,405,528	54,902,073	73,202,764	366,013,819
	Gross Dividend	25,000,000	30,000,000	525,000,000	175,000,000	100,000,000	800,000,000	300,000,000	400,000,000	2,000,000,000
	Lakdhanavi Limited Contd.									
	Financial Year	**2013/14**	**2014/15**	**2015/16**						
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	2,369,279,962	408,496,545	2,467,319,133						
	-L T L Group Employee Share Ownership Trust	530,720,038	91,503,455	552,680,867						
	Gross Dividend	2,900,000,000	500,000,000	3,020,000,000						
		No Dividends In		**2000/01**	**2001/02**	**2002/03**	**2003/04**	**2005/6**	**2006/7**	

DIVIDENDS PAID TO SHARE HOLDERS BY SUBSIDIERIES OF LTL HOLDINGS (PVT) LTD.

5	**Heladhanavi Limited**									
	Financial Year	**2006/07**	**2007/08**	**2008/09**	**2009/10**	**2010/11**	**2011/12**	**2013/14**	**2015/16**	
	Dividend to Share Holders									
	-Lakdhanavi Ltd	57,500,000	95,833,333	97,411,765	143,745,982	551,137,529	90,562,504	101,470,588	150,000,000	
	-Hemas Power PLC	60,000,000	100,000,007	101,647,061	149,995,810	575,100,038	94,500,006	105,882,354	-	
	-Power Plant Services (Pvt) Ltd	2,500,000	4,166,666	4,235,294	6,249,825	23,962,500	3,937,500	4,411,764	-	
	-Heladhanavi Project Implementation Trust	-	-	11,435,294	16,874,527	64,698,750	10,631,250	11,911,764	-	
	-Mr.Krishantha Nananyakkara	-	-	1,270,588	1,874,947	7,188,750	1,181,250	1,323,529	-	
	Gross Dividend	120,000,000	200,000,000	216,000,002	318,741,092	1,222,087,567	200,812,510	225,000,000	150,000,000	
		No Dividends In		**2012/13**	**2014/15**					
6	**Infra & Engineering (Pvt) Ltd**									
	Financial Year	**2014/15**	**2015/16**							
	Dividend to Share Holders									
	-Lakdhanavi Ltd	-	130,000,000							
	Gross Dividend	-	130,000,000							

DIVIDENDS PAID TO SHARE HOLDERS BY SUBSIDIERIES OF LTL HOLDINGS (PVT) LTD.										
7	**Bright International Power Pte Ltd**									
	Financial Year	**2010/11**	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**			
	Dividend to Share Holders									
	-Lakdhanavi Limited	127,296,932	-	-	-	125,317,364	31,189,305			
	Gross Dividend	127,296,932	-	-	-	125,317,364	31,189,305			
8	**Nividhu (Pvt) Ltd**									
	Financial Year	**2003/04**	**2004/05**	**2005/6**	**2006/7**	**2007/8**	**2008/9**	**2009/10**	**2010/11**	
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd / Lanka Transformers	1,620,000	2,604,706	3,472,941	3,472,941	13,891,765	17,280,000	48,960,000	140,028,014	
	-LVL Energy Fund (Pvt) Ltd / Lanka Ventures Ltd	540,000	868,235	1,157,648	1,157,648	4,630,588	5,760,000	16,320,000	46,676,005	
	-L TL Group Employee Share Ownership Trust	360,000	190,588	254,118	254,118	1,016,471	1,440,000	4,080,000	25,677,340	
	-Statkraft Holdings Singapore Pte Ltd & Pre. SH's	1,080,000	1,736,471	2,315,293	2,315,293	9,261,176	11,520,000	32,640,000	93,352,009	

	DIVIDENDS PAID TO SHARE HOLDERS BY SUBSIDIERIES OF LTL HOLDINGS (PVT) LTD.									
	Gross Dividend	3,600,000	5,400,000	7,200,000	7,200,000	28,800,000	36,000,000	102,000,000	305,733,368	
	Nividhu (Pvt) Ltd Continued									
	Financial Year	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**				
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd / Lanka Transformers	85,116,012	72,225,605	89,544,008	106,272,001	71,832,000				
	-LVL Energy Fund (Pvt) Ltd / Lanka Ventures Ltd	28,372,004	24,075,202	29,848,003	35,424,000	23,944,000				
	-L TL Group Employee Share Ownership Trust	18,914,672	16,050,137	19,898,671	23,616,004	15,962,669				
	-Statkraft Holdings Singapore Pte Ltd & Pre. SH's	56,744,008	48,150,403	59,696,005	70,848,001	47,888,000				
	Gross Dividend	189,146,696	160,501,347	198,986,688	236,160,006	159,626,669				
9	**Nividhu Assupiniella (Pvt) Ltd**									

DIVIDENDS PAID TO SHARE HOLDERS BY SUBSIDIERIES OF LTL HOLDINGS (PVT) LTD.

	Financial Year	**2008/9**	**2009/10**	**2010/11**	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**	
	Dividend to Share Holders									
	-Nividhu (Pvt) Ltd	1,000,000	59,400,000	171,600,021	161,251,878	135,666,688	134,200,021	151,066,690	102,666,683	
	Gross Dividend	1,000,000	59,400,000	171,600,021	161,251,878	135,666,688	134,200,021	151,066,690	102,666,683	
10	**Pawan Danavi (Pvt) Ltd**									
	Financial Year	**2013/14**	**2014/15**	**2015/16**						
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	135,150,075	110,823,062	183,804,102						
	-LVL Energy Funds (Pvt) Ltd	106,000,000	86,920,000	144,160,000						
	-NDB Capital Holdings PLC	23,850,000	19,557,000	32,436,000						
	Gross Dividend	265,000,075	217,300,062	360,400,102						
11	**LTL Energy (Pvt) Ltd**									
	Financial Year	**2010/11**	**2011/12**	**2012/13**	**2013/14**	**2014/15**	**2015/16**	**Total**		
	Dividend to Share Holders									
	-LTL Holdings (Pvt) Ltd	600,000	700,000	100,000	50,000	25,000	50,000	1,525,000		
	Gross Dividend	600,000	700,000	100,000	50,000	25,000	50,000	1,525,000		

ඇමුණුම 06

Dividends Paid to Share HoldersBy Subsidiaries of LTL Holding.

Name of the Subsidiary and Subsubsidiary of the CEB	Total Dividend Paid	Efective Holding % to CEB	Dividend Receivable to the CEB
LTL Holding (PVT) Ltd		63%	
LTL Energies (Pvt) Ltd	1,525,000	63%	960,750
Lakdhanavi Limited	8,813,165,928	52%	4,552,881,518
Infra Engineering (Pvt) Ltd	130,000,000	52%	67,158,000
Lakdanavi Bangal Power Ltd	-	26%	-
Raj Lanka (Pvt) Ltd	-	41%	-
Heladhanavi Limited	1,287,661,701	52%	665,206,035
Bright International Power (Pvt) Ltd	283,803,601	52%	146,612,940
West Coast (Pvt) Ltd		2%	-
Nivindu (Pvt) Ltd	656,319,993	28%	186,066,718
Nividu Assipinella (Pvt) Ltd	916,851,981	28%	259,927,537
LTL Transformers (PVT) Ltd	1,013,000,000	63%	638,190,000
LTL Galvernizers (PVT) ltd	370,000,000	63%	233,100,000
Lanka Industrial Products Engineering (Pvt) Ltd	470,300,000	63%	296,289,000
Pawan Dhanavi (Pvt) Ltd	429,777,239	32%	138,087,427
Afro Asian Power Gahana	-	63%	-
Total	14,372,405,443		7,184,479,925

සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම

විමර්ශනය සිදු කළ දිනයන් - 2016 .02. 09 දින හා 2016 .03-.08 දින

සංස්ථාපනය කිරීම -

රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යවරයා විසින් 2006 දෙසැම්බර් 06 දින ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශයට ලැබුණු අංක06/2330/206/082 දරන අමාත්‍ය මණ්ඩල අනුමැතිය අනුව 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ 2006 ඔක්තෝබර් 23 දින සංස්ථාපනය කරන ලද සමාගමකි. පූර්ණ රාජ්‍ය සමාගමක් ලෙස ක්‍රියාත්මක වේ.

<u>හඳුනාගත් ප්‍රධාන ගැටලු</u>

1 <u>ආයතනයේ අවිධිමත් කාර්ය සාධනය</u>

2003 වසරේ සිට ආයතනයේ අයවැය සඳහා අදාල අංශ වල අනුමැතිය ලබාගෙන නොතිබුණි. ආයතනයේ සංවිධාන සැලැස්ම හා අනුමත කාර්ය මණ්ඩලය සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගෙන නොතිබුණු අතර බඳවා ගැනීම් සහ උසස්වීම් සඳහා පටිපාටියක් සකස් වී නොතිබුණි. රුපියල් මිලියන 155ට අධික ස්ථාවර වත්කම් හා ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සඳහා ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. ආයතනයේ අවිධිමත් කාර්ය සාධනය සම්බන්ධයෙන් කාරක සභාව විසින් තවදුරටත් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරන ලදී.

- රුපියල් මිලියන 1400ට අධික ආයෝජන සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ලබා නොතිබීම.
- වත්කම් පිහිටි ස්ථාන,වත්කම් පිළිබඳ විස්තර,ක්ෂය වීම් පිළිබඳ විස්තර, නොමැති වීම.
- ආයතනය පොදු ව්‍යාපාරයක් ලෙස කර නොමැති වීම.
- කාලීනව වාර්තා ඇගයීමක් කර නොතිබීම.

<u>නිර්දේශ</u>

- ඉහත කී කාරණා ඉටු නොකිරීම සම්බන්ධයෙන් කාරක සභාවට වාර්තා ඉදිරිපත් කිරීම.
- රු මිලියක 1400 ක ආයෝජන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගැනීමට පාදක වූ කරුණු පිළිබඳ වාර්තාවක් ලබා ගැනීම.

වර්තමාන තත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016..03.04 දින වාර්තා එවා තිබුණි. එම වාර්තාවලට අනුව, කාරක සභාවේ උපදෙස් මත ස්ථාවර ආයෝජන සඳහා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලා 2016 පෙබරවාරි මස 23 දින භාණ්ඩාගාරයට ලිපියක් යොමු කොට එහි පිටපත් එවා ඇත.

වත්කම් ක්ෂය වීම් පිළිබඳ විස්තර දැනට සකස් කරමින් පවතින බව දන්වා ඇත.

2 බාහිර පාර්ශවයන් සමග ඇති කරගත් ගිවිසුම්වල නීත්‍යානුකූලභාවය

(ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගම සමග ඇති මෙහෙයුම් ව්‍යාපෘති 06)

රක්නා ආරක්ෂක ලංකා සමාගම ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගම සමග ක්‍රියාත්මක කරනු ලබන මෙහෙයුම් ව්‍යාපෘති 06 සඳහා ඇති කරගන්නා ලද ගිවිසුම් කාරක සභාවේ නිරීක්ෂණයට ලක් වූ අතර ඒ සඳහා මහා භාණ්ඩාගාරයේද ආරක්ෂක අමාත්‍යංශයේද අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිය ලබා නොමැති බව නිරීක්ෂණය විය.

ඉහත කී ගිවිසුම් 06 ම ඒකාබද්ධ කර 2014.01.27 දින ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගම සමග ගිවිසුමක් අත්සන් කර ඇති අතර එම ගිවිසුමෙහි නීත්‍යානුකූලභාවය පිළිබඳ කාරක සභාවේ අවධානය යොමු විය. එම ගිවිසුම නීතීඥවරයෙකු විසින් සහතික කර හෝ ලියාපදිංචි කර නොමැති බවද අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා නොමැති බවද නිරීක්ෂණය විය. වාර්ෂික වාර්තා, මහා සභා රැස්වීම් වාර්තා, අධ්‍යක්ෂකවරුන්ගේ වෙනස්ම්, අස්වීම් ලිපි, පත් කිරීම් ලිපි නොමැති අතර මේ සඳහා මුද්දර ගාස්තුද ගෙවා නැත. මෙම ගිවිසුම නීති විරෝධී පිළිගත නොහැකි ගිවිසුමක් වන බව කාරක සභාව ඒකමතිකව තීරණය කරන ලදී. මෙම ගිවිසුම් ආරක්ෂක අමාත්‍යංශයේ හෝ මහා භාණ්ඩාගාරයේ ඇනුමැතිය ලැබී නොමැත.

සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම හා ඇවන්ට්ගාඩ් මැරිටයිම් ආයතනය අතර තවත් ගිවිසුමකට 2015.10.20 වන දින එළඹ ඇති අතර ගිවිසුමද අධ්‍යක්ෂ මණ්ඩලයේ ඒකමතික තීරණයක් ලෙස සටහන් වූවද, එහිදී අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය කල ආරක්ෂක අමාත්‍යාංශයේ නියෝජිතවරිය වන වසන්තා පෙරේරා මහත්මිය හා භාණ්ඩාගාරයේ නියෝජිත ලෙස කටයුතු කළ පී . රොද්‍රිගු මහතා එකඟතාවය පල කර නැති අතර සරත් ජයතිලක මහතාද විරෝධය පල කර ඇත. එම විරෝධතාවයන් නිසි පරිදි අධ්‍යක්ෂ මණ්ඩල වාර්තා වල සටහන් වී නැති බව අනාවරණය විය.

100% රජයේ අයිතිය සහිත සීමාසහිත රක්නා ආරක්ෂක ලංකා සමාගම සමඟ එකඟතා ගිවිසුම් 8කට එළඹ ඇති අතර එයින් ගිවිසුම් 6 ක් පසුගිය කාලය තුළදී

ඇති කර ගත් ගිවිසුම් වන අතර, එම ගිවිසුම් සහ අවසානයේ එම ගිවිසුම් 6ම ඒකාබද්ධ කරමින් 2014.01.27 ඇති කර ගත්තා වූ ගිවිසුම සම්පූර්ණ නීති විරෝධී සහ පිළිගත නොහැකි ගිවිසුමක් වන අතර එය නිශ්චිත නීතිඥයන් විසින්ද සනාත කර නැති අතර, ලියාපදිංචි කර නැති බවද පෙනී යයි. මෙම සියළු ගිවිසුම් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය හෝ භාණ්ඩාගාරයේ හෝ ආරක්ෂක අමාත්‍යාංශය හෝ අනුමැතියක් ලබා ගෙන නැති අතර අනුමැතියකට ඉදිරිපත් කර නොමැති බවද නිරීක්ෂණය විය.

නිර්දේශ

- මෙම ගිවිසුම්වල පිටපත් නීත්‍යානුකූලභාවය පිළිබඳ නීතිපති අදහස සඳහා යොමු කිරීම
- මෙම සියළුම ගිවිසුම් පිළිබඳව නීතිපතිතුමාගේ පරීක්ෂණයක් පවත්වා, එම ගිවිසුම් වල නිත්‍යානුකූලභාවයත් එම ගිවිසුම් එළඹී පදනමත් , එම ගිවිසුම් වලට එළඹීමේ තීරණයට සහභාගී වූ අධ්‍යක්ෂ මණ්ඩල පිළිබඳවත් වාර්තාවක් ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් මඟින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016/01/13 හා 2016/02/12 දිනැති ලිපි මගින් ගිවිසුම්වල පිටපත් නීතිපති අදහස සඳහා යොමු කර ඇති බව දන්වා ඇත. ඒ සඳහා පිළිතුරු ලැබුණු පසු ඉදිරි කටයුතු සිදු කරන බව දන්වා ඇත.

3 සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමට ඇවන්ට් ගාර්ඩ් සමාගමෙන් අයවිය යුතු රු . මිලියන 255ක් කපා හැරීමට තීරණය කිරීම හා 2014 වන විට රක්නා ආරක්ෂක ලංකා සමාගමට ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගමින් ලැබිය යුතු මුදල් රු. මිලියන 843 ක් අය කර ගැනීමට ගත් ක්‍රියා මාර්ග

2015 ක් වූ ඔක්තෝබර් මස 20 දින අත්සන් කරන ලද ගිවිසුම මත දෙපාර්ශවයේම එකඟත්වය මත රු. මිලියන 255ක් කපා හැරීමට තීරණය කරන ලද බව දන්වා ඇත. (එම ගිවිසුමෙහි පිටපතක් එවා ඇත)
රු. මිලියන 843 ක් අයකර ගැනීමට ලබා දුන් පිළිතුර පිළිබඳව කාරක සභාව සෑහීමට පත් වුයේ නැත.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගම මගින් ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගමට හිඟ මුදල් ලබාදෙන ලෙස විටින් විට සිහිකැඳවීම් යවා ඇති බව දන්වා ඇතත් එකී මුදල් නිසි පරිදි ගෙවා නොමැති බව දන්වා ඇත. ඒ අනුව එම මුදල් නැවත නොගෙවීම සම්බන්ධයෙන් ගත හැකි නීතිමය පියවර සම්බන්ධයෙන්

නීතිපතිතුමාගෙන් අදහස් විමසිය යුතු බව අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කර ඇති බවද දන්වා ඇත. මේ සම්බන්ධව නීතිපතිතුමාට හා ඇවන්ට්ගාර්ඩ් මැරිටයිම් සමාගමට යවන ලද ලිපි සහ ඊට ලද පිළිතුරු ලිපිවල පිටපත් ද අදාල ගිවිසුම්වල පිටපත්ද කාරක සභාවට එවා ඇත.

4 <u>අවාසිදායක කොන්දේසි මත ලාභාංශ තීරණය කිරීම</u>

ඉහත සඳහන් ගිවිසුම් අනුව ලාභාංශ බෙදී යාමේදී සී/ස රක්නා ලංකා ආරක්ෂක සමාගමට 2012 ලභාංශ බෙදී යාමේ ප්‍රතිශතය සම්පූර්ණ ආදායමින් 12% ක්ද 2013 දී එම අගය 9%ක්ද 2014 දී එම ප්‍රමාණය 7.5% ක්ද වී ඇත. ඒ අනුව ඇවන්ට් ගාර්ඩ් සමාගමට සම්පූර්ණ ආදායමින් 75% කට වැඩි ලාභාංශ ප්‍රමාණයක්ද බෙදී යන බව හෙළිදරව් විය.

<u>ප්‍රගතිය හා වර්තමාන තත්වය වාර්තා කිරීම</u>

මෙලෙස ලාභාංශ බෙදී යාමේ ප්‍රතිශතය තීරණය කිරීම රක්නා ආරක්ෂක ලංකා සමාගම හා ඇවන්ට් ගාර්ඩ් මැරිටයිම් සමාගම අතර 2012 මාර්තු 21 වන දින අංක 323 දරන ගිවිසුම අනුව සිදු වී ඇති බව දන්වා ඇත.

<u>5. සී/ස රක්නා ආරක්ෂක ලංකා සමාගමෙහි හිටපු සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී කාරක සභාව ඉදිරියට කැඳවීම</u>

මෙම ගිවිසුම් පිළිබඳ කරුණු විමසීම සඳහා රක්නා ආරක්ෂක ලංකා සමාගමේ හිටපු සභාපති මේජර් ජෙනරාල් ඩබ්.පී.පී. ප්‍රනාන්දු මහතා සහ ප්‍රධාන විධායක නිලධාරි මේජර් ජෙනරාල් කේ.බී. එගොඩවෙල යන මහත්වරුන් 2016.03.08 දින පැවති කාරක සභාව ඉදිරියට කැඳවන ලදී.

මෙම ගිවිසුම පිළිබඳව රක්නා ආරක්ෂක ලංකා සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කරුණු ඉදිරිපත් කළ බවද ආරක්ෂක අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා නොගත් බවද දන්වන ලදි. එවැනි දැනුම් දීමක් අවශ්‍ය නොවන බව නීති උපදේශක මෙන්ම අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් ඉලේසා චන්ද්‍රසේන මහත්මිය දැන්වූ බවත් භාණ්ඩාගාරයේ නියෝජිතයකුගේ සහභාගීත්වය පැවති නිසා නැවත දැනුම් දීමක් අවශ්‍ය නොවන බවත් දන්වන ලදි.

මෙම ගිවිසුම සම්බන්ධයෙන් ශක්‍යතා වාර්තාවක් ලබා ගෙන නොමැති බවත් පාවෙන අවි ගබඩාව සම්බන්ධ යෝජනාව ලැබී ඒ පිළිබඳවද අධ්‍යයනයක් කර ආරක්ෂක අමාත්‍යාංශයට දන්වන ලද බවත් අනාවරණය විය.

රක්නා ආරක්ෂක ලංකා සමාගමේ හිටපු සභාපති සහ හිටපු ප්‍රධාන විධායක යන මහත්වරුන් කැඳවා පැවති රැස්වීමේ දී ඔවුන් විසින් එළැඹි ගිවිසුම් සහ එකඟතාවන් සඳහා ආරක්ෂක අමාත්‍යාංශයේ, මුදල් අමාත්‍යාංශයේ හෝ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබා ගත යුතුව පැවති බව නොදැන සිට ඇති අතර ඒ

පිළිබදව නීති උපදෙස් ලැබී තිබුනේ එවැනි අවශ්‍යතාවක් නොමැති බවට සහ අනවශ්‍ය බවටයි.

නිර්දේශ

භාණ්ඩාගාර නියෝජිතයින් සහ නීති නිලධාරිනිය ගිවිසුම් අත්සන් කිරීම පිළිබඳව ලබා දුන් නිර්දේශ සහ උපදෙස් ඔවුන්ගේ එකඟතාවයන් සිදු වූ ආකාරය පිළිබඳව පැහැදිලි කර ගැනීමට අවශ්‍ය බැවින් එවකට රක්නා ආරක්ෂක ලංකා සමාගමේ සිටි නීති නිලධාරිවරියත් භාණ්ඩාගාරයේ නියෝජිතයවරයාත් ආරක්ෂක අමාත්‍යාංශය නියෝජනය කරමින් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ කටයුතු කළ නියෝජිතයින්ද ඉදිරි පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවක් හමුවට කැඳවීමට කාරක සභාව නිර්දේශ කළාය.

ශ්‍රී ජයවර්ධනපුර මහ රෝහල් මණ්ඩලය

විමර්ශනය සිදු කළ දිනය - 2016.02.10

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. කාර්ය මණ්ඩලය

ආයතනයේ ප්‍රධාන තනතුරු වන අධ්‍යක්ෂ, නියෝජ්‍ය අධ්‍යක්ෂ සහ ගණකාධිකාරි යන තනතුරු පුරප්පාඩුව පැවතීම හේතුවෙන් ආයතනයේ පරිපාලනමය ප්‍රශ්න රැසක් පවතින බව නිරීක්ෂණය විය.

නිර්දේශ

මේ පිළිබඳව අමාත්‍යාංශය සෘජුව මැදිහත්වී මෙම පුරප්පාඩු ස්ථිර වශයෙන් පිරවීමට කටයුතු කිරීම

වර්තමාන තත්ත්වය සහ ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.15 දින වන තුරු මෙම පුරප්පාඩු පිරවීමට කටයුතු කර ඇති බවක් කාරක සභාවට වාර්තා වී නොමැත.

2. වෘත්තීය ගාස්තු අය කිරීම

රෝහලේ සියලු භෞතික හා මානව සම්පත් භාවිතා කරමින් හා ඖෂධ , ශල්‍ය ද්‍රව්‍ය, ආහාර වැනි දෑ සඳහාද විශාල මුදලක් වැය කරමින් ලබාදී තිබුණු ප්‍රතිකාර වෙනුවෙන් ඒ ඒ වර්ෂයන් වලදී ගෙවන වාට්ටුවල රෝගීන්ගෙන් අයකර තිබුණු මුළු ආදායමින් 50% ක් වෘත්තීය ගාස්තු වශයෙන් අයකර තිබුණු අතර එසේ අයකරන වෘත්තීය ගාස්තු වලින් 99.85% ක්ම අදාල වෛද්‍යවරුන් හා රෝහල් කාර්ය මණ්ඩලය වෙත ආපසු ගෙවා තිබූ අතර මුළු ආදායමින් ඉතිරි 50% පමණක් රෝහල් ආදායමට බැර කර තිබුණු අතර වෛද්‍යවරුන් හා රෝහල් කාර්ය මණ්ඩලය වෙත ආපසු ගෙවා තිබූ වෘත්තීය ගාස්තු මත උපයනවිට ගෙවීම් බදු අයකර නොතිබූ අතර 2014 හා 2015 වර්ෂ දෙක සඳහා පමණක් එසේ අයකර නොතිබුණු උපයනවිට ගෙවීම් බදු මුදල රු.74,744,995/- ක් විය. වෘත්තීය ගාස්තු අය කිරීම සම්බන්ධයෙන් නිවැරදි ක්‍රමවේදයක් නොතිබුණි.

නිර්දේශ

විගණන පරීක්ෂණයක් කර වෘත්තීය ගාස්තු මත උපයන විට බදු ගෙවීම නැවත අය කිරීම පිළිබඳ වාර්තාවක් සහ වෘත්තීය ගාස්තු අයකිරීමේ ක්‍රමවේදය මසක් ඇතුලත එවීම.

<u>**වර්තමාන තත්ත්වය සහ ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාව මගින් දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 දින වන තෙක් අපොහොසත් වී ඇත.

3. <u>ඕස්ට්‍රේලියාවෙන් පරිත්‍යාග කිරීමට එකඟ වූ නිර්වින්දන යන්ත්‍ර 4</u>

නිර්වින්දන යන්ත්‍ර 3 ක් දෝෂ සහගත යයි දක්වා අපහරණය කර ඕස්ට්‍රේලියාවෙන් පරිත්‍යාග කිරීමට එකග වූ එවැනි යන්ත්‍ර 4 ක් තිබියදී වෙනත් යන්ත්‍ර 4ක් රු.29,900,000/- ක් වැය කොට මිලදී ගැනීම නිසා ආයතනයේ මිළදී ගැනීමේ ක්‍රියාවලිය සහ ඉවත් කිරීමේ ක්‍රියාවලිය ඉතාම ගැටලු සහගත මට්ටමක පවතින බව තහවුරු විය.

<u>**නිර්දේශ-**</u>

ඕස්ට්‍රේලියාවෙන් පරිත්‍යාග කිරීමට එකඟ වූ යන්ත්‍ර 4 සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු රජය විසින් එවන ලද ලිපිය කාරක සභාවට එවන ලෙස කාරක සභාව නියෝග කළාය.

<u>**වර්තමාන තත්ත්වය සහ ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාව මගින් දෙනු ලැබූ නියෝග වලට ආයතනය නිසි වේලාවට ප්‍රතිචාර නොදක්වා ඇති අතර කාරක සභාව මගින් නියෝග කර ඇති යන්ත්‍ර 4 සම්බන්ධයෙන් ඕස්ට්‍රේලියානු රජය විසින් එවන ලද ලිපියද 2016.05.15 දින වන තුරු කාරක සභාවට එවා නැත.

දෝෂ සහගත යයි දක්වා අපහරණය කරන ලද යන්ත්‍ර 3 අපහරණය කිරීමට තරම් දෝෂ සහගතද යන්න පිළිබදව තාක්ෂණික සමීක්ෂණ මණ්ඩලයක නිර්දේශ ලබාගෙන නොතිබූ අතර එම යන්ත්‍ර 3 මීගමුව, කළුතර හා මොණරාගල දිස්ත්‍රික් රෝහල් වෙත ලබා දී ඇත.

4. <u>කල් ඉකුත්වූ තොග</u>

ස්නායු ශල්‍ය ඒකකය සඳහා මිළදි ගත් ඖෂධ හා වෙනත් භාණ්ඩ වලින් 80% ක් පමණ කල් ඉකුත් වීම.

2012 පෙබරවාරි මාසයේදී මිළදී ගෙන තිබුනු රු. 5,180,000/- ක වටිනාකමින් යුතු තොගයකින් රු. 4,118,000/- ක ප්‍රමාණයක් කල් ඉකුත් වී තිබීම.

<u>නිර්දේශ</u>

මෙම තොගය මොනවාද, මිළදී ගැනීමේ තීරණය ගත්තේ කා විසින්ද, නිවැරදි ඇස්තමේන්තුවක් සකස් කර තිබේද, 80% ක් ඉවත් කිරීමට සිදු වූයේ ඇයිද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය සහ ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාව මගින් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 දින වන තෙක් අපොහොසත් වී ඇත.

ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය

විමර්ශනය සිදු කළ දිනය - 2016.02.11

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. වැඩිහිටි තැනැත්තන් පිළිබඳව තොරතුරු සොයා බැලීමට අත්‍යාවශ්‍ය වන තොරතුරු පද්ධතියක් ආයතනය මගින් පවත්වාගෙන නොයෑමේ අඩුපාඩුව

වැඩිහිටි තැනැත්තන් පිළිබඳව තොරතුරු පද්ධතියක් නොමැතිකම ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ පවතින ප්‍රධාන අඩුපාඩුවකි. එම කාර්යාලය මෙතෙක් නිකුත් කළ හැඳුනුම්පත් ප්‍රමාණය කොතෙක් ද යන්න පිළිබඳව තොරතුරු ලබා ගැනීමට තොරතුරු පද්ධතියක් නොමැතිකම නිසා 2014 වසරේ හඳුනාගත් වයස අවුරුදු 60 ට වැඩි පුද්ගලයන් 40,000 සඳහා පමණක් වැඩිහිටි හැඳුනුම්පත් නිකුත් කිරීමට සැලසුම් සකස් කර තිබුණි. එහෙත් හැඳුනුම්පත් නිකුත් කිරීමට හැකි වූයේ 10,978 ක් වැනි අඩු පිරිසකට පමණි.

තොරතුරු ලබා ගැනීම සඳහා සමාජ සේවා නිලධාරීන් හෝ වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරීන් යොදා ගැනීම නිසි පරිදි සිදු නොවීම මෙන්ම ඒ සඳහා ක්‍රමවත් වැඩ පිළිවෙලක් නොමැති වීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

නිර්දේශ

සමාජ සේවා නිලධාරීන් හෝ වැඩිහිටි ප්‍රවර්ධන නිලධාරීන් යොදා ගනිමින් වැඩිහිටි තැනැත්තන් පිළිබඳව තොරතුරු පද්ධතියක් සැකසීම සඳහා වැඩ පිළිවෙලක් සකස් කිරීම සඳහා ග්‍රාම නිලධාරීන්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, මැතිවරණ දෙපාර්තමේන්තුව සම්බන්ධ කර ගන්නා ලෙස උපදෙස් දුන් කාරක සභාව ඒ සම්බන්ධව වාර්තාවක් කාරක සභාවට මාස දෙකක් ඇතුළත ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. වෙත නියෝග කරන ලදි.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මේ සම්බන්ධව ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය වාර්තා කර ඇත. ඒ අනුව මැතිවරණ දෙපාර්තමේන්තුවෙන් තොරතුරු ලබා ගෙන වැඩිහිටි තැනැත්තන් පිළිබඳව තොරතුරු පද්ධතියක් සැකසීම සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කිරීමට කටයුතු යොදාමින් සිටී.

2. අයවැය යෝජනාවක් අනුව වැඩිහිටියන් වෙත ගෙවන ලද රු. 2000/- වැඩිහිටි දීමනාවෙන් රු. 100/- මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අඩු කර ගැනීම

2015 අයවැය යෝජනාවක් අනුව අවුරුදු 70 ඉක්මවූ වැඩිහිටියන්ට ලබා දෙන රු 2000/- දීමනාවෙන් රු. 100/- ක් කපා එම මුදල මෙම ලේකම් කාර්යාලයේ සුභ සාධන අරමුදලක් ලෙස පවත්වාගෙන යෑමට සමාජ බලගැන්වීම හා සුභසාධන අමාත්‍යාංශයේ ලේකම් කටයුතු කර තිබීම ගැන කාරක සභාව සලකා බලන ලදි. මෙම රු. 100/- කපා ගැනීමේ ක්‍රියාවලිය යුක්ති සහගත භාවයක් නොමැති බව හා සදාචාර සම්පන්න නොවන බව කාරක සභාවේ තීරණය විය.
මෙම තීරණය පාලක විරෝධතා මැද අනුමත කර තිබීම, එම මුදල් ප්‍රතිපාදනය කළ මුදල් අමාත්‍යාංශයේ අනුමැතිය ද ලබා ගෙන නොතිබීම මෙන්ම සුභ සාධන අරමුදල් ලෙස යොදාගත හැකි රු. 6,974,959/- ක මුදලක් ස්ථාවර තැන්පතු ගිණුමක ආයතනය සතුව තිබියදී ත් මෙලෙස මුදල් කපා ගැනීම සිදු වෙමින් පවතී.

පෙර පැවති පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් 2012.06.05 දින ආයතනය සතුව තිබූ රු. මිලියන 04 ක අගයක් පෙන්නුම් කළ ස්ථාවර තැන්පතුව සුභ සාධන අරමුදලක් බවට පත් කිරීමට කටයුතු කිරීමට නිර්දේශ කර තිබුණි. නමුත් එම නිර්දේශය මෙතෙක් ක්‍රියාත්මක වී නැත.

<u>නිර්දේශ</u>

ආයතනයට අයත් ස්ථාවර තැන්පත් ගිණුමේ රු. මිලියන 6.9 ක තැන්පතු තිබියදී මුදල් අමාත්‍යාංශයේ විධිමත් අනුමැතියකින් තොරව, සමාජ සවිබල ගැන්වීමේ හා සුභසාධන අමාත්‍යාංශයේ චක්‍රලේඛ අංක 1/2016 මගින් රු. 100/- කපා එය සුභ සාධනය සඳහා වන අරමුදලකට බැර කිරීම නිර්දේශ නොකරන ලද අතර එම තීරණය නැවත සළකා බැලීමට සහ එම අඩු කර ගත් මුදල නැවත එම ප්‍රතිලාභීන්ට ලබා දීමට කටයුතු යොදන ලෙස ප්‍ර.ග.නි. ට නිර්දේශ කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මෙතෙක් මෙම නිර්දේශය ක්‍රියාත්මක කර නොමැත.

වැඩිහිටි තැනැත්තන් සඳහා වූ ජාතික සභාව මගින් රු. 100/- කපා ගැනීම අනුමත කොට ඇති බවද මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමට ද කටයුතු කර ඇති බවද සභාපති දන්වා ඇත.

3 <u>වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතේ අරමුණු ඉටු කිරීමේ කාර්ය භාරයේ අඩුපාඩු දක්නට ලැබීම</u>

2000 අංක 09 දරන වැඩිහිටි තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමේ පනතට අනුව මෙම සභාවේ ප්‍රධාන කර්තව්‍යය වන්නේ ශ්‍රී ලංකාවේ සිටින වැඩිහිටි තැනැත්තන්ගේ සුභසාධනය හා අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීම සහ වැඩිහිටි තැනැත්තන්ට ආත්ම ගෞරවයක්, ස්වාධීනත්වයක් හා ගරුත්වයක්

ඇතිව ජීවත් වීමට අවස්ථාව සලසා දීමයි. මෙම අරමුණ බලාපොරොත්තු වන මට්ටමින් ඉටු නොවන බවට කාරක සභාවේ දී කරුණු අනාවරණය විය.

<u>නිර්දේශ</u>

ප්‍ර.ග.නි. සහ ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂක වෙත කාරක සභාව පහත සඳහන් කරුණු නිර්දේශ කරන ලදි.

- ආයතනය පිහිටුවන ලද පනතේ සඳහන් සෑම අරමුණක්ම ඉටු කිරීමට දැනට වඩා වැඩ සටහන් ක්‍රියාත්මක කර ඒ පිළිබඳව කාරක සභාව දැනුවත් කිරීම.

- විශ්‍රාම ගත් පුරවැසියන්ගේ අත්දැකීම් සහ දැනුමෙන් රටේ ජනතාවගේ යහපත වෙනුවෙන් ප්‍රයෝජනයක් ගැනීමට ක්‍රමවේදයක් සොයා බැලිම.

- වැඩිහිටියන් සහ ළමුන් එකට කාලය ගත කරන දිවා සුරැකුම් මධ්‍යස්ථාන ඇති කිරීමට ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම.

- වැඩිහිටියන්ට නැරඹීමට හැකි සුදුසු ටෙලි නාට්‍ය විකාශය කිරීමේ ඇති හැකියාව පිළිබඳව සොයා බැලීම.

- වැඩිහිටියන්ට ව්‍යායාම් කිරීමට සුදුසු ස්ථාන ඇතිකිරීම.

- ජ්‍යෙෂ්ඨ පුරවැසි සමිති පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම.

- වැඩිහිටියන් ගේ දුක් ගැනිවිලි පිළිබඳ අභියාචනා ඉදිරිපත් කිරීම සඳහා ආයතනයට සම්බන්ධ නිලධාරියා මුලික කර ගනිමින් අභියාචනා කමිටුවක් දිස්ත්‍රික් මට්ටමින් සැකසීම.

- දරුවන්ට දෙමව්පියන් අගය කරන වැඩසටහන් හඳුන්වා දීම හා පැවැත්වීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.11 දින වන විටත් මෙම නිර්දේශ ක්‍රියාත්මක කළ බවට වාර්තාවක් කාරක සභාව වෙත ලැබී නොමැත.

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගම

විමර්ශනය සිදු කළ දිනය : 2016.02.12

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. සමාගමේ වර්තමාන මූල්‍ය අර්බුදය

දැඩි මූල්‍ය අර්බුදයකට ලක්ව ඇති මෙම සමාගම එම තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා නව අධ්‍යක්ෂ මණ්ඩලය වශයෙන් නිසි පියවර නොගැනීම.

නිර්දේශ

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඉදිරිපත් කර ඇති ප්‍රතිසංවිධාන යෝජනාවලිය කැබිනට් මණ්ඩලය විසින් අනුමත කර ඇති ලේඛන සහ සමාගමේ එම ප්‍රතිව්‍යුහගත කිරිමේ සැලසුම් ඇතුලත් වාර්තාවක් සතියක් තුල කාරක සභාවට ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.16 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ මූල්‍ය කාර්ය සාධනය

	2009/10 රු.මිලි	2010/11 රු.මිලි	2011/12 රු.මිලි	2012/13 රු.මිලි	2013/14 රු.මිලි	2014/15 රු.මිලි
මෙහෙයුම් ආදායම	62,364	77,125	92,868	119,571	121,586	131,922
පෙර වර්ෂයට සාපේක්ෂව ආදායම් වැඩිවීම/(අඩුවීමේ) ප්‍රතිශතය	(14.9)	23.7	20.4	28.6	1.7	8.5
මෙහෙයුම් වියදම	69,027	81,334	101,830	131,598	150,389	145,983
පෙර වර්ෂයට සාපේක්ෂව වියදම් වැඩිවීම/(අඩුවීමේ) ප්‍රතිශතය	(18.6)	17.8	25.2	29.2	14.3	(2.9)
බදුවලට පසු ශුද්ධ ලාභය/(පාඩුව)	(2,698)	(382)	(19,778)	(21,750)	(32,408.34)	(16,495)
මුළු ජංගම නොවන වත්කම්	28,532	19,863	43,735	34,542	25,212	22,837
මුළු ජංගම වත්කම්	15,755	18,276	22,072	29,306	37,154	49,721
මුළු ජංගම වගකීම්	28,244	28,017	58,499	68,685	88,609	103,414

<u>මුලු ශුද්ධ වත්කම්</u>

සමාගමේ ජංගම වත්කම් සහ ජංගම වගකීම් අතර අහිතකර පරතරයක් රජයට පවරාගත් 2008 වර්ෂයේ සිට අඛණ්ඩව පැවතිනි. සමාගමේ ජංගම වත්කම්, ජංගම වගකීම් පියවීමට ප්‍රමාණවත් නොවීම නිසා සමාගම මූල්‍ය අර්බුදයකට ලක්ව තිබුණි. එහෙයින් භාණ්ඩාගාරයේ සහයක් නොමැතිව සමාගමේ අඛණ්ඩ පවත්වාගෙන යෑම පිළිබඳ අවිනිශ්චිතතාවයකට වර්තමානයේදී පවා මුහුණ දී නොසිටීය යන්න බැහැර කළ නොහැකි විණි. සමාගමේ ශුද්ධ වත්කම් (Net Asset) 2015.03.31 දිනට රු. මිලියන 74,106 සෘණ අගයක් ගෙන තිබූ අතර මෙම තත්වය ක්‍රමිකව වර්ධනය වෙමින් පවතින තත්ත්වයක් බව නිරීක්ෂණය විය.

වර්ෂය	ජංගම වත්කම් රු. මිලියන	ජංගම වගකීම් රු. මිලියන	වෙනස හිතකර/(අහිතකර) රු. මිලියන	මාර්තු 31 දිනට ශුද්ධ වත්කම් රු. මිලියන
2007/2008	32,210	29,135	3,075	15,536
2008/2009	15,008	28,012	(13,004)	6,230
2009/2010	15,755	28,244	(12,489)	3,598
2010/2011	18,276	28,017	(9,740)	3,217
2011/2012	21,735	58,260	(36,525)	(1,439)
2012/2013	29,306	68,685	(39,379)	(45,973)
2013/2014	37,154	88,609	(51,455)	(57,221)
2014/2015	49,721	103,414	(53,693)	(74,106)

සීමාසහිත ශ්‍රී ලංකන් ගුවන් සේවා සමාගමේ මෙහෙයුම් කාර්ය සාධනය

	2008/09	2009/10	2010/11	20011/12	2012/13	2013/14	2014/15
ගුවන් ප්‍රවාහන කටයුතු ප්‍රවාහනය කළ මගීන් සංඛ්‍යාව (දහස් ගණනින්)	2,735	2,558	2,867	3,459	4,255	4,175	4,348
ප්‍රවාහනය කළ භාණ්ඩ ප්‍රමාණය(ටොන්)	73,106	72,058	86,053	87,750	101,100	101,878	94,410
කාර්ය මණ්ඩල ඵලදායිතාවය කාර්ය මණ්ඩල සාමාජික සංඛ්‍යාව	4,837	4,614	4,098	5,594	6,359	6,578	6,987
එක් සේවකයෙකු සඳහා ඉපැයීම (රු.) ලාභ/(පාඩු)	15,155,627	13,516,164	18,803,412	16,601,346	18,803,412	18,483,708	18,881,083
එක් සේවකයෙකු සඳහා ලාභය/(අලාභය)(රු)	(1,923,907)	(584,785)	(93,121)	(3,517,824)	(4,102,622)	(4,926,777)	(2,360,764)
එක් ගුවන් යානයකින් නඩත්තු කරන සේවකයින් සංඛ්‍යාව	403	385	256	254	289	313	333
ගුවන් යානා සංචිතය							
ඒ 320-200	03	03	04	07	08	08	06
ඒ 321-200	-	-	-	-	-	-	02
ඒ 330-200	04	04	05	07	07	07	07
ඒ 330-300	-	-	-	-	-	-	02
ඒ 340-300	05	05	05	06	06	06	04
ටුවින් ඔටර්	-	-	02	02	01	-	-
වර්ෂය අවසානයට සේවයේ යෙදවූ ගුවන් යානා සංඛ්‍යාව(මුළු)	12	12	16	22	22	21	21

නිරීක්ෂණය

සමාගම රජයට පවරාගත් 2008 වර්ෂයේ සිට මේ දක්වා අවම වශයෙන් මෙහෙයුම් වියදම් ආවරණය වන පරිදි ප්‍රමාණවත් මෙහෙයුම් ආදායමක් උපයා ගැනීමට අපොහොසත් වී තිබීම.

වර්ෂය	මෙහෙයුම් අලාභය රු.මිලියන
2011	3,937
2012	8,962
2013	12,027
2014	28,804
2015	14,081

නිර්දේශ

ඉදිරි ව්‍යාපාර සැලසුම් (Corporate Business Plan) සකස් කිරීමේදී සමාගමට ප්‍රමාණවත් මෙහෙයුම් ලාභයක් ලබාගත හැකි වන පරිදි ව්‍යාපාර සැලසුම් සකස් කළ යුතුය.

2. **සමාගමේ සමස්ත පාඩුව**

සමාගමේ සමස්ත පාඩුවට ඉන්ධන මිලේ බලපෑම හැරුණු විට ඒ සඳහා බලපා ඇති වෙනත් කරුණු පිළිබඳවද විශේෂයෙන් 2012/13 සහ 2014/15 කාල පරිච්ඡේදයේ ආදායමේ වැඩිවීමට හේතු වූ කරුණු විමසීම.

ගුවන් සේවා සමාගමේ අලාභය - 2009-2015

වර්ෂය	අලාභය රු. මිලියන
2008/2009	9,306
2009/2010	2,698
2010/2011	382
2011/2012	19,778
2012/2013	21,750
2013/2014	32,408
2014/2015	16,495
එකතුව	**102,816**

ශ්‍රී ලංකන් ගුවන් සමාගමේ ප්‍රධාන වියදම් වල සංක්ෂිප්ත විස්තරයක්

රු. මිලියන	2012/13	2013/14	2014/15
ඉන්ධන වියදම	63,864.94	59,946.90	53,451.02
මූල්‍ය වියදම	3,138.40	6,196.92	5,009.46
මුළු වියදමෙන් ඉන්ධන වියදම	42.62%	38.27%	35.38%
මුළු වියදමෙන් මූල්‍ය වියදම	2.09%	3.96%	3.32%

නිර්දේශ

ඉදිරියේදී සමාගම මෙම අහිතකර මූල්‍ය තත්වයෙන් මිදී, ජාතික ගුවන් සේවය වශයෙන් පවත්වා ගෙන යැම සඳහා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග ඇතුලත් කොට ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.16 දින වන විටත් මේ සඳහා වැඩපිළිවෙලක් ආරම්භ කලේද නැද්ද යන්න පිළිබඳ පොදු ව්‍යාපාර කාරක සභාව දැනුවත් කර නොමැත.

3. සමාගම වෙනුවෙන් නව ගුවන් යානා මිලදී ගැනීම

මීට පෙර සමාගමේ කටයුතු කළ අධ්‍යක්ෂ මණ්ඩලය, රුපියල් බිලියන 143 බැඳීම් මත A-330 ගුවන් යානා 7 සහ A-350 ගුවන් යානා 8 මිලදී ගැනිම සම්බන්ධයෙන් පූර්ව පිරිවැය ප්‍රතිලාභ අධ්‍යයනයක් සහ තාක්ෂණික ඇගයීමක් සිදුකර තිබේද යන්න කාරක සභාවේ අවධානයට ලක්විය.

නිර්දේශ

අදාල තාක්ෂණ ඇගයිම් කමිටු වාර්තාව, කැබිනට් මණ්ඩලය විසින් අනුමත කරන ලද ලිපිය සහ පසුව එම මිලදී ගැනීමට කැබිනට් මණ්ඩලයේ අනුමැතිය අනවශ්‍ය බව දන්වා සමාගම වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ පිටපත් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදි. සමාගමේ පැවති මූල්‍ය තත්වය ගැන අධ්‍යයනයකින් තොරව, පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයක් සිදු නොකර එළඹි ගණුදෙනුවක් බැවින් එයට වගකිවයුතු හිටපු අධ්‍යක්ෂ මණ්ඩලය කාරක සභාව ඉදිරියට කැඳවිය යුතු බවට තීරණය විය.

ශුද්ධ වත්කම් සෘණ මට්ටමක පවතින ආයතනයක් ලෙස රටේ ආර්ථිකට විශාල වැය බරක් වෙමින් නිසි ශක්‍යතා අධ්‍යනයකින් තොරව සිදුව ඇති මෙම ගනුදෙනුව තව දුරටත් පවත්වා ගත යුතු නැති බවත් ඒ ගැන අමාත්‍යාංශ මට්ටමින් තීරණයක් ගත යුතු බවටත් කමිටුව තව දුරටත් තීරණය කරන ලදී.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.02.19 දින පොදු ව්‍යාපාර කාරක සභාවේ සභාපතිතුමාගේ නමින් එවා ඇති වාර්තාවේ ඇතුලත්ව ඇති මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශය මගින් 2013 අප්‍රේල් මස නිකුත් කරන ලද අංක PE/33/CM/2013 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ,මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ නිරීක්ෂණ යටතේ "ශ්‍රී ලංකන් ගුවන් සමාගම ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයක් යටතේ පාලනය වන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද පොදු සමාගමක් වන අතර ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම මීට ප්‍රථම ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කළ පරිදි සිදු කිරීම සභාපති, ප්‍රධාන විධායක නිලධාරී හා අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමක් බව නිරීක්ෂණය කරමි" යනුවෙන් සහ "ගුවන් යානා ඇණිය ප්‍රතිස්ථාපනය කිරීම මූල්‍යමය වශයෙන් ගුවන් සමාගම ශක්තිමත් වන අයුරින් සහ ප්‍රාග්ධනකරණය ශක්තිමත් වන අයුරින් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය වගබලාගත යුතු බව වැඩිදුරටත් නිරීක්ෂණය කරමි" යනුවෙන්ද සඳහන් වේ.

එසේම, මෙම ගුවන් යානා වලින් කිහිපයක් මේ වන විටත් නිපදවීමට හා ගුවන් සමාගම වෙත භාරදීම ආරම්භ වී ඇති අතර එළැඹී ගිවිසුම පරිදි මෙම ඇණවුම පසුව අවලංගු කරන්නේ නම් එක් යානයක් සඳහා ඇ. ඩො. මිලියන 20 ක වන්දියක් ගෙවිය යුතු බවට වන කොන්දේසියක් ද ඇතුළත් කර ඇති බවද කමිටුව විසින් නිරීක්ෂණය කරන ලදී.

4. සමාගමට අයවිය යුතු මුදල් අය කර ගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග

දැඩි මුල්‍ය අර්බුදයකට ලක්ව ඇති මෙම සමාගම වෙතින් සේවය සපයාගත් ආයතන වලින් ලැබිය යුතු රු.150,335,877/- ක මුදල අයකර ගැනිම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග විමසීම.

නිර්දේශ

අදාල වාර්තාව සති 2 ක් තුල කාරක සභාවට ඉදිරිපත් කිරිම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

2016.05.16 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

5. <u>ප්‍රධාන වාණිජ නිලධාරියෙකු පත් කිරිම හා ඔහුගේ කාර්ය භාරය</u>

ප්‍රතිසංවිධාන කටයුතු මේ දක්වා ක්‍රියාත්මක නොකර තිබියදිත් අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයින් 5 දෙනෙකුගේ එකඟත්වයක් පවා නොමැතිව රුපියල් මිලියන 3 ආසන්න වැටුප් හා වෙනත් දිමනා ලබා දෙමින් සිවා රාමචන්ද්‍රන් නැමති වයස අවු. 60 ඉක්මවු නිලධාරියෙකු පත් කිරිමෙන් ආයතනයේ පාඩුව අඩු කිරිමට එය දායක වූයේ කෙසේදැයි විමසීම.

<u>**නිර්දේශ**</u>

අධ්‍යක්ෂ මණ්ඩලයේ බහුතර එකඟතාවයකින් තොරව මෙම බඳවා ගැනිමේ සම්පුර්ණ වගකිම සභාපතිවරයා සහ ප්‍රධාන විධායක නිලධාරියා භාර ගත් අතර එම පත් කිරිම පිළිබඳව සොයා බැලිමට පත් කළ විශේෂ අනු කමිටුවේ වාර්තාව සහ එය අනුමත කර ඇති කැබිනට් මණ්ඩල වාර්තාවත් සමග අධ්‍යක්ෂ මණ්ඩලයේ වාර්තාවත් කාරක සභාවට ඉදිරිපත් කිරිම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

2016.02.19 දින අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

6. <u>පෞද්ගලික අවශ්‍යතා මත ගුවන් ගමන් මාර්ග වෙනස් කිරිම</u>

පෞද්ගලික අවශ්‍යතාවයක් මත ක්වාලාලම්පුර් වලින් ගුවන් ගත වූ යානයක් සිංගප්පුරුවේ ගොඩබෑම සම්බන්ධයෙන් කිසියම් විරෝධයක් මතු වුයේද යන්න කාරක සභාව විමසිය. එම ක්‍රියාව හේතුවෙන් සමාගමට සිදුව ඇති පාඩුව පිළිබඳව ද අවධානය යොමු විය.

<u>**නිර්දේශ**</u>

මේ පිළිබඳ වාර්තාවක් ලබා දීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

2016.02.19 අදාල වාර්තාව පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇත.

7. අලාභය අඩු කර ගැනිමට ගත හැකි ක්‍රියාමාර්ග

සමාගමේ වියදම් පාලනය කිරිම සඳහා කිසියම් සැලසුම් කල වැඩ පිළිවෙල පිළිබඳ විමසීම.

නිර්දේශ

ප්‍රතිව්‍යුහගත කිරීමේ සැලැස්ම පිළිබඳව විගණකාධිපති සහ මහා භාණ්ඩාගාරය සමග සාකච්ඡා කිරීම.

වර්තමාන තත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.16 දින වන විටත් මේ පිළිබඳව වාර්තා කර නැත.

පොදු නිරීක්ෂණ

1. පිරිවැය ප්‍රතිලාභ විශ්ලේෂණයකින් තොරව නව ගුවන් යානා මිල දි ගැනීම,ශුද්ධ වත්කම් සෘණ මට්ටමක පවතින ආයතනයක් ලෙස රටේ ආර්ථිකයට විශාල වැය බරක් මෙම ගණුදෙනුව මගින් සිදුව ඇති හෙයින් තව දුරටත් එම ගණුදෙනුව පවත්වා ගත යුතු නැති බවත්

2. සමාගමේ පසුගිය අධ්‍යක්ෂ මණ්ඩලය කාරක සභාව හමුවට කැඳවිය යුතු බවත්

3. ඛනිජ තෙල් නිතීගත සංස්ථාව සමග සාකච්ඡා කර තෙල් මිල සම්බන්ධ ගිවිසුම් නැවත සමාලෝචනය කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලෙසත් ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ සහාය ලබා ගන්නා ලෙසත් නිර්දේශ කරන ලදි.

4. නිසි වෙළඳපොළ ඇගයීමක් හා මූල්‍ය විශ්ලේෂණයක් සිදු කර සමාගම දැනට පවතින අහිතකර මූල්‍ය තත්වයෙන් මිදීම සඳහා උපාය උපක්‍රම ඇතුලත් සැලැස්මක් සකස් කිරීමට හා එම උපක්‍රම ක්‍රියාත්ම කිරීම සඳහා ආයතනය සුදුසු ප්‍රතිසංවිධානයකට ලක් කිරීම කඩිනමින් කළ යුතු බව නිරීක්ෂණය විය.

රාජ්‍ය ඖෂධ නීතිගත සංස්ථාව

විමර්ශනය සිදු කළ දිනය : 2016.02.23

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. සාම්පල් පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය රසායනාගාර පහසුකම් නොතිබීම නිසා ජනතාවට කල් ඉකුත්වූ සහ භාවිතයට නුසුදුසු ඖෂධ ලැබීමේ හැකියාව වැඩි බව.

රසායනාගාර පහසුකම් නොමැතිවීම හේතුවෙන් ආනයනය කරන සියළුම ඖෂධ අයිතම තත්ත්ව පරීක්ෂණයට යොමු නොකරන බවත්, ඖෂධ බෙදාහැරීමට ප්‍රථම නියැදි පරීක්ෂා කිරීම් ප්‍රමාද වීම නිසා තත්ත්වයෙන් අසමත් ඖෂධ රෝගීන්ට නිකුත් කෙරෙන බවත්, සිදුකර තිබුණු නියැදි පරීක්ෂණ සංඛ්‍යාවේ ප්‍රමාණාත්මකභාවය පිළිබඳ සෑහීමකට පත්විය නොහැකි බවත් නිරීක්ෂණය විය. 2015 ජනවාරි සිට සැප්තැම්බර් මාසය දක්වා ආනයනය කර තිබුණු ඖෂධවල නියැදි පරීක්ෂණ පිළිබඳ විස්තර පහතින් දැක්වේ.

ඖෂධවල නියැදි පරීක්ෂණ - 2015 ජනවාරි සිට සැප්තැම්බර් දක්වා

නියැදි පරීක්ෂා කිරීම් කරන අවස්ථා	ආනයනය කර තිබුණු ඖෂධ අයිතම ගණන	නියැදි පරීක්ෂා කිරීමට ලක්කර තිබුණු ඖෂධ අයිතම ගණන	ප්‍රතිශතය
ලංසු ඇගයීමට පෙර හා නැව්ගත කිරීමට පෙර නියැදි පරීක්ෂාව	674	73	11
බෙදාහැරීමට පෙර නියැදි පරීක්ෂාව	991	378	38

නිර්දේශ

රසායනාගාර පහසුකම් නොතිබීම හේතුවෙන්,කලින් ඉදිරිපත් කරන ලද සාම්පල් හා ආනයනය කරන ඖෂධ අයිතම අනුකූල වේදැයි තත්ත්ව පරීක්ෂණයක් වරායේදී නොකරන බව හා ඖෂධ බෙදාහැරීමට ප්‍රථම නියැදි පරීක්ෂා කිරීම් සිදු නොකිරීම නිසා, තත්ත්වයෙන් අසමත් ඖෂධ රෝගීන්ට නිකුත් කිරීමේ තත්ත්වය වැලැක්වීමට හැකි ක්‍රමවේදයක් ඉක්මනින් සැකසීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.20 දින පොදු ව්‍යාපාර කාරක සභාව වෙත එවා ඇති වාර්තාවට අනුව තොග ඌනතා (Out of stock) සහ අත්‍යවශ්‍ය අවස්ථා වලදී පමණක් හැරෙන්නට හැකි සෑම අවස්ථාවකදීම ආනයනය කරනු ලබන සියළුම ඖෂධ නිකුත්කිරීමට පෙර පරීක්ෂාවට ලක් කිරීම ප්‍රායෝගිකව කළ නොහැක්කක් බැවින් අත්‍යවශ්‍ය ගණයට අයත්වන ප්‍රධාන ඖෂධ වර්ග (Essential Drugs) හඳුනාගෙන (උදා - හෘද රෝග, දියවැඩියාව, අපස්මාරය, ස්නායු සම්බන්ධ ආබාධ ආදී රෝග සඳහා දෙන ඖෂධ වර්ග) ඒවායේ තොග නිකුත් කිරීමට පෙර (Pre distribution) පරීක්ෂාවට භාජනය කිරීම සහ මෙම සාම්පල් ඖෂධ සංස්ථාව මගින් අහඹු ලෙස ලබාගෙන ඖෂධ සංස්ථාවේ රසායනාගාරයෙන් හෝ ලෝක සෞඛ්‍ය සංවිධානය මගින් අනුමත කළ රසායනාගාරයක් වෙත යොමු කිරීමෙන් පරීක්ෂා කිරීමට අදහස් කරන බවට දැනුවත් කර ඇත.

2. තත්ත්වයෙන් අසමත් රු. මිලියන 109 ඖෂධ විනාශ කිරීමට සිදුවී තිබීම

තත්ත්වයෙන් අසමත්වීම, කල් ඉකුත්වීම ආදීවූ හේතු නිසා 2014 හා 2015 වර්ෂවල රු. මිලියන 214.6 ක ඖෂධ විනාශ කිරීමට සිදුවී තිබීම.

විනාශ කරන ලද ඖෂධ වටිනාකම් - 2014 හා 2015 වර්ෂවලට අදාලව

වර්ෂය	ඒ ඒ වර්ෂවලට අදාලව විනාශ කිරීමට තීරණය කර තිබුණු ඖෂධවල වටිනාකම රු. මිලි.	ඒ ඒ වර්ෂවල දී විනාශ කර තිබුණු ඖෂධවල වටිනාකම රු. මිලි.	ඒ ඒ වර්ෂය අවසන් වන විටත් විනාශකර නොතිබුණු ඖෂධවල වටිනාකම
2014	103.7	86.0	17.7
2015	146.6	128.6	18.0
එකතුව	250.3	214.6	35.7

නිර්දේශ

2014 වර්ෂයේ සහ 2015 වර්ෂයේ අදාල තොග පිළිබඳ වටිනාකම් සඳහන් නොකිරීම නිසා, ඒ ඒ වර්ෂවල දී විනාශ කිරීමට තීරණය කර තිබුණු, විනාශ කර තිබුණු සහ විනාශ කර නොතිබුණු ඖෂධවල වටිනාකම සඳහන් වාර්තාවක් කාරක සභාවට මාසයක් තුල ලබාදීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.20 දින පොදු ව්‍යාපාර කාරක සභාව වෙත එවා ඇති වාර්තාවට අනුව, විවෘත වෙළඳපලට නිකුත් කර, අලෙවියට නුසුදුසු ලෙස වාර්ෂික තොග ගණනයේදී හඳුනාගත්, ඖෂධ අතරින් විනාශ කිරීම සඳහා තීරණය කර, 2014 සහ 2015 වර්ෂ වලදී විනාශ කරන ලද සහ විනාශ නොකරන ලද ඖෂධවල වටිනාකම.

වර්ෂය	විනාශ කිරීම සඳහා තීරණය කරන ලද තොග වටිනාකම (රු)	විනාශ කරන ලද තොග වටිනාකම (රු)	විනාශ නොකරන ලද තොග වටිනාකම (රු)
2014	12,621,589.74	12,342,035.98	279,553.76
2015	2015 වර්ෂයේ තොග විනාශ කර නොමැත		
මුළු විනාකම	12,621,589.74	12,342,035.98	279,553.76

3. 2010 ජුනි මස රු. මිලියන 30 ක ඖෂධ භාවිතයෙන් ඉවත් කිරීම

භාවිතයෙන් ඉවත් කර තිබුණු ඖෂධයක් වෙනුවෙන් රු. 30,885,377/- ක් (Paracetamol BP 500mg) සැපයුම්කරුගෙන් අයකරගැනීමට තිබෙන අවස්ථාවකදී එම සැපයුම්කරු විසින් ඇමරිකානු ඩොලර් 944,261 ක් තමා වෙත ගෙවන ලෙස කර තිබුණු ඉල්ලීම සම්බන්ධයෙන් බේරුමකට එළඹ නොතිබීම.

නිර්දේශ

සැපයුම්කරුගෙන් මෙම මුදල අය කර ගැනීමට නොහැකි වූ කරුණු මොනවාද යන්නත්, ඔහු සමඟ තිබූ එකඟතා ගිවිසුම සහ බේරුම්කරණ තීරණය පිළිබඳවත් සවිස්තර වාර්තාවක් කාරක සභාවට මසක් ඇතුළත ලබාදීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.20 දින පොදු ව්‍යාපාර කාරක සභාව වෙත එවා ඇති වාර්තාවට අනුව මෙම ඖෂධය Pure Pharma නමැති ඉන්දියානු සමාගම විසින් සපයන ලද අතර Paracetamol නමැති ඖෂධය තත්වයෙන් අසමත් වීම නිසා එවකට පැවැති ඖෂධ අධිකාරිය (CDDA-Cosmetic Devices and Drugs Regulatory Authority) විසින් "අදාළ තොගය තත්ත්වයෙන් අසමත් වන අවස්ථාවකදී ඇණවුම් කර ඇති ඉදිරි තොග අවලංගු කිරීමේ අයිතිය සංස්ථාව සතු වන්නේය" යන පදනම මත ලියාපදිංචිය අවලංගු කරන ලද අතර සපයන ලද අත ඇති තොගය භාවිතයෙන් ඉවත් කිරීමට සිදුවීම නිසා සිදුවූ අලාභය පියවා ගැනීමට හරපතක්

නිකුත් කර ඇතත්, සැපයුම්කරු එය පිළිගෙන නැත. සැපයුම්කරු ලියාපදිංචිය අවලංගු කිරීමට ගත් තීරණය පිළිබඳව ආරවුල් කරමින් බේරුම්කරණයට යොමුවීම නිසා එම මුදල අයකර ගැනීමට නොහැකිවී ඇත.බේරුම්කරණයේ සාක්ෂි විමසීම් හා ලිඛිත දේශන අවසන් වී ඇත.මෙතෙක් බේරුම්කරණයේ තීරණය ලැබී නැත.

4. 2014 දෙසැම්බර් 31 දින වන විට රු.මිලියන 36 ක තොග විකිණිය නොහැකි තත්වයට පත්වීම.

1996 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා කාලය තුළ ඔසුසැල් මගින් අලෙවි කිරීම සඳහා මිලදී ගෙන තිබුණු ඖෂධ වලින් 2014 දෙසැම්බර් 31 දිනට තත්වයෙන් අසමත්වී තිබුණු ඖෂධ වල වටිනාකම රු. 198,999,856/- ක් විය. නමුත් භෞතික තොග සත්‍යාපන වාර්තාව අනුව එම තොගයේ වටිනාකම රු. 134,392,373/- ක් වූයෙන් වෙනස රු. 64,607,483/- ක් විය. මෙම වෙනසින් රු. 36,756,030/- ක වටිනාකම් සඳහා පැහැදිළි කිරීම් විගණනය සඳහා ඉදිරිපත් නොකෙරුණි. විකිණිය නොහැකි තත්වයට පත්ව තිබුණු තොග භෞතිකව නොපැවතීම තුළ විකිණීමට නුසුදුසු තොග වෙළඳපළට නිකුත්වීමේ හැකියාවක් නොපවතින්නේද යන්න විගණනයේදී බැහැර කළ නොහැකිවිය.

නිර්දේශ

තොග ගණනය කිරීමේදී සහ අත්හිටුවීමේදී සිදුවූ වැරදි සහ නැවත එය තොගයට එකතු කළේ නම් ඒ කුමන පදනමින්ද?, ඒ සඳහා වගකිවයුතු නිලධාරීන් කවුද? යන්න පිළිබඳව වාර්තාවක් මසක් ඇතුලත ලබාදීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.20 දින පොදු ව්‍යාපාර කාරක සභාව වෙත එවා ඇති වාර්තාවට අනුව දක්වා ඇති පරිදි වාර්ෂික තොග ගණන් ගැනීමේදී නිසි පරිදි මෙම තොගය ගණන් බලා වාර්තාවලට ඇතුලත් නොකිරීම නිසා තොග භෞතිකව පැවතීම සත්‍යාපනය නොකිරීමෙන් මෙම තොග සම්බන්ධයෙන් කරුණු සොයා ගැනීම මග හැරී ගොස් ඇති බවත් මේ සම්බන්ධව විමර්ශනයක් සිදුකර වගකිවයුතු නිලධාරීන්ට විරුද්ධව පියවර ගන්නා බව දන්වා ඇත.

5. තත්ත්වයෙන් අසමත් වී තිබුණු ඖෂධ සඳහා රු. මිලියන 240ක් සැපයුම්කරුවන්ගෙන් අයකර නොගැනීම

ඒ ඒ වර්ෂවලදී ආනයනය කර තිබුණු හා තත්ත්ව පරීක්ෂණ සඳහා යොමුකළ ඖෂධ අතරින් සැළකිය යුතු ප්‍රමාණයක් තත්වයෙන් අසමත්වී තිබුණ අතර එම ඖෂධවල ගැණුම් පිරිවැය හා අමතර 25% ක් සැපයුම්කරුවන්ගෙන් අයකිරීමට

අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කර තිබුණු නමුත් එසේ කටයුතු කර නොතිබුණි.

<u>තත්ත්වයෙන් අසමත්වී තිබුණු ඖෂධවල ගැණුම් පිරිවැය- 2011-2014</u>

වර්ෂය	වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් මිලදී ගෙන තිබුණු ඖෂධ වලින් තත්ත්වයෙන් අසමත්වී තිබුණු ඖෂධවල ගැණුම් පිරිවැය(රු.මිලියන)	සංස්ථාවේ අලෙවිය සඳහා මිලදී ගෙන තිබුණු ඖෂද වලින් තත්ත්වයෙන් අසමත් වී තිබුණු ඖෂධවල ගැණුම් පිරිවැය (රු.මිලියන)	එකතුව (රු.මිලියන)
2011 හා ඊට පෙර	556.5	90.6	647.1
2012	68.5	22.9	91.4
2013	103.0	43.1	146.1
2014	139.1	42.3	181.4
එකතුව	**867.1**	**198.9**	**1066.0**

<u>තත්ත්වයෙන් අසමත්වී තිබුණු ඖෂධවල ගැණුම් පිරිවැය- 2011 සිට 2015</u>

වර්ෂය	ඒ ඒ වර්ෂවලදී තත්ත්වයෙන් අසමත්වී තිබුණු ඖෂධවල ගැණුම් පිරිවැය (රු. මිලියන)	සැපයුම්කරුවන් වෙත නිකුත් කර තිබුණු හරපත්වල වටිනාකම (රු.මිලියන)	2015 ජනවාරි 31 දින වන විට කාර්ය සාධන ඇප බැඳුම්කර හා රැඳවුම් මුදල් වලින් අයකර තිබුණු වටිනාකම (රු.මිලියන)	අයකර තැනීමට අපොහොසත් වී තිබුණු මුදල (රු.මිලියන)
2011 හා ඊට පෙර	556.5	තොරතුරු ඉදිරිපත් නොකෙරුණි	තොරතුරු ඉදිරිපත් නොකෙරුණි	තොරතුරු ඉදිරිපත් නොකෙරුණි
2012	68.5	52.6	28.6	24.09
2013	103.0	120.9	25.0	95.9
2014	139.1	58.9	32.1	26.9
2015	14.1(මේ වන විට හඳුනාගෙන ඇති ප්‍රමාණය පමණි)	101.0	7.2	93.9
එකතුව	**881.2**	**333.4**	**92.9**	**240.7**

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, වෛද්‍ය සැපයුම් අංශය වෙනුවෙන් ආනයනය කරන ලද තත්ත්වයෙන් අසමත් ඖෂධවල ගැණුම් පිරිවැය හා අමතර 25% ගාස්තු අය කර ගැනීමට සැපයුම්කරුවන් වෙත ඒ ඒ වර්ෂවල දී නිකුත් කර තිබුණු හරපත්‍රවල වටිනාකමින්, කාර්යසාධන ඇප බැඳුම්කර හා රඳවුම් මුදල් වලින් අයකර ගත හැකි වටිනාකම පමණක් බොහෝ අවස්ථාවලදී අයකර තිබුණු බවත්, ඉතිරි මුදල් අයකර ගැනීමට අපොහොසත් වී තිබුණු බවත් නිරීක්ෂණය විය . රු. මිලියන 10 ට අඩු ඖෂධ මිලදී ගැනීම් වලදී සැපයුම්කරු සමඟ ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

<u>නිර්දේශ</u>

තත්ත්වයෙන් අසමත්වී තිබුණු ඖෂධවල වටිනාකම රු. මිලියන 1066/- ක් වීම සහ වෛද්‍ය සැපයුම් අංශය වෙත සැපයූ නමුත් තත්ත්වයෙන් අසමත් ඖෂධවල ගැණුම් පිරිවැය හා අමතර 25%ක් වශයෙන් රු. මිලියන 240ක් සැපයුම්කරුවන්ගෙන් අයකර ගැනීම පිළිබඳව සොයා බැලීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.20 දින පොදු ව්‍යාපාර කාරක සභාව වෙත එවා ඇති වාර්තාවට අනුව “1996 වර්ෂයේ සිට 2014 වර්ෂය දක්වා සංස්ථාව විසින් අලෙවිය සඳහා ගෙන්වූ ඖෂධ වලින් රු. 198,999,856.00 ක්වූ ඖෂධ විකිණිය නොහැකි තත්වයට පත්ව තිබූ බව විගණන වාර්තා වලින් දන්වා ඇත.සත්‍යාපන වාර්තාව අනුව එම තොගයේ වටිනාකම රු. 134,392,373.00 ක් ලෙස ගණනය කරන ලද අතර රු. 64,607,483.00 ක වෙනසක් හඳුනාගන්නා ලදී. මෙම වෙනසින් රු. 27,851,453.00 ක වටිනාකම සඳහා පැහැදිලි කිරීම් විගණනය වෙත ඉදිරිපත් කර ඇත. තව දුරටත් රු. 36,756,030.00ක මුදලක වෙනසක් පවතී.

ඒ අනුව,	
සත්‍යාපනය අනුව විකිණිය නොහැකි තොගයේ වටිනාකම	රු. 134,392,373.00
අඩුකළා-	
සැපයුම්කරුගෙන් මුදල් අයකර ගත නොහැකි තොගයේ වටිනාකම	රු. <u>27,950,389.81</u>
2014/12/31 දිනට සැපයුම්කරුවන්ගෙන් මුදල් අයකරගත යුතු තත්වයෙන් අසමත්වූ භාණ්ඩ වල වටිනාකම	රු. <u>106,441,983.19</u>

2014/12/31 දිනට සැපයුම්කරුවන්ගෙන් මුදල් අයකර ගත යුතු, තත්ත්වයෙන් අසමත් වූ භාණ්ඩ සඳහා අයවිය යුතු රු.106,441,983.19 ක මුදලෙන් රු.49,234,394.11ක් මේ දක්වා අයකරගෙන ඇත. සැපයුම්කරුවන්ගෙන් අයවිය යුතු ඉතිරි මුදල් ප්‍රමාණය අයකරගැනීම සඳහා ආනයන අංශය මගින් කටයුතු සම්පාදනය කර ඇත” යනුවෙන් සඳහන් කර ඇත.

පොදු නිරීක්ෂණ

- ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳව නැවත කාරක සභාවට කරුණු වාර්තා නොකිරීම
- අමාත්‍යාංශ මට්ටමින් මැදිහත්වීම් ප්‍රමාණවත් නොවීම
- තත්ත්වයෙන් අසමත් වන ආනයනික ඖෂධ සඳහා කඩිනමින් හරපත් නිකුත් කර එහි පිරිවැය අයකර ගැනීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් හඳුන්වා දීම
- තත්ත්වයෙන් අසමත් ඖෂධ හඳුනාගත් වහාම නිසි අනුමැතියකින් පසු විනාශ කිරීම සඳහා වැඩපිළිවෙලක් ශක්තිමත් කිරීම හා කඩිනම් කිරීම

ජනතා වතු සංවර්ධන මණ්ඩලය

විමර්ශනය සිදු කළ දිනය - 2016. 02. 24

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. ආයතනයට අයත් ඉඩම් ඉතා අඩු මුදලට තක්සේරු කර බදු දීම

කොළඹ ප්‍රධාන මර්මස්ථාන සමීපයෙහි ඇති මණ්ඩලයට අයත් ඉඩම් ඉතා අඩු මුදලකට තක්සේරු කර බදු දී ඇති බව කාරක සභාවේ අවධානයට ලක්විය. එම ඉඩම් බදු දීමේ ගිවිසුම් හෝ කුමන පාර්ශවයකට බදු දී ඇත්ද යන්න පිළබඳ තොරතුරු ප්‍රමාණවත් ලෙස කාරක සභාවට ඉදිරිපත් කර තිබුනේ නැත. ආයතනයට අයත් ඉඩම් හා දේපල වසර 25, 30, 50 වැනි ඉතා දීර්ඝ කාල වකවානු සඳහා බදු ගිවිසුම්වලට එළඹ තිබීමද දක්නට ලැබුණි. එකී කාල වකවානු අවසානයේද බදු ගිවිසුම් නැවත අලුත් නොකර ගිවිසුම් තවදුරටත් දීර්ඝ කිරීමකට ද ගිවිසුමෙහි ප්‍රතිපාදන සලසා ඇති බවද අනාවරණය විය.

මෙම ඉඩම් හා දේපල විවෘත වෙළඳපලෙහි පවතින මිලට තක්සේරු කර ගිවිසුම් ගත වූයේ නම් මීට වඩා විශාල මුදලක් ලාභ වශයෙන් රජයට අයත් වන බව කාරක සභාව නිරීක්ෂණය කළාය.

ආයතනයට අයත් කොළඹ වොක්ෂෝල් වීදියේ පවත්නා ඉඩම කලින් ගනු ලැබූ කැබිනට් තීරණයක් මත ඉතා අඩු මුදලකට වටිනාකම තීරණය කොට බදු දීමට පියවර ගනිමින් සිටින බව කාරක සභා රැස්වීමට පැමිණි නිලධාරියකු අනාවරණය කරන ලද අතර මෙවන් ක්‍රියා මගින් ඉතා පහල මට්ටමක පවතින ආයතනයේ මූල්‍ය තත්වය තවදුරටත් පහල තත්ත්වයකට පත්වන බව කාරක සභාවේ අදහස විය.

කොළඹ නගරයේ පවතින ඉඩම් හා දේපල කීපයක් බදු දී ඇති ආකාරය දැක්වෙන දත්ත සටහනක් කාරක සභාවට ඉදිරිපත් කරන ලදී. (ඇමුණුම - 07)

නිර්දේශ

- එම බදු ගිවිසුම් පිළිබඳ සම්පූර්ණ විස්තරයක් එම ගිවිසුම් අත්සන් කර ඇති නිලධාරීන්ගේද ඉඩම් ලබාදී ඇති පුද්ගලයන්ගේද නාම ලේඛනයක් සමග කාරක සභාවට ලබා දෙන ලෙස දැනුම් දීම.
- ක්‍රමවත් අධ්‍යනයකින් පසුව ආයතනය සතුව කොළඹ නගරයේ පවතින ඉඩම්වලින් ප්‍රමාණවත් ලාභයක් ලැබිය හැකි ක්‍රමවේදයක් පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන මාස 2 ක කාලයක් තුල කාරක සභාවට දැනුම් දීම.

- කොළඹ නගරයේ පවතින ඉඩම් පිළිබඳව වෙනම පරිගණක දත්ත පද්ධතියක් සැකසීම.
- කලින් ගනු ලැබූ කැබිනට් තීරණයක් මත ඉතා අඩු මුදලකට වටිනාකම තීරණය කොට බදු දීමට පියවර ගනිමින් සිටින ආයතනයට අයත් කොළඹ වොක්ෂෝල් වීදියේ පවත්නා ඉඩම සම්බන්ධ කටයුතු වහාම නතර කිරීමට පියවර ගන්නා ලෙස
- එම ඉඩම් සඳහා විවෘත වෙළඳපලෙහි මිල ගණන් අනුව තක්සේරු අගයන් ලබාගැනීම සුදුසු බව
- අඩු වටිනාකමට තක්සේරු කර ඇති ඉඩම් නැවත වටිනාකම තක්සේරු කර වර්තමාන වෙළඳ වටිනාකමට සරිලන අගයන් ලබා ගැනීම

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ඉහත කරුණු පිළිබඳ වෙනම වාර්තාවක් එවා නැත.

2. <u>වතු ආශ්‍රිත ඉඩම්</u>

වතු ආශ්‍රිත ඉඩම් අනවසර පදිංචිකරුවන් භුක්ති විඳින බව නිරීක්ෂණය කරන ලද අතර ඒවායින් අපේක්ෂිත ලාභයක් කිසිසේත් ජනිත නොවන බව නිරීක්ෂණය විය.

- කුමාරගේ වත්ත (අක්කර 321) - අනවසර භුක්ති විඳීම් අවස්ථා ගණන - 175
- රහතුන්ගොඩ වත්ත (අක්කර 35) - අනවසර භුක්ති විඳීම් අවස්ථා ගණන - 35
- කන්දල්ඔය වත්ත (අක්කර 13) - අනවසර භුක්ති විඳීම් අවස්ථා ගණන - 146

මුල්හල් කැලේ වතු යාය වෙනුවෙන් 2010 සිට 2013 දක්වා රු 13,404,948/- ක වැටුප් වියදමක් දරා තිබුණද එහි කිසිදු ආදායමක් ජනනය නොවී ඇති බව නිරීක්ෂණය විය.

කන්දල්ඔය තේ කර්මාන්ත ශාලාව වසර 10 ක පමණ පෙර සිට වසා දමා ඇති අතර එම කාලය තුල ඒ වෙනුවෙන් යොදවා ඇති සේවකයන් 3 දෙනෙකු වෙනුවෙන් රු 7,742,280/- ක වැටුප් වියදමක් දරා තිබුණි.

<u>නිර්දේශ</u>

- අනවසර පදිංචිකරුවන් සඳහා ගතයුතු ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් ප්‍රතිපත්තිමය තීරණයක් ගෙන කාරක සභාව දැනුවත් කිරීම.

- කම්කරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, මුල් අයිතිකරුවන්ගේ අයිතිය ආරක්ෂා කර ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය වේ නම් අමාත්‍ය මණ්ඩල සංදේශයක් ආයතනයේ අරමුණු වලට හානි නොවන ලෙස ඉදිරිපත් කිරීම.
- වතු ආශ්‍රිතව පවත්නා අත්හරින ලද ඉඩම් ඒවායේ සිටින කම්කරුවන්ටම ලබා දී ලාභ ලබන තත්ත්වයට පත්කිරීමට ඇති හැකියාව සොයා බලා ඒ පිළිබඳ වාර්තාවක් මාස 2ක් තුළ කාරක සභාවට ලබා දීම.

3. <u>ආයතනයේ සේවක ගැටලු</u>

ආයතනයේ සේවකයන් බඳවා ගැනීමේ පටිපාටියක් නොමැති බව කාරක සභාවේ නිරීක්ෂණයට ලක්විය. ආයතනයට විවිධ අවස්ථාවන්හිදී විධිමත් ක්‍රමවේදයකින් තොරව අනුමත නොවූ තනතුරු සඳහා සුදුසුකම් නොලත් පුද්ගලයින් බඳවා ගැනීමට පියවර ගෙන ඇති බවද කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

ආයතනයේ සේවකයන්ගේ සේවක භාරකාර අරමුදල්, සේවක අර්ථසාධක අරමුදල් වසර ගණනාවකින් ගෙවා නොමැති බවත්, එසේ නොගෙවීම හේතුවෙන් විශාල අධි භාරයක් මහා භාණ්ඩාගාරයට ගෙවීමට සිදුවී ඇති බවද නිරීක්ෂණය විය. වසර 2011 සිට 2015 දක්වා ඒ සඳහා අධිභාර වියදම රු. 323,540,632/- ක් විය.

<u>නිර්දේශ</u>

- ආයතනයට බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර මාස 2 ක් තුල කාරක සභාවට ලබාදීම
- සුදුසුකම් නොලත් පුද්ගලයන් ආයතනයට බඳවා ගැනීම සිදු කර ඇත්තේ කෙසේද යන්නත් ඔවුන්ගේ නාම ලේඛනයක්ද ඇතුළුව කාරක සභාවට වාර්තාවක් ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම.</u>

2016 .05.12 දින වන තුරු එම වාර්තාව එවා නැත

4 **<u>ආයතනයේ මෙහෙයුම් අලාභය</u>**

2011	2012	2013	2014
රු.මි.258	රු.මි. 199	රු.මි. 501	රු.මි. 169

<u>නිර්දේශ</u>

අඩුපාඩුකම් මඟ හරවා ආයතනය ලාභ ලබන තත්වයට පත් කළ හැකි කෙටි කාලීන හා දීර්ඝ කාලීන ක්‍රමවේදයන්ද සමඟ පිළියෙල කරන ලද ප්‍රධාන සැලැස්මක්ද සහිතව නැවත කාරක සභාව ඉදිරියට කැඳවීම

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.13 දින ජනවසම සභාපති විසින් ආයතනයේ අහිතකර මූල්‍ය තත්වයට හේතු හා ඒවාට විසඳුම් වශයෙන් ගත හැකි පියවර සම්බන්ධයෙන් යෝජනා ඉදිරිපත් කරමින් වාර්තාවක් එවා ඇත. ඒ අනුව ආයතනයේ මුදල් ඉපැයීමේ හැකියාව දිගින් දිගටම පහල යාමට ප්‍රධාන හේතු වී ඇත්තේ ආයතනයේ වැඩිවන සේවක සංඛ්‍යාවට අනුව ව්‍යවස්ථාපිත දීමනා ගෙවීම් දිනෙන් දින ඉහල යාම (දැනට එහි සමුච්චිත අගය රු.බිලියන 1.5 කි), දීර්ඝ කාලයක් තිස්සේ තේ මිල පහල යාම, අධික සේවක සංඛ්‍යාව, සේවක වැටුප් දිනෙන් දින ඉහල යාම දක්වයි.

දීර්ඝ කාලයක් තිස්සේ සමුච්චිතව පවතින ව්‍යවස්ථාපිත දීමනා ගෙවා දැමීම සඳහා යෝජනාවක් ලෙස නො.175 වොක්ෂෝල් වීදියේ පවතින පර්චස් 254 ක ඉඩම දීර්ඝ කාලයකට බදු දීම මගින් රු. බිලියන 2.032 ක් පමණ උපයාගෙන එමගින් එම මුදල පියවා ගත හැකි බව සඳහන් කරයි. කෙසේ වුවද මෙම ඉඩම කොටස් 4 කින් සමන්විත වන බවත් ඉන් කොටස් 3 ක බදු ගිවිසුම් කාලය අවසන් වුවද බදුලාභියා ඉඩමින් ඉවත් නොවී නොයෙකුත් බලපෑම් මගින් අධිකරණයද නොමග යවමින් ඉඩමෙන් ඉවත් නොවී සිටීම මේ සඳහා බාධාවක්ව පවතින බව දක්වා ඇති අතර මෙම ගැටළුව නිරාකරණය කිරීම සඳහා කාරක සභාවේ සහයෝගය පතයි.

ජනවසම ආදායම ඉහළ නැංවීම සඳහා තේ වතු වලින් ආදායම් ලැබිය හැකි උපක්‍රමයන් ඉදිරිපත් කර ඇත. සේවක අතිරික්තය ස්වේච්ඡා වන්දි ක්‍රමයක් යටතේ ඉවත් කිරීම, ශක්තිමත් අභ්‍යන්තර පාලන ක්‍රමයක් ඇති කිරීම, පරිගණක ගත ගිණුම් ක්‍රමයක්, වත්කම් නඩත්තු කිරීම සඳහා නිවැරදි ලේඛන ඉදිරිපත් කිරීම ආදිය ඉහත යෝජනා ක්‍රියත්මක කරගෙන යන අතරතුර කළ හැකි බව දන්වා ඇත.

මෙම යෝජනා සඳහා කාරක සභාවේ අදහස්/නිර්දේශ ලබා දෙන ලෙස දන්වා ඇත.

5 <u>මණ්ඩලය සතු දේපල වල විස්තර යාවත්කාලීන කොට ලේඛන ගත කර නොතිබුණි</u>

<u>නිර්දේශය</u>

ආයතනය සතු සියලු දේපල වල විස්තර ඇතුලත් කර ලේඛන යාවත්කාලීන කළ යුතුය.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

දේපල ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි.

6 <u>සේවක අර්ථ සාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට ගෙවිය යුතු රු. මිලියන 323 ක් වන ව්‍යවස්ථාපිත වගකීම් නොගෙවීම</u>

<u>නිර්දේශ</u>

මෙම ව්‍යවස්ථාපිත වගකීම් පියවීම සඳහා නොපමාව ක්‍රියාමාර්ග ගත යුතු බව

<u>වර්තමාන තත්ත්වය</u>

ව්‍යවස්ථාපිත වගකීම් පියවා නොමැති අතර සුදුසු වැඩපිළිවලක්ද සකස් කර නොතිබුණි.

ඇමුණුම 07

බදු දේපල පිළිබඳ තොරතුරු
ජනතා වතු සංවර්ධන මණ්ඩලය

	ඉඩමේ නම	බදුකරුගේ නම	බදු මුදල රු.	බදු දී ඇති දිනය	වර්ග අඩියකට බදු කුලි මුදල රු.	බදු කාලය අවුරුදු	ඉඩමේ ප්‍රමාණය	බදු ගිවිසුම	බදු ගිවිසුම් අංකය	බදු දීමට පෙර ලබා ගත් තක්සේරු වාර්ථාව
1	අංක 175, වොක්ෂෝල් වීදිය ගොඩනැගිල්ල	අසෝක ග්ලාස් සමාගම	65,137.50	2003 ජූලි 19	10.42	25	වර්ග අඩි 4825 හා වර්ග අඩි 1425	ඇත		නැත
2	අංක 55/75, වොක්ෂෝල් මාවත	තුරුසවිය අරමුදල	94,920.00	2010 දෙසැම්බර් 01	40	1	වර්ග අඩි 2373	ඇත		නැත
3	අංක 55/75, වොක්ෂෝල් මාවත	කන්තලේ සීනි සමාගම	11,014.00	2009 සැප්තැම්බර් 01	20.24		වර්ග අඩි 544	නැත		නැත
4	අංක 55/75, වොක්ෂෝල් මාවත	රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව	1,000,000.00	2015 ජූලි 01	73.84	1	වර්ග අඩි 13542	නැත	නැත	නැත
5	අංක 175, වොක්ෂෝල් වීදිය ගොඩනැගිල්ල	නිලෝනා ලංකා හවුස්	105,000.00	2011 මාර්තු 10	22.89	30	වර්ග අඩි 4586	ඇත	3066	නැත
6	අංක 175, වොක්ෂෝල් වීදිය ගොඩනැගිල්ල	කැන්ඩි ටයර් හවුස්	159,660.00	2003 අප්‍රේල් 01	30	30	වර්ග අඩි 5322	ඇත	6952	නැත
7	අංක 175, වොක්ෂෝල් වීදිය ගොඩනැගිල්ල	මිස්ටර් පේන්ට් ලංකා සමාගම	150,000.00	2013 ජනවාරි 01	01.02	1	වර්ග අඩි 145952	ඇත		නැත
8	අංක 175, වොක්ෂෝල් වීදිය ගොඩනැගිල්ල	මිස්ටර් පේන්ට් ලංකා සමාගම	192,500.00	2014 ජනවාරි 01	178.40	1	වර්ග අඩි 1079	ඇත		නැත
9	අංක 320, ධාර්ලිපාර	මැග් කාර් කෙයාර් සෙන්ටර්	285,000.00	2015 ඔක්තොම්බර් 11	19.65	25	වර්ග අඩි 14500	ඇත	2078	නැත
10	අංක 320, ධාර්ලි පාර	නිවුසිලන්ඩ් කොලේජ්	390,433.00	2012 අගෝස්තු 01	13.49	30	වර්ග අඩි 28921	ඇත	2015	නැත
11	අංක 320, ධාර්ලි පාර	උසස් තාක්ෂණ ආයතනය	690,000.00	2012 අගෝස්තු 04	60	2	වර්ග අඩි 11500	ඇත	1030	නැත
12	අංක 320, ධාර්ලි පාර	ලේක්සයිඩ් ප්‍රොපටි ඩිවලොප්මන්ට්	15,520,512.00	2007 දෙසැම්බර් 18	93,497 (පර්චසය කට මුදල)	53	අක්කර 01 රූ.0 පර්. 6.6	ඇත	122	නැත

ශ්‍රී ලංකා මහ බැංකුව

විමර්ශනය සිදු කළ දිනය - 2016.02.25

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. **අසාර්ථක මූල්‍ය සමාගම් 06 කට ලබා දී තිබූ රු. මිලියන 6100 ක් වූ හිඟ ණය සහ ප්‍රතිමූල්‍ය පහසුකම් ඇවර කිරීමේ මුදලින් අය කර නොගැනීම**

1988-1994 කාල පරිච්ඡේදය තුලදී අසාර්ථක මූල්‍ය සමාගම් 06 කට ලබා දී තිබූ රු. මිලියන 6100 ක් වූ හිඟ ණය සහ ප්‍රතිමූල්‍ය පහසුකම් ලියා හැරීමට මුදල් මණ්ඩලය විසින් 2011.03.21 දින අනුමැතිය ලබා දී තිබුණි. ඈවර කරමින් තිබූ එම මූල්‍ය සමාගම් 06 හි ඈවර මුදලින් හිඟ ණය සහ ප්‍රතිමූල්‍ය පහසුකම් අය කර ගැනීමට මුදල් මණ්ඩලය තීරණය කර තිබුන ද මුළු ඈවර කිරීමේ මුදල් වූ රු. මිලියන 317.1 න් 2014 සැප්තැම්බර් අවසානය වන විට ලබා ගෙන තිබුනේ රු. මිලියන 18.4වැනි අඩු මුදල් ප්‍රමාණයකි.

හිඟ ණය කපා හැරීමෙන් පසුවද රු. මිලියන 18 ක් නැවත ලැබීම තුල එම කපා හැරීම් වටිනාකම් වල සහ එම තීරණවල ඇති අසාර්ථක බව පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය. එමෙන්ම එම මූල්‍ය සමාගම් වලින් තවදුරටත් හිඟ ණය අය කර ගැනීමට හැකියාව පවතින බැවින් ඒ සඳහා ක්‍රියා මාර්ග ගත යුතු බව කාරක සභාව විසින් පෙන්වා දෙන ලදි.

නිර්දේශ

හිඟ ණය කපා හැරීම, එම කපා හැරීම් වටිනාකම් ප්‍රමාණ, එම තීරණ වලට හේතු සහ එම ආයතන සම්බන්ධ විස්තර දක්වමින් සවිස්තර වාර්තාවක් මාසයක් තුළ කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ද ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදි.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

කාරක සභාව විසින් විමසන ලද තොරතුරු දත්ත සහ සංඛ්‍යාලේඛන සහිතව සවිස්තර වාර්තාවක් ලබා දී ඇත.

2. **මුදල් නීති පනතේ 117 වන වගන්තියට පටහැනිව යමින් ඇ. ඩොලර් මිලියන 6 ක් වැය කර නිව්යෝක් හි සහ රු. මිලියන 122 ක් වැය කොට බුසීලයේ ගොඩනැගිලි මිලදී ගැනීම සහ කුලියට දීම.**

මුදල් නීති පනතේ 117 වන වගන්තියට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් යම් හිමිකමක් පිළිබඳ තෘප්ත වීමේදී යම් ආකාරයකින් අත් කර ගත හැකි එවැනි අයිතියක් හැර වෙළඳාමක හෝ කිසිදු වාණිජමය, නිෂ්පාදනමය හෝ වෙනත් ව්‍යාපාරයක නොයෙදිය යුතු වුවත් ශ්‍රී ලංකා මහ බැංකුව ඊට පටහැනිව යමින් ඇ.ඩො. 6,207,116ක් වැය කොට නිව්යෝක් හි ගොඩනැගිල්ලක් මිලදී ගැනීම

සහ පසුව ඇ.ඩො. 68,000 කට කුලියට දීම, රු. මිලියන 122.81ක් වැය කොට බ්‍රසීලයේ දේපලක් මිලදී ගැනීම සහ පසුව කුලියට දීම.

මෙම ගනුදෙනු වලට වගකිව යුතු නිලධාරීන්ගේ ක්‍රියා කලාපයේ ඇති දුර්වලතා සහ අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා කිරීමකින් තොරව නැෂනල් මියුචුවල් ඇෂුවරන්ස් ගොඩනැගිල්ගේ 4 වන සහ 5 වන මහල් 2015 සහ 2016 වසර වලදී කුලියට දීම.

<u>නිර්දේශ</u>

මෙම ගනුදෙනු පිළිබඳව සහ මෙම මිලදී ගැනීම් සහ කුලියට දීම් සඳහා මුදල් මණ්ඩලයේ වගකිව යුතු නිලධාරීන්ගේ නාම ලේඛනය, මෙම තීරණයට හේතු වූ පදනම, මිලදී ගැනීමත් කුලියට දීමත් අතරතුර කාලයේදී මෙම ගොඩනැගිලි භාවිතා කළ අය කවුරුන්ද යන්න ගැන මෙන්ම ගනු ලබන ඉදිරි පියවර දක්වමින් සවිස්තර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි. වෙත නියෝග කරන ලදි.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

මේ සම්බන්ධව ලබා දී තිබෙන වාර්තාවට අනුව එවකට මුදල් මණ්ඩලය නීතිපති මතය අනුව මෙම ගනුදෙනු සඳහා අනුමැතිය ලබා දී ඇති බව දක්වා ඇති අතර මෙම තීරණයට හේතු වූ කරුණු පැහැදිළි කර ඇත. මෙම දේපළ මිලදී ගැනීමත් කුලියට දීමත් අතරතුර කාලයේදී මෙම ගොඩනැගිලි භාවිතා කළ අය පිළිබඳව විස්තර 2016.05.13 දින තෙක් ලබා දී නැත. මෙම ගනුදෙනු මුදල් නීති පනතේ 117 වන වගන්තියට පටහැනි බැවින් ඉතා ඉක්මනින් මෙම දේපළ බැහැර කිරීමට පියවර ගත යුතු බව ඉදිරි පියවර ලෙස එම වාර්තාවේ දැක්වේ.

3. <u>විදේශීය සේවා සපයන්නන් 3 දෙනෙකුට වසරක් සඳහා උපදේශක සේවා ගාස්තු රු. මිලියන 1,396 ක් ගෙවීම</u>

2014 වර්ෂය තුලදී උපදේශක සේවා ලබා ගැනීම වෙනුවෙන් විදේශීය සේවා සපයන්නන් තිදෙනෙකුට රු. 1,396,222,710/- වැනි විශාල මුදලක් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත ගෙවා තිබීම සහ මහා භාණ්ඩාගාරයේ හිමිකම් පෑමකින් තොරව එම මුදල මහ බැංකුවේ වියදමක් සේ සැලකීම යන කරුණු කාරක සභාවේ දැඩි ප්‍රශ්ණ කිරීමට ලක් විය. මෙම මුදල් ප්‍රමාණය එම වර්ෂය තුල දරන ලද මුළු උපදේශක සහ වෘත්තීය සේවා වියදමින් 68 % ක් වැනි ඉහළ අගයකි.

<u>නිර්දේශය</u>

උපදේශන ගාස්තු සහ පෙළඹවීම් සේවා වැනි වියදම් නිසි පරිදි අනුමත කිරීමකින් තොරව හිටපු මහ බැංකුවේ අධිපති විසින් ඍජුව ගන්නා ලද තීරණ මත සිදු කර

ඇති බව වත්මන් මහ බැංකුවේ අධිපති විසින් දන්වන ලද බැවින් එවකට කටයුතු කළ අධිපති සහ මුදල් මණ්ඩලය කාරක සභාවට කැඳවා මේ පිළිබඳව පැහැදිලි කර ගැනීම.

එමෙන්ම මෙම ගනුදෙනු වලට සම්බන්ධ සියලු ලේඛන සහිතව සවිස්තර වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස ප්‍ර.ග.නි. / ග.නි. වෙත නිර්දේශ කරන ලදි.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

ජනාධිපති කාර්යාලය කළ ලිඛිත තහවුරුවකින් අනතුරුව එකී විදේශීය සේවා සපයන්නන් හට ගෙවීම් කිරීම පමණක් මහ බැංකුව විසින් කළ බව ලබා දී ඇති වාර්තාවේ දැක්වේ. තහවුරු කරන ලද ලේඛන වාර්තාව සමග එවා ඇත.

4. <u>2013 වර්ෂයේදී රු. මිලියන 159.4 ක් වූ සේවකයන් විසින් ගෙවිය යුතු උපයන විට බදු, මහ බැංකු අරමුදලින් ගෙවීම</u>

2000/01/31 දිනැති රාජ්‍ය මුදල් චක්‍ර ලේඛ පීඑෆ්/පීඊ 06 ට පටහැනිව 2012 වර්ෂයේදී රු. මිලියන 128.03 ක් සහ 2013 වර්ෂයේදී රු. මිලියන 159.4 ක් සේවකයින් වෙනුවෙන් සහ 2012 වර්ෂයේදීද රු. මිලියන 10.91 ක් සහ 2013 වර්ෂයේදී රු. මිලියන 18.7ක් එහි විශ්‍රාමික සේවකයින් වෙනුවෙන් මහ බැංකු අරමුදලින් ගෙවීම යුක්ති සහගත නොවන බවත් මෙම ක්‍රියාව අනිකුත් ආයතන ද ආදර්ශයට ගන්නා බවත් කාරක සභාව පෙන්වා දෙන ලදි.

<u>නිර්දේශ</u>

ඊළඟ මුදල් මණ්ඩල රැස්වීමේදී මේ පිළිබඳව සාකච්ඡා කොට ඒ සම්බන්ධව ගන්නා ලද තීරණය පිළිබඳව කාරක සභාවට දැනුම් දීම.

සේවකයන් විසින් ගෙවිය යුතු උපයන විට බදු ආයතන මගින් දැරීම නොකළ යුතු බව දන්වමින් නැවතත් රාජ්‍ය ආයතන දැනුවත් කිරීමට කටයුතු යොදන ලෙස මුදල් අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වන ලදි.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

තමන් ගත් තීරණය නිවැරදි බවට හැඟවීමේ වාර්තාවක් ලබා දී ඇත.

කෙසේ වුවද කාරක සභාවේ නියමය පරිදි භාණ්ඩාගාරයේ ලේකම්, සේවකයන් විසින් ගෙවිය යුතු උපයන විට බදු ආයතන මගින් දැරීම නොකළ යුතු බව 2016.04.29 දින චක්‍ර ලේඛනයක් මගින් රාජ්‍ය ආයතන නැවතත් දැනුවත් කර ඇත.

සේවකයන් විසින් ගෙවිය යුතු උපයන විට බදු ආයතන මගින් දැරීම නොකළ යුතු බව භාණ්ඩාගාරයේ ලේකම් නියම කරන අවස්ථාවක මහ බැංකුව එම ක්‍රියා

මාර්ගය නිවැරදි බවට මතයක් දැරීම ගැටලු සහගත වන නිසා මේ පිළිබඳව ප්‍රතිපත්තිමය තීරණයක් පාර්ලිමේන්තුව විසින් ගත යුතුව ඇත.

5. මහ බැංකු බැඳුම්කර නිකුත් කිරීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2015 බැඳුම්කර නිකුතුව සම්බන්ධව 7 වන පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත විශේෂ අනු කාරක සභාවක් විසින් සලකා බලන ලද අතර ඒ පිළිබඳ අවසාන කෙටුම්පත් වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි විය. ඒ සම්බන්ධයෙන් 8 වන පාර්ලිමේන්තුව සඳහා පත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් නැවත සලකා බලා වාර්තාවක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට මෙදින කාරක සභාව විසින් තීරණය කරන ලදි.

6. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑත කාලයේදී සිදු කළ බැඳුම්කර නිකුතු පිළිබඳව වාර්තාවක් සැකසීම

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෑත කාලයේදී සිදු කළ බැඳුම්කර නිකුතු පිළිබඳව වාර්තාවක් පිළියෙල කිරීමට පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් කරන ලද නිර්දේශය අනුව එම වාර්තාව පිළියෙල කිරීමට අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන කටයුතු භාර විගණන අධිකාරිවරිය විසින් විගණකාධිපතිගේ විධානය අනුව කටයුතු කරන ලදී.

ඒ අනුව නිශ්චිත කාල සීමාවක් තුළ සිදුකළ බැඳුම්කර නිකුතු පිළිබඳව විස්තර සපයන ලෙසට ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරිවරයාගෙන් යොමු අංක BAF/H/GEN/2016/36 දරණ 2016 මැයි මස 11වන දිනැති ලිපියෙන් ඉල්ලා සිටියද අවශ්‍ය තොරතුරු අප වෙත ලබා නොදුන් හෙයින් එකී තොරතුරු නොපමාව ලබා නොදුනහොත් ඒ බව පාර්ලිමේන්තුව වෙත වාර්තා කිරීමට සිදුවන බව 2016 මැයි මස 25 වන දින ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති වෙත විගණකාධිපති විසින් දැනුම් දෙන ලදී.

බැඳුම්කර නිකුතු පිළිබඳව වාර්තාව පිළියෙල කිරීමට අප විසින් ඉල්ලා ඇති නිශ්චිත තොරතුරු ලිඛිතව ලබා දෙන මෙන් ඉල්ලා සිටියද 2016 ජූනි මස 02 වන දින රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරිවරයා විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විගණන අධිකාරිවරිය වෙත දන්වා ඇත්තේ ඉල්ලා ඇති පරිදි බැඳුම්කර නිකුතු පිළිබඳව නිශ්චිත දත්තයන් සුදුසු පරිදි ලබා ගැනීම සඳහා සිය දෙපාර්තමේන්තුවේ පොත්පත් පරීක්ෂා කිරීමට පහසුකම් සලසා දෙන ලෙසට ඔහුට මහ බැංකු කළමනාකරණයෙන් උපදෙස් ලැබී ඇති බවත් ඒ අනුව විගණන නිලධාරීන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව වෙත එවා පොත්පත් පරීක්ෂා කර අවශ්‍ය තොරතුරු ගන්නා ලෙසත්ය.

2016 ජූනි මස 03 වන දිනැති විගණකාධිපති අමතන ලද නියෝජ්‍ය මහ බැංකු අධිපති පී. සමරසිරි මහතා විසින් අත්සන් කරන ලද ලිපිය මගින් ද බැඳුම්කර

නිකුතු සම්බන්ධයෙන් අවශ්‍ය තොරතුරු ලබා ගැනීමට විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරින් ට පහසුකම් සලසා දී ඇති හෙයින් අවශ්‍ය නිශ්චිත දත්තයන් එකී පොත්පත් පරීක්ෂා කිරීමෙන් ලබා ගත හැකි බව දන්වා ඇත.

මේ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අප විසින් ඉල්ලා සිටින ලද තොරතුරු ලබාදීම සෘජුවම ප්‍රතික්ෂේප කර නොතිබුණද පහත සඳහන් කරුණු මත උක්ත වාර්තාව පිළියෙල කිරීමට නොහැකි විය හැකි බව/පිළියෙල කිරීම ප්‍රමාද විය හැකි බව විගණකාධිපති විසින් 2016.06.08 වන දිනැති ලිපිය මගින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති වෙත දන්වා ඇත.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතු සම්බන්ධයෙන් ඉතා විශාල ගනුදෙනු සංඛ්‍යාවක් සහ දත්ත සංඛ්‍යාවක් පරිගණක ජාලය තුළ පවතින බැවින් විගණකාධිපතිගේ නිලධාරින්ට අදාල නිශ්චිත දත්ත ලබා ගැනීමට එකී සියලුම දත්තයන් පරීක්ෂා කිරීමට සිදුවන බැවින් සහ ඒ සඳහා විෂයානුබද්ධ විශේෂඥ දැනුමක් අවශ්‍ය වන බැවිනුත් ක්ෂනිකව අදාළ තොරතුරු උපුටා ගැනීම ප්‍රායෝගිකව අපහසුවීම.

- ශ්‍රී ලංකා මහ බැංකුවේ බැඳුම්කර නිකුතු පිළිබඳව ඉල්ලා සිටින ලද නිශ්චිත දත්තයන් රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවෙන් මීට පෙර ඉල්ලා සිටින ලද අවස්ථාවලදී එකී තොරතුරු ඉතා සුලු කාලයක් තුළ ලබා දී තිබියදී මෙවර ඔවුන්ගේ පොත්පත් පරීක්ෂා කර බලා තොරතුරු උපුටා ගන්නා ලෙස දැනුම් දීම ප්‍රශ්නකාරී වීම.

- මහ බැංකුව විසින් මෙවර යෝජනා කර ඇති ක්‍රමවේදය අනුගමනය කර විශාල කාලයක්ද වැය කර අදාල තොරතුරු විගණකාධිපති දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් සොයා ගනු ලැබුවද ඒවායේ නිවැරදිභාවය පිළිබඳව නැවතත් මහ බැංකුව වෙතින් සනාථ කර ගත යුතු වීම හේතුවෙන් එකවරම මහ බැංකුව විසින් විගණකාධිපතිට අවශ්‍ය නිශ්චිත තොරතුරු සැපයීම වඩාත් කාර්යක්ෂමව හා නිවැරදිව උක්ත වාර්තාව පිළියෙල කිරීමට හේතු වන බව අවබෝධ වීම.

- තවද විගණන කටයුතු සඳහා සුදුසු පරිදි සකසන ලද නිශ්චිත තොරතුරු විගණකාධිපති වෙත ලබා නොදීම මගින් විගණකාධිපතිගේ ව්‍යවස්ථාපිත කටයුතු ඉටු කිරීම ප්‍රමාද වන අයුරින් වෙහෙසකර ක්‍රියාවලියකට විගණකාධිපතිගේ කාර්ය මණ්ඩලය පත් කිරීමට උත්සාහ කරමින් විගණකාධිපතිගේ විෂයය පථය සීමා කිරීමට පසුබිම සැකසීම.

ඉහත කරුණු සැලකිල්ලට ගෙන ඒ පිළිබඳව කරුණු විමසීම සඳහා 2016.06.08 වන දින මහ බැංකුවේ අධිපති ඇතුලු සියලුම වගකිව යුතු නිලධාරීන් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට කැඳවන ලදී. එහිදී සාක්ෂි දෙමින්, මහ බැංකුව මගින් සංවේදී තොරතුරු ලබා නොදීමටත් එවැනි තොරතුරු මහ බැංකුවට පැමිණ

ලබා ගැනීමේ එකඟතාවයක් වසර ගණනාවක සිට මහ බැංකුව සහ විගණකාධිපති දෙපාර්තමේන්තුව අතර පැවති බවත් නීතිපති විසින් ලබා දෙන ලද යොමු අංක E118/03/CIBS හා 2014.12.02 දිනැති ලිපියෙන් ඉදිරිපත් කරන ලද මතයද හේතු වූ බව නියෝජ්‍ය මහ බැංකු අධිපති පී. සමරසිරි මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

උක්ත ලිපියේ අඩංගු කරුණු සැලකිල්ලට ගත් කාරක සභාව, එමගින් විගණකාධිපතිට තොරතුරු ලබා දීම සීමා කරන ලෙස අර්ථ නිරූපනයක් කිසිසේත්ම කර නොමැති බව ප්‍රකාශ කරන ලදී.

මහ බැංකුව විසින් තම වගකීම පැහැර හැර ඇති බැවින් පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට අවශ්‍ය මහ බැංකු බැඳුම්කර නිකුතු සම්බන්ධ සියලු තොරතුරු විගණකාධිපති වෙත 2016.06.08 දින සිට සතියක් ඇතුළත (2016.06.15 දින හෝ ඊට පෙර) ලබා දෙන ලෙස මහ බැංකු අධිපති සහ ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් වෙත පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති විසින් නිර්දේශ කරන ලදී.

කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

විමර්ශනය සිදු කළ දිනය - 2016.02.26

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. රජයේ ආයතනයක කටයුතු කරමින් පුද්ගලික ආයතනයක හිමිකාරිත්වය දැරීම

කෘෂි රක්ෂණ මණ්ඩලයේ සභාපති පුද්ගලික රක්ෂණ සමාගමක 20% කොටස් හිමිකාරිත්වය දැරීම.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් ගොවිජන සංවර්ධන නිලධාරීන් යොදවා තෙවන පාර්ශව රක්ෂණ ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම මෙම ආයතනයේ මූලික අරමුණ වන ගොවීන්ව රක්ෂණය කිරීම, ඉක්මවා කටයුතු කිරීමකි.

නිර්දේශ

i. රජයේ ආයතනයක කටයුතු කරමින් පුද්ගලික ආයතනයක හිමිකාරිත්වය දැරීම ලබැදියා ගැටුම (Conflict of Interest) උද්ගත වන තත්වයක් නිසා ඒ සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම් මගින් කැබිනට් මණ්ඩලය දැනුවත් කිරීම.

ii. මෙම තත්වය ගැන කාරක සභාවේ ලේකම් විසින් උසස් නිලතල පිළිබඳ කාරක සභාව, ලිපියක් මගින් දැනුවත් කිරීම.

iii. ආයතනයේ සභාපති වෙනත් ආයතන සමග ඇති සියලුම මූල්‍යමය බැඳීම් සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

කාරක සභාවේ ලේකම් විසින් 2016.03.15 දිනැති ලිපිය මගින් උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ ලේකම් දැනුවත් කර ඇති අතර අනෙකුත් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ගෙන ඇති පියවර පිළිබඳව 2016.05.15 දින වන තෙක් ආයතනය විසින් කිසිදු දැනුම් දීමක් කර නැත.

2. ලිත් 500,000 ක් මුද්‍රණය කිරීම

2014 වර්ෂය තුල මණ්ඩලය රු.2,284,800/- ක් වැය කර ලිත් 500,000 ක් මුද්‍රණය කර ඇතත් 2015 පෙබරවාරි වන විටත් රු.985,900/- ක් වටිනා ලිත් 246,475 (50% ක්) පමණ බෙදා හැර නොතිබීම.

<u>**නිර්දේශ**</u>

i. ලිත් 500,000 ක් මුද්‍රණය කිරීම සඳහා ලබාගත් අධ්‍යක්ෂ මණ්ඩල තීරණයේ පිටපතක් ද සහිතව මෙම ගනුදෙනුව පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම (ලිතේ පිටපතක් සමග)

ii. මෙම ගනුදෙනුවට අදාල වගකිව යුතු නිලධාරින්ගෙන් සිදුවී ඇති පාඩුව අය කර ගැනීමට කටයුතු කිරීම

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාව මගින් දෙනු ලැබූ නියෝග සම්බන්ධයෙන් 2016.05.15 දින වන තෙක් ආයතනය නිසි පියවර ගෙන නොමැත.

3. <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

සේවය දීර්ඝ නොකිරීම සම්බන්ධයෙන් නිලධාරිනියක් විසින් මණ්ඩලයට එරෙහිව නඩුවක් පැවරීම සහ පරිපාලනයේ නොසැලකිලිමත් බව නිසා රු.225,000/-ක් බේරුම්කරණ ප්‍රදාන යටතේ ගෙවීම.

<u>**නිර්දේශ**</u>

i. අදාල නිලධාරින් වගකීමෙන් කටයුතු නොකිරීම සමබන්ධයෙන් පරීක්ෂා කර සම්පූර්ණ වාර්තාවක් මසක් තුළ කාරක සභාවට එවීම.

ii. වගකීම් පැහැර හැර ඇති නිලධාරින් සම්බන්ධයෙන් විනයානුකුල පියවර නොගැනීම සම්බන්ධයෙන් මාසයක් තුල සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට එවීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය ගෙන ඇති පියවර 2016.05.15 දින දක්වා කාරක සභාවට දැනුම් දී නැත.

4. <u>එකවර දීමනා දෙකක් ලබා ගැනීම</u>

රජයේ වැටුප් ලබන නිලධාරියෙකු වශයෙන් නියෝජ්‍ය සහකාර අධ්‍යක්ෂවරයෙකුට රක්ෂණ වාරිකයකින් කොමිස් මුදලක් ලබා ගැනීමේ ඇති හැකියාව.

නිර්දේශ

භාණ්ඩාගාරය විසින්, නිලධාරියෙකුට එකවර දීමනා දෙකක් ලබා ගැනීමේ ඇති හැකියාව පරීක්ෂා කර කාරක සභාවට වාර්තා කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

ආයතනය වෙනුවෙන් අදාල තනතුරට හිමි අනුමත වැටුප් හා දීමනා වලට අමතරව වෙනත් දීමනා ලබා ගත නොහැකි බව භාණ්ඩාගාරය වාර්තා කර ඇත.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය

විමර්ශනය සිදු කළ දිනය - 2016.03.08

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම හා ප්‍රසම්පාදන සැලසුම් නියමිත පරිදි ඉදිරිපත් නොකිරීම

2016 වසර සඳහා සංයුක්ත සැලැස්මක්ද, ක්‍රියාකාරී සැලැස්මකද, 2014,2015,2016 වසර සඳහා ප්‍රසම්පාදන සැලැසුම්ද ආයතනය විසින් පිළියෙල කර නොමැති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

ආයතනයේ වත්මන් පාලක මණ්ඩලය තේරී පත් වූයේ 2016 වසරේ ජනවාරි මස 03 වන දින බැවින් එම සැලසුම් ඉදිරිපත් කිරීමට නොහැකි වූ බවත් තමා ඇතුළු පාලක මණ්ඩලයට ඒ සඳහා යම් කාලයක් ලබා දෙන ලෙස සභාපති ඉල්ලා සිටින ලදී.

2. කාරක සභාව ඉදිරියට ශ්‍රී ලංකා ක්‍රිකට් කැඳවීමේ නෛතික හැකියාව

තම ආයතනය ක්‍රීඩා අමාත්‍යාංශයේ ලියාපදිංචි වී ඇතත් රාජ්‍ය සංස්ථාවක් නොවන බැවින් කාරක සභාව ඉදිරියට කැඳවීමට හැකි නෛතික හැකියාව පිළිබඳ ක්‍රිකට් ආයතනයේ සභාපති විසින් කාරක සභාවෙන් විමසා සිටින ලදී. පාර්ලිමේන්තු ස්ථාවර නියෝග 126 (2) යටතේ විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් වන ඕනෑම ආයතනයක් කාරක සභාව ඉදිරියට කැඳවීමටද 1993 අංක 43 ක්‍රීඩා (සංශෝධන) පනතෙහි 21අ.(3) වගන්තිය අනුව සෑම ක්‍රීඩා සංගමයකම ගිණුම් විගණකාධිපතිවරයාගේ විගණනයට යටත් වන බැවින්ද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148 වගන්තිය අනුව රාජ්‍ය මූල්‍ය බලය පාර්ලිමේන්තුව සතු වන බැවින්ද 19 වන සංශෝධනය මගින් පාර්ලිමේන්තුවට ලබා දී ඇති බලතල ප්‍රකාරවද ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය කාරක සභාව ඉදිරියට කැඳවීමට ඇති හැකියාව පෙන්වා දෙන ලදී.

නිර්දේශ

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයෙහි සභාපති විසින් ඕනෑම අවස්ථාවදී ක්‍රිකට් ආයතනය පිළිබඳ කාරක සභාව ඉදිරියේ පැහැදිලි කිරීමට සහභාගී වන බව ප්‍රකාශ කරන ලද අතර විගණකාධිපති විසින් නිරීක්ෂණය කරනු ලබන කරුණු ක්‍රීඩා අමාත්‍යාංශය හරහා පැහැදිලිව තම ආයතනයට ඉදිරිපත් කොට අමාත්‍යාංශය හරහා ඒවාට නිශ්චිත පිළිතුරු ලබා ගැනීම.

3. පූර්ව කාරක සභා තීරණ සහ තීන්දු නොසලකා හැරීම

2014.08.20 දින පැවති කාරක සභා රැස්වීමේදී පහත කරුණු කෙරෙහි අවධානය යොමු කර තිබූ අතර එහිදී දුන් උපදෙස් මේ දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.

- ප්‍රසම්පාදන ක්‍රියාවලියට අදාල වාර්තා ඉදිරිපත් කිරීම.
- ජාතික කණ්ඩායම වෙනුවෙන් හිටපු පුහුණුකරු සඳහා දරන ලද වියදම් සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතන වල යහපත් ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් කටයුතු කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව ප්‍ර.ග.නි/ග.නි විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග.

නිර්දේශ

ඉහත කරුණු ගැන වාර්තාවක් සතියක් ඇතුලත ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.25 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

2014.08.20 දින පැවති කාරක සභා රැස්වීම් වාර්තාවට 2016.03.03 දින පිළිතුරු එවීම පිළිබඳ කාරක සභාව තම අප්‍රසාදය පළ කළ අතර අතුරු පාලක මණ්ඩලය මගින් කාරක සභා වාර්තාව සඳහා ඉක්මන් ප්‍රතිචාර දැක්විය යුතුව තිබූ බව කාරක සභාව පෙන්වා දුන්නාය.

4. තරඟ විකාශන අයිතිය

ක්‍රිකට් ක්‍රීඩා තරඟ රූපවාහිනී විකාශන අයිතිය ප්‍රදානය කිරීම, තරඟ විකාශනය සඳහා රූපවාහිනී ආයතන තෝරා ගැනීමේ පදනම, ඒ සඳහා අත්සන් කරන ලද ගිවිසුම් හා ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිළිබඳ විස්තර, කාරක සභාවේ විශේෂ අවධානයට ලක් විය.

නිර්දේශ

එකී කරුණු සම්බන්ධයෙන් 2000 වසරේ සිට දත්ත ඇතුලත් සවිස්තර වාර්තාවක් මාස 2 ක් ඇතුලත කාරක සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වන ලදී.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.18 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

5. පැහැදිලි නොකල මූල්‍ය වෙනස්කම්

ශ්‍රී ලංකා ක්‍රිකට් මූල්‍ය ප්‍රකාශන අනුව, හම්බන්තොට සූරියවැව ක්‍රිකට් ක්‍රීඩාංගනය ඉදි කිරීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා වරාය අධිකාරියට හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවට ගෙවිය යුතු මුදල ලෙස පිළිවෙලින් රු. 2,187,280,006/- ක් හා රු. 567,601,808/-ක් සටහන්ව ඇති අතර එය ශ්‍රී ලංකා වරාය අධිකාරියේ හා ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන අනුව පිළිවලින් ශ්‍රී ලංකා ක්‍රිකට් වෙත ගෙවිය යුතු රු. 71,934,708/- ක් හා ශ්‍රී ලංකා ක්‍රිකට් වෙතින් ලැබිය යුතු රු. 1,133,826,034/- ක් ලෙස සටහන්ව ඇති බව කාරක සභාවේ අවධානයට ලක්විය.

<u>නිර්දේශ</u>

මෙම මූල්‍ය වෙනස්කම් පිළිබඳ පැහැදිලි කිරීමක් සහිත වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.18 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

6. <u>හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගනය</u>

හම්බන්තොට සූරියවැව ක්‍රීඩාංගනයට අදාල ගිණුම් වාර්තා නිවැරදි නොවන බව කාරක සභාව පෙන්වා දෙන අතර එම ක්‍රීඩාංගනය ක්‍රිකට් ආයතනයේ වත්කමක් ලෙස වත්කම් ලේඛනයේ ඇතුලත් නොවන බවද නිරීක්ෂණය කරන ලදී.

<u>නිර්දේශ</u>

අනෙකුත් අදාල අමාත්‍යාංශද සම්බන්ධීකරණය කරමින් මෙම ක්‍රීඩාංගනය ක්‍රිකට් ආයතනයේ වත්කම් ලේඛනයේ ඇතුළත් නොවීම පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස උපදෙස් දෙන ලදී.

7. <u>ආයතනයේ දුර්වල මූල්‍ය තත්වය සැලකිල්ලට නොගැනීම.</u>

2014 වසරේදී ආයතනය රු. මිලියන 393ක් පාඩු ලබද්දී සේවකයන් සඳහා උත්සව දීමනා ලබා දී ඇති බවද කොන්ත්‍රාත් සේවකයන්ට රු.5,000/- සිට රු.86,250/- ක් දක්වා වූ වැටුප් වර්ධකද දඟ පන්දු පුහුණු කරුවෙකුට 2013 වසරේදී රු.215,400/- ක වැටුප් වර්ධකයක් ලබා දී ඇති බවද කාරක සභාවේ අවධානයට ලක්විය.

<u>නිර්දේශ</u>

ක්‍රිකට් ආයතනය මගින් පසුගිය වසර 5 තුලදී මුදල් කුමන කරුණු වලට වැය කලේද යන්න පිළිබඳව වාර්තාවක් ලබා දීමට ක්‍රිකට් ආයතනයේ සභාපති එකඟ විය.

8. <u>ටිකට්පත් අළෙවිය</u>

2014 වසරේදී එක්දින තරඟ 13 ක් හා ටෙස්ට් තරඟ 4 ක් සඳහා රු. මිලියන 75 ක ටිකට්පත් විකුණා ඇති අතර ඉන් රු. මිලියන 45 ක ටිකට්පත් නොමිලේ ලබාදී ඇති බව කාරක සභාවේ අවධානයට ලක්විය.

9. <u>පෞද්ගලික නීති සේවා ලබා ගැනීම</u>

ක්‍රිකට් ආයතනයට මේ දක්වා නීති නිලධාරියකු අනුයුක්ත කර නොමැතිව පැවති බව කාරක සභාව නිරීක්ෂණය කරන ලදී.

ක්‍රිකට් ආයතනය විසින් නීතිපතිගේ සේවය ලබා ගත හැකිව තිබියදී පෞද්ගලික සේවා මගින් නීති උපදෙස් ලබා ගැනීම සඳහා විශාල පිරිවැයක් දරා ඇති බවද 2014 දී පමණක් පෞද්ගලික නීති සේවා සඳහා රු. මිලියන 18.2 ක් වැය කර ඇති බව කාරක සභාවේ නිරීක්ෂණයට ලක්විය.

<u>නිර්දේශ</u>

ක්‍රිකට් ආයතනය පසුගිය වසර 10ක කාලයක් තුල සම්බන්ධ වූ නඩු කටයුතු හා ඒ සඳහා වැය කර ඇති මුදල් පිළිබඳ වාර්තාවක් ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.03.18 දින අදාල වාර්තාව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර ඇති අතර ඒ අනුව පසුගිය දස වසරක කාලය තුල ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් නීති සේවා ලබා ගැනීම සඳහා පෞද්ගලික නීතිඥ සමාගම් වෙත පහත සඳහන් ආකාරයට රු. මිලියන 124.78ක මුදලක් ගෙවා ඇත.

අනු අංකය	වර්ෂය	නීති ගාස්තු සඳහා කරන ලද ගෙවීම් (රුපියල්)
1	2006	25,065,152
2	2007	5,365,909
3	2008	2,647,857
4	2009	13,738,857
5	2010	25,494,975
6	2011	2,663,042
7	2012	13,594,480
8	2013	21,614,000
9	2014	8,615,073
10	2015	5,978,950
එකතුව		124,777,995

10. බඳවා ගැනීම් පටිපාටිය හා උසස්වීම් පටිපාටිය

ආයතනයට සේවකයන් බඳවා ගැනීමේ පටිපාටිය හා සේවකයන්ට උසස්වීම් ලබා දීමේ පටිපාටිය කෙරෙහි ද කාරක සභාවේ අවධානය යොමු විය.

නිර්දේශ

ආයතනයේ බඳවා ගැනීම් හා උසස්වීම් පටිපාටිය පිළිබඳ වාර්තාවක් කාරක සභාවට ලබා දෙන ලෙස දැනුම් දෙන ලදී.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.18 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

පොදු නිරීක්ෂණ

- දීර්ඝ කාලයක සිට පැවත එන අනුග්‍රාහක ආදායම් අය කර ගැනීම සතුටුදායක නොවේ.
- තරඟාවලි සඳහා ගත් අත්තිකාරම් පියවීම් ක්‍රියාවලිය ශක්තිමත් කළ යුතුය.
- 2007 වර්ෂයේ සිට සේවක අර්ථසාධක අරමුදලට දායක මුදල් නිවැරදිව ප්‍රේශණය නොකිරීම හේතුවෙන් රු. මිලියන 7.6 ක අධිභාර ගෙවා තිබුණි.

තල් සංවර්ධන මණ්ඩලය

විමර්ශනය සිදු කළ දිනය - 2016.03.11

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. **බඳවාගැනීම් හා උසස්වීම්**

බඳවාගැනීම් හා උසස්වීම්, බඳවාගැනීමේ පටිපාටිය හා වැටුප් සහ සේවක සංඛ්‍යා කොමිසම විසින් අනුමත කරන ලද උසස්වීම් සැලකිල්ලට භාජනය නොකරමින් සිදු කිරීම.

නිර්දේශ

මාස දෙකක කාලයක් තුල පහත සඳහන් තොරතුරු ඇතුලත් වාර්තාවක් කාරක සභාව වෙත එවීම.

- බඳවා ගැනීමේ පටිපාටියෙහි දැක්වෙන සුදුසුකම් සපුරාලීමට අපොහොසත් සේවකයින්ගේ තොරතුරු
- ඔවුන්ගේ නම්
- බඳවාගන්නා අවස්ථාවේදී ඔවුන්ගේ ලිපිනයන්
- මෙම තත්ත්වය යථාවත් කිරීම සඳහා ආයතනය මගින් ගන්නා ක්‍රියා මාර්ග

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

මෙම නිර්දේශය ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය 2016.05.15 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොමැත.

2. බීජ පැල කිරීම

2015 වසර දක්වා බීජ පැල කිරීම සඳහා රුපියල් මිලියන 16.9 සිට රුපියල් මිලියන 25.39 දක්වා වැඩි වී තිබුනද කිසිදු ප්‍රගතියක් නොපෙන්වීම සහ ගරු.අග්‍රාමාත්‍යතුමා විසින්, කුරුණෑගල ප්‍රදේශයේ ඉදිකිරීමට යෝජිත ජීව වැටට අවශ්‍ය බීජ, මණ්ඩලයෙන් ඉල්ලීම.

නිර්දේශ

i. යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨය හා සම්බන්ධ ව බීජ පැලවීමේ විද්‍යාත්මක ක්‍රියාවලිය පිළිබඳව මාස 03 ක් තුල වාර්තාවක් එවීම සහ එම වාර්තාව ලබාගන්නා තෙක් බීජ මිලට ගැනීම නතර කිරීම.

ii. කාරක සභාවේ ලේකම් විසින් මෙම නිර්දේශය පිළිබඳව ගරු. අග්‍රාමාත්‍යතුමා දැනුවත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. 2016.04.10 දිනැති ලිපිය මගින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ,පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අදාල වාර්තාව සැපයීම සම්බන්ධයෙන් යාපනය විශ්ව විද්‍යාලයේ කෘෂිවිද්‍යා පීඨයේ පීඨාධිපතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

ii. 2016.03.28 දිනැති ලිපිය මගින් කාරක සභාවේ ලේකම් විසින් මෙම නිර්දේශය පිළිබඳව ගරු. අග්‍රාමාත්‍යතුමා දැනුවත් කර ඇත.

3. <u>ව්‍යාජ ලේඛන ඉදිරිපත් කිරීම</u>

ආයතනයේ නිලධාරීන් පිරිසක් විසින් ජීවිකා වැඩසටහන යටතේ කර්මාන්ත හා වාණිජ අමාත්‍යාංශයෙන් රුපියල් 595,108.00 ක වියදම් ප්‍රතිපූර්ණය කිරීම සඳහා වංචනික ලේඛන සකස් කිරීම.

<u>නිර්දේශ</u>

i. අමාත්‍යාංශයේ ලේකම් විසින් සතියක් ඇතුලත අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුව වෙත පැමිණිලි කිරීම.

ii.පැමිණිල්ලේ පිටපතක් කාරක සභාවට එවීම.

iii.ඉතිරි රුපියල් මිලියන 60 ට අදාල ලිපි ලේඛන සතියක් ඇතුලත විගණකාධිපතිට භාර දීම.

iv. පැමිණිල්ලේ පිටපතක් ලැබුන විගස මෙම කරුණ සම්බන්ධයෙන් සිදු කරන විමර්ශන කඩිනම් කරන ලෙස දන්වමින් කාරක සභාවේ ලේකම් විසින් පොලිස්පති වරයාගෙන් ඉල්ලීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

i. 2016.04.04 දිනැති ලිපිය මගින් බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත මේ සම්බන්ධයෙන් පැමිණිලි කර ඇත.

ii. 2016.04.04 දිනැති ලිපියේ පිටපතක් කාරක සභාවේ ලේකම් වෙත එවා ඇත.

iii.මේ සම්බන්ධයෙන් ආයතනය ගත් පියවර කාරක සභාවට වාර්තා වී නොමැත.

iii. කාරක සභාවේ ලේකම්ගේ 2016.04.04 දිනැති ලිපිය මගින් විමර්ශන කඩිනම් කරන ලෙස පොලිස්පතිවරයාගෙන් ඉල්ලීමක් කර ඇත.

4. උපබදු දී ඇති කොළඹ කාර්යාලය

මෙම කාර්යාලයේ බදුකරුවන්ගෙන් අයවිය යුතු රුපියල් 1,222,000/- මුදල කිසිදු පූර්ව අනුමැතියකින් තොරව ලියා හැර තිබීම.

නිර්දේශ

මේ සම්බන්ධයෙන් කුමන නීතිමය පියවරක් ගත්තේද යන්න දක්වමින් මාසයක් ඇතුලත කාරක සභාව දැනුවත් කිරීම

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

i. අයවිය යුතු මුදලින් රුපියල් 500,000/- ප්‍රමාණයක් දැනටමත් බදුකරුවන්ගෙන් අයකර ගෙන ඇති බවත් ඉතිරි මුදල අයකර ගැනීම සඳහා නීතිමය පියවර ගෙන ඇති බවත් තල් සංවර්ධන මණ්ඩලයේ සභාපතිගේ 2016.05.16 දිනැති ලිපිය මගින් කාරක සභාවේ ලේකම් වෙත දැනුම් දී ඇත.

බදු හිඟ මුදල 12 **X** 100,000/-	=	1,200,000/-
විදුලිය සහ ජලය	=	20,000/-
මුළු හිඟ මුදල	=	1,222,000/-
2013.11.12 දින ගෙවීම්	=	500,000/-
හිඟ මුදල	=	720,000/-

ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව

විමර්ශනය සිදු කළ දිනය - 2016.03.23

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. **කොමිසමට අයත් ඉඩම් සම්බන්ධ තොරතුරු යාවත්කාලීන නොවීම**

කොමිසමට අයත් ඉඩම් ලේඛනයක් සකස් කර එය යාවත්කාලීන කර පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබුනි.

නිර්දේශ

විශේෂ කාර්ය සාධක බලකායක් පිහිටුවා ඒ මගින් ආයතනයට අයත් ලක්ෂ 10 ක් පමණ වන ඉඩම්වල තොරතුරු එක්රැස් කර ලේඛණගත කිරීමට පියවර ගැනීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

නිර්දේශ ප්‍රකාරව කටයුතු කර නැත.

2. **බදු ගිවිසුම් වලට එළඹ නැති විශේෂ ව්‍යාපෘති**

i.මොණරකැලේවත්ත අක්කර 280 ක් විෂයභාර අමාත්‍යවරයාගේ අනුමැතියකින් තොරව 2011 පෙබරවාරි මාසයේදී පුද්ගලික සමාගමකට වසර 30 ට බද්දට දී ඇති අතර අත්තිකාරම් වශයෙන් රු.මිලියන 1 ක් ලබාදී ඇතත් 2011-2016 අතර කාලය සඳහා බදු මුදල් අය කර නොගැනීම.

ii.කුඹල්ගොඩ වතුයාය අක්කර 12 කින් අක්කර 6 ක් පුද්ගලික අපනයන බෝග ව්‍යාපෘතියක් සඳහා නීත්‍යානුකූල නොවන ලෙස බදු දීම.

iii.බදුල්ල දිස්ත්‍රික්කයේ ආකේඩියාවත්ත හෙක්ටයාර 2 ක් පමණ පුද්ගලික සමාගමකට බදු දීම. අයවිය යුතු හිඟ මුදල රුපියල් ලක්ෂ 10 ක් පමණ වන අතර සභාවේ අනුමැතියකින් තොරව ඉඩම ඇපයට තබා රුපියල් මිලියන 17.5 ක ණය මුදලක් ලබා ගැනීම සහ මේ සම්බන්ධයෙන් සභාව විසින් කිසිදු පියවරක් නොගැනීම.

iv.හෝමාගම, ලේලන්ඩ්වත්ත, කර්මාන්තපුරයේ අක්කර 6 ක් රොසෙල් බාත්වෙයා ලිමිටඩ් සමාගම වෙත වසර 50 කට බදු දීම සහ බදු මුදල් නිසි අයුරින් අය කර නොගැනීම.

<u>**නිර්දේශ**</u>

i.මෙසේ බදු ගිවිසුම් වලට නොඑළඹීමට හේතු සහ එයට වගකිවයුතු නිලධාරීන් පිළිබඳව විස්තර දක්වමින් සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

ii.පසු විපරමක් කර මේ ගැන සම්පූර්ණ වාර්තාවක් මාසයක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීම.

iii.මේ ආකාරයට බදුදීම, බදු ගිවිසුම් වලට නොඑළඹීම සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරින් ගැන අමාත්‍යාංශයත් කොමිෂන් සභාවත් එක්ව නිසි ක්‍රියාමාර්ග ගැනීම.

iv. භාණ්ඩාගාර අනුමැතිය සහ විගණකාධිපති අධීක්ෂණයද ඇතිව මෙවැනි තත්වයක් ඇති නොවන ආකාරයේ ක්‍රමවේදයක් සකස් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>
කාරක සභාව මගින් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 තෙක් අපොහොසත් වී ඇත.

3. <u>**රුපියල් මිලියන 200 ක් නොගෙවා පැහැර හැරීම**</u>

නඩුවක පාර්ශවකරුවෙකුට උසාවියකින් ගෙවීමට නියමිත වූ රු.මිලියන 200 ක මුදල නොගෙවා පැහැර හැරීම.

<u>**නිර්දේශ**</u>

මේ සම්බන්ධයෙන් කොමිෂන් සභාව ගත් පියවර ඇතුලත් සම්පූර්ණ වාර්තාවක් කාරක සභාවට ඉදිරිපත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය ගෙන ඇති පියවර 2016.05.15 දක්වා කාරක සභාවට දැනුම් දී නැත.

4. <u>**විවිධ කාර්යන් සඳහා ඉඩම් බදු දීම**</u>

පුත්තලම දිස්ත්‍රික්කයේ කුඹුටුකුලියවත්ත ඉඩමෙන් අක්කර 74 ක් ඉස්සන් වගාව සඳහා බදු පදනම මත ලබා දීම සහ හිඟ බදු මුදල් රු.6,525,000 ක් අය කර ගැනීමට පියවර නොගැනීම.

<u>නිර්දේශ</u>

මාසයක් ඇතුළත කොමිෂන් සභාව ලබා දුන් ඉඩම්වල ඔප්පු සම්බන්ධයෙන් වාර්තාවක් කාරක සභාවට එවීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

කාරක සභාව මගින් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 තෙක් අපොහොසත් වී ඇත.

ලංකා පුත්‍ර සංවර්ධන බැංකුව

විමර්ශනය සිදු කළ දිනය - 2016.03.23

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. **සාමාන්‍යයෙන් 6.4% ක් ව පැවතිය යුතු අක්‍රිය ණය අනුපාතය 39% ක් ව පැවතීම**

සහ මුදල් අමාත්‍යාංශය මගින් දී ඇති සීමාව රුපියල් මිලියන 20 ක් වශයෙන් දක්වා තිබියදී එම සීමාව ඉක්මවා ණය දීම

2012.02.23 දින පැවති කාරක සභාවේ දී ත් මෙම ආයතනයේ කාර්ය සාධනය වර්ධනය කර ගැනීමට උපදෙස් ලබා දී ඇතත් ඒ සම්බන්ධ මූල්‍ය දර්ශක අනුව බැංකුවේ කාර්ය සාධනය යහපත් තත්ත්වයක් පෙන්නුම් නොකරයි.

බැංකුවේ ප්‍රධාන අරමුණ වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇරඹීමට අරමුදල් සැපයීම පිළිබඳව නොසලකා මුළු වත්කම් වලින් 65% ක් ආයෝජන වලද 26% ක් පමණක් ණය හා අත්තිකාරම් වල යෙදවීම සහ පැවතිය යුතු අනුමත විශේෂිත බැංකු සාමාන්‍ය අනුපාතය වන 6.4% ඉක්මවා යමින් 2015.12.31 දිනට බැංකුවේ අක්‍රිය ණය අනුපාතය 39% ක් ලෙස පවත්වාගෙන යෑම එලෙස බැංකුවේ මෙහෙවර සහ අරමුණු වලට පටහැනි බව නිරීක්ෂණය විය. (රු.මිලියන 20 ට වැඩි අක්‍රිය ණය සහ හිඟ ණය ශේෂ සඳහන් ලේඛනයක් ඇමුණුම 08 වශයෙන් දක්වා ඇත.)

එසේම සුළු හා මධ්‍ය පරිමාණ ණයක් සඳහා මුදල් අමාත්‍යාංශය මගින් දී ඇති සීමාව රුපියල් මිලියන 20 ක් වශයෙන් දක්වා තිබියදී එම සීමාව ඉක්මවා ණය දීම බැංකුවේ කාර්ය සාධනයේ අයහපත් බව පෙන්නුම් කරයි.

නිර්දේශය

මහ බැංකුව මගින් සුළු හා මධ්‍ය පරිමාණ ණය සීමාව දන්වා ඇති ලේඛනය ෆැක්ස් මගින් කාරක සභාවට ලබා දීම.

රු.මිලියන 20 ඉක්මවා ණය ලබා දී ඇති පුද්ගලයින්ගේ නාම ලේඛනය මාසයක් ඇතුළත කාරක සභාවට ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

ණය සීමාව දැක්වෙන ලේඛනය ලබා දී ඇත.

රු.මිලියන 20 ඉක්මවා ණය ලබා දී ඇති පුද්ගලයින්ගේ නාම ලේඛනය ඇතුළත් වාර්තාව ද කාරක සභාවට ලබා දී ඇත. (එම ලේඛනය ඇමුණුම 09 වශයෙන් දක්වා ඇත)

2. <u>**ණය ලබා දීමේ දී අනුගමනය කළ යුතු නියමිත ක්‍රියා පිළිවෙත් අනුගමනය නොකිරීම**</u>

ණය ලබා දීමේ දී අනුගමනය කළ යුතු නියමිත ක්‍රියා පිළිවෙත් අනුගමනය නොකිරීම.

i. කලින් පැවති ණය අය කර ගැනීමේ තත්ත්වයේ වෙනසක් සිදු වී නොමැති අතර වර්තමානයේ ද ණය ලබා දීමේදී සෑහීමකට පත් විය නොහැකි ක්‍රමවේදයක් අනුගමනය කිරීම.

ii. ගණුදෙනුකරුවන් හට ණය ලබා දීමේදී එහි සභාපතිට අවශ්‍ය පරිදි අඩු පොළී අනුපාතිකයට ණය දීම.

iii. භාණ්ඩාගාර නියෝජිතයින් ඔවුන්ගේ භූමිකාව සම්බන්ධයෙන් කටයුතු කර ඇති ආකාරය ගැන සෑහීමකට පත් වීමට නොහැකි වීම.

<u>**නිර්දේශය**</u>

බෙටන්ස් පෞද්ගලික සමූහ සමාගමට ණය ලබා දීමේදී ඇගයීමට ලක් කරන ලද ව්‍යාපෘති වාර්තා සතියක් ඇතුළත කාරක සභාවට ලබා දීම.

අධ්‍යක්ෂ මණ්ඩලයට බැංකු කටයුතු පිළිබඳව මනා අවබෝධයක් ඇති නිලධාරියකු පත් කිරීම සුදුසු බව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නියෝජිත විසින් නිර්දේශ කරන ලදි.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

බෙටන්ස් පෞද්ගලික සමූහ සමාගම ට ණය ලබා දීමේදී ඇගයීමට ලක් කළ ව්‍යාපෘති වාර්තාවේ පිටපතක් කාරක සභාවට ලබා දෙන ලදි.

අධ්‍යක්ෂ මණ්ඩලයට නව නිලධාරියකු 2016.03.25 දින පත් කළ බව එවා ඇති පිළිතුරු වාර්තාවේ දැක්වේ. එම නිලධාරියා බැංකු කටයුතු පිළිබඳව මනා අවබෝධයක් ඇති නිලධාරියකු බව සනාථ කිරීමට කරුණු දක්වා නොතිබුණි.

3.<u>**2015/01/01 දින සිට 2016/03/03 දක්වා බැංකුවට බඳවාගත් නිලධාරීන් 64 දෙනා බඳවා ගැනීමේ ක්‍රමවේදයෙහි දුර්වලතා පැවතීම.**</u>

2015/01/01 දින සිට 2016/03/03 දක්වා බැංකුවට බඳවාගත් නිලධාරීන් 64 දෙනා බඳවා ගත් ක්‍රමවේදය පිළිබඳව කාරක සභාව ප්‍රශ්න කරන ලද අතර එහිදී අවම සුදුසුකම් සපුරා නොමැති වීම, අධ්‍යාපන සහ වෙනත් සහතික ඉදිරිපත් නොකිරීම, නිර්දේශක පත්‍ර සම්පූර්ණ නොවීම, පත්වීම් බලධරියා ලෙස සාමාන්‍යාධිකාරී

විසින් අත්සන් කර ලබා දිය යුතු පත්වීම් ලිපි සභාපති විසින් අත්සන කර ලබා දීම වැනි ආයතනයේ බඳවා ගැනීමේ ක්‍රමවේදයෙහි දුර්වලතා නිරීක්ෂණය විය.

බැංකුවේ සාමන්‍යාධිකාරී විසින් අඩුපාඩු වැලැක්වීමට කටයුතු කළ ආකාරය කිසිසේත්ම ප්‍රමාණවත් නොමැති වීම සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් සහ නීති උපදේශක තනතුර පිරවීමේදී සහ කලින් සේවය කළ නීති උපදේශක මාරු කර යැවීමේදී අනුගමනය කර ඇති ක්‍රියා මාර්ග නිවැරදි නොවීම පිළිබඳව කාරක සභාවේ අවධානය යොමු විය.

ආයතනයේ බඳවා ගැනීම් කාර්ය පටිපාටිය සහ බඳවා ගැනීම් සම්බන්ධව උපදෙස් ලබා දීමේදීත් සාමන්‍යාධිකාරී විසින් වගකීම් පැහැර ඇති බවට විශේෂ සඳහනක් කළ කාරක සභාව**,** ආයතනයේ බඳවා ගැනීමේ කටයුතු වලදී සභාපතිවරයා කටයුතු කර ඇති ආකාරය නොගැලපෙන බවද ප්‍රකාශ කරන ලද අතර ප්‍ර.ග.නි./ග.නි. වෙත පහත සඳහන් **<u>නිර්දේශ</u>** කරන ලදි.

1. 2015/01/01 දින සිට 2016/03/03 දින දක්වා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල වාර්තා ලබා දීම.
2. එමෙන්ම මෙම නිලධාරීන් 64 දෙනා බඳවා ගැනීම සම්බන්ධව අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් කොට විධිමත් වාර්තාවක් ලබා දීම. එහිදී මෙම බඳවා ගැනීම් කාර්ය පටිපාටියට අනුකූලව කර තිබේද**?**, අධ්‍යාපන සුදුසුකම් අදාල තනතුරුවලට ගැලපේද**?**, පත්වීම් සඳහා අනුමැතිය විධිමත් ලෙස ලබා දී තිබේද**?**, වැරදි ක්‍රමවේදයක් අනුගමනය කර ඇත්නම් ඒවා නිවැරදි කිරීමට ගැනීමට බලාපොරොත්තු වන පියවර මොනවාද? යන කරුණු ඇතුළත් කිරීම.
3. සුදුසුකම් සහිත නීති නිලධාරියෙකු සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වරයෙක් ස්ථිර පදනමින් බඳවා ගැනීම.
4. එමෙන්ම හිටපු නීති නිලධාරී මාරු කර යැවීම සාධාරණ හේතු මත සිදුව ඇත්දැයි සොයා බැලීමට අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් කොට සොයා බැලීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

1. 2015/01/01 දින සිට 2016/03/03 දින දක්වා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වල වාර්තා කාරක සභාවට ලබා දී ඇත.
2. එමෙන්ම මෙම නිලධාරීන් 64 දෙනා බඳවා ගැනීම සම්බන්ධව බැංකුවේ සභාපති විසින් වාර්තාවක් ලබා දි ඇති අතර අමාත්‍යාංශ මට්ටමින් කරන ලද පරීක්ෂණයක විධිමත් වාර්තාවක් 2015.05.13 දින තෙක් ලබා දී නොමැත.
3. සුදුසුකම් සහිත නීති නිලධාරියෙකු සහ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් වරයෙක් ස්ථිර පදනමින් බඳවා ගැනීමට පියවර ගන්නා බව ග.නි. දන්වා ඇත.

4. එමෙන්ම හිටපු නීති නිලධාරී මාරු කර යැවීම සම්බන්ධව බැංකුවේ සභාපති විසින් වාර්තාවක් එවා ඇත. අමාත්‍යාංශ මට්ටමින් සිදු කරන පරීක්ෂණයේ වාර්තාව 2015.05.11 දින තෙක් ලබා දී නොමැත.

ඇමුණුම 08

Customer Wise Loans over Rs. 20 Mn

SysCustID	Customer	Approved Amt	No of Loans	Loan Balance
36189	BETTANS GROUP OF COMPANY PVT LTD.	470,091,170.96	5	-220,000,000.00
19175	TRI STAR APP. EXPORTS (PVT)LTD	288,117,137.54	163	0.00
19476	SASIRI POLYSACKS(PVT)LTD.	277,550,000.00	4	0.00
38018	SASIRI POLYSACKS PRIVATE LIMITED	211,333,700.00	2	0.00
48887	GAMINI GEM AND JEWELLERY PVT LTD	200,000,000.00	1	-7,500,000.00
37545	H.V.A.LANAKA EXPORTS PRIVATE LIMITED	130,000,000.00	1	0.00
34304	NAWALOKA POLYSACKS LIMITED	129,000,000.00	4	0.00
19709	MIHIN LANKA (PVT) LTD	106,094,692.06	3	0.00
37546	SEEDS GTE LTD.	100,000,000.00	5	0.00
37560	H. DON CAROLIS AND SONS LIMITED	75,000,000.00	3	0.00
40009	EKSATH DEEWARA UDANA THRIFT & CREDIT CO-C	75,000,000.00	1	-71,250,000.00
38023	TISSA WAWU HOTEL PRIVATE LIMITED	72,773,154.36	4	0.00
55834	S.M.N.B.MAWALAGEDARA	70,000,000.00	8	-30,000,000.00
38508	SHARP GRAPHIC HOUSE PRIVATE LIMITED	67,291,342.35	34	-16,002,900.00
58492	T.R.MAPATUNA	66,349,650.00	8	-62,397,600.00
33999	S.C.ROOPASINGHA	65,000,000.00	7	-20,000,000.00
77055	A.A.SAMARAWICKRAMA	65,000,000.00	2	-34,000,000.00
35606	CEYLON CHOCOLATES LTD	62,036,000.00	4	-2,038,834.65
32669	R.S.THUMBOWILA	62,000,000.00	10	-17,899,920.00
36342	H.G.U.K.R.KALUGALLA	61,000,000.00	6	0.00
26251	K.A.G.KUMARASINGHE	60,000,000.00	4	-30,000,000.00
45413	LANKA SALU SALA LIMITED	58,500,000.00	6	0.00
40023	AVE MARIA HOSPITALS PRIVATE LIMITED	57,000,000.00	2	0.00
39275	V S TURBO PRIVATE LIMITED	55,000,000.00	2	0.00
26249	J.M.P.N.K.JAYALATH	54,500,000.00	5	-15,000,000.00
56328	R.M.J.KUMARASIRI	51,000,000.00	3	-17,000,000.00
34805	NATURES BEAUTY CREATIONS LTD	50,000,000.00	1	-17,501,300.00
38658	ORIENT FINANCIAL SERVICES CORPORATION LTD.	50,000,000.00	1	0.00
38680	SOFTLOGIC FINANCE PLC	50,000,000.00	1	0.00
38539	FAMILY CARE HOSPITAL PVT LTD	49,592,000.00	2	0.00
37698	U.D.SOMARATHNE	48,800,000.00	6	-15,000,000.00
35780	NANDANA AUTOPRODUCTS CO.PVT LTD	47,694,327.88	20	-34,139,240.73
37520	CRESCENT BUTTON MANUFACTURING PVT LTD	43,173,476.25	7	-37,527,713.73
39898	CHILAW CITY HOTEL	42,328,650.00	4	0.00
35461	JF & I PACKAGING(PRIVATE) LIMITED	40,000,000.00	2	0.00
39270	S S S GLASS COMPANY PRIVATE LIMITED	40,000,000.00	1	0.00
55891	J.A.D.G.JAYASINGHE	40,000,000.00	8	-20,000,000.00
70119	U.A.D.GUNASEKARA	40,000,000.00	1	-15,000,000.00
32892	SENANAYAKA HAAL MOLA SAHA CATERS	39,861,090.00	8	-10,061,090.00
30884	NAVEEN RICE MILL	39,700,000.00	4	-13,000,000.00
39282	AMANO CONSTRUCTION PRIVATE LIMITED	38,500,000.00	3	-15,000,500.00
30944	P.G.MARTIN INDUSTRIES PVT LTD	38,185,000.00	4	0.00
36808	EDB	30,125,000.00	1	0.00
31663	ENEX AGENCIES PVT LTD.	30,000,000.00	2	0.00
32276	SUWASEWANA HOSPITALS PVT LIMITED	30,000,000.00	1	0.00
38834	C.I.C.AGRI PRODUCE EXPORT PRIVATE LIMITED	30,000,000.00	1	0.00
38912	LIHINI STEEL PRIVATE LIMITED	30,000,000.00	2	0.00
40022	MCLARENS HOTELS LIMITED	30,000,000.00	1	0.00
56326	R.L.S.KUMARASIRI	30,000,000.00	3	-5,000,000.00
56419	A.M.S.H.ADIKARI	30,000,000.00	3	-3,600,000.00
56600	L.W.R.S.KUMARA	30,000,000.00	3	-5,300,000.00
41240	P.K.GUNASENA	29,583,200.00	5	-7,290,800.00

Page 1, Customer Wise

Outstanding facilities above Rs.20.0Mn granted for the period from the year 2006 to date.

NO	Name of the client	Amount Approved	Date of Disbursement	Capital Outstanding	Balance to be disbursed	Status
1	M/s BETTANS GROUP OF COMPANY PVT LTD.	300,000,000.00	25/10/2006	220,000,000.00		Non Performing
2	M/S CEYLON CHOCOLATES LTD	20,000,000.00	25/04/2012	2,038,834.65		Performing
3	M/s CIC SEEDS PRIVATE LIMITED	25,000,000.00	25/10/2012	10,415,500.00		Performing
4	M/s CRESCENT BUTTON MANUFACTURING PVT LT	40,000,000.00	17/12/2007	37,500,000.00		Non Performing
5	M/s EKSATH DEEWARA UDANA THRIFT & CREDIT	75,000,000.00	22/11/2007	71,250,000.00		Non Performing
6	M/s F.K.I COMPANY LANKA PRIVATE LTD.	20,000,000.00	25/02/2016	12,000,000.00	8,000,000.00	Performing
7	M/S NATURES BEAUTY CREATIONS LTD	50,000,000.00	28/12/2012	17,501,300.00		Performing
8	M/S NANDANA AUTO PRODUCTS / N M WATER	76,700,000.00	06/12/2008	63,300,000.00		Non Performing
9	M/s SARAA OS LEATHER PRIVATE LIMITED	25,000,000.00	25/04/2007	25,000,000.00		Non Performing
10	M/s SEEMASAHITHA JANATHA HIRIYALA GOVIJA	26,230,000.00	25/09/2007	26,160,000.00		Non Performing
11	MR. A.A.SAMARAWICKRAMA	65,000,000.00	25/02/2016	34,000,000.00	31,000,000.00	Performing
12	MR. T.R.MAPATUNA	70,000,000.00	28/10/2014	62,400,000.00		Non Performing
13	MR. U.A.D.GUNASEKARA	40,000,000.00	25/03/2016	15,000,000.00	25,000,000.00	Performing
14	RAJJURUWATTA TEAS(PVT)LTD	20,000,000.00	25/07/2014	14,734,100.00		Performing
15	TORANA MUSICS	25,000,000.00	25/08/2006	20,736,562.00		Non Performing
16	K.A.G.KUMARASINGHE	30,000,000.00	31/12/2015	30,000,000.00		Performing
17	GAMINI GEM AND JEWELLERY PVT LTD	200,000,000.00	29/03/2016	7,500,000.00	192,500,000.00	Performing
18	H.M.D.B.MAWILMADA	20,000,000.00	20/08/2014	16,256,000.00		Performing
19	KOONGAHAWATTA TEA FACTORY	20,000,000.00	25/04/2009	1,498,300.00		Performing
20	S.C.ROOPASINGHA	20,000,000.00	11/20/2015	20,000,000.00		Performing
21	S.M.N.B.MAWALAGEDARA	30,000,000.00	01/14/2016	30,000,000.00		Performing
22	AMANO CONSTRUCTIONS (PVT) LTD	20,000,000.00	25/05/2014	14,667,200.00		Performing
23	J.A.D.G.JAYASINGHE	20,000,000.00	15/10/2015	20,000,000.00		Performing
24	U.D.SOMARATHNE	20,000,000.00	21/07/2015	15,000,000.00		Performing

ඇමුණුම 09

Customer Wise

19318	LIPI LANKA ENTERPRISES	29,500,000.00	4	0.00
38705	MACBERTAN LIMITED	28,300,000.00	1	0.00
37567	ELLAWALA RUBBER PVT LTD	27,500,000.00	4	-9,666,666.00
39276	SEEMASAHITHA JANATHA HIRIYALA GOVIJANA SAI	26,844,800.00	4	-26,162,250.31
35515	VENORA INTERNATIONAL PROJECTS PVT LTD	25,393,495.61	10	0.00
28717	SUPERBA HYDRO PVT LTD	25,000,000.00	1	0.00
37524	SARAA OS LEATHER PRIVATE LIMITED	25,000,000.00	1	-25,000,000.00
37576	TORANA MUSIC DISTRIBUTORS PVT LTD	25,000,000.00	2	-20,736,562.00
38556	RODRIGO AGGREGATES	25,000,000.00	1	0.00
38591	SOLAR GREEN PLANTATIONS GROUP PRIVATE LIM	25,000,000.00	1	0.00
39261	LAUGFS ECO SRI PRIVATE LIMITED	25,000,000.00	1	0.00
42775	CIC SEEDS PRIVATE LIMITED	25,000,000.00	1	-10,415,500.00
54811	KISHANI INDUSTRIES PRIVATE LIMITED	24,142,814.00	14	-14,073,000.00
56491	R.H.M.T.RAJAKARUNA	24,000,000.00	2	-8,200,000.00
31775	WINNERS LANKA PRIVATE LIMITED	23,000,000.00	7	0.00
42459	JAYAWICKRAMA RICE PRIVATE LIMITED	21,333,600.00	2	0.00
32654	LAUGFS SALT AND CHEMICALS LTD.	20,833,700.00	2	0.00
43506	M.K.JAYAWATHI	20,000,000.00	2	-9,345,550.00
43837	OREL M F G PRIVATE LIMITED	20,000,000.00	1	0.00
46405	J.RATHNASINGHE	20,000,000.00	1	0.00
48182	K.MAHINDARATHNA	20,000,000.00	2	0.00
49104	PAIVAS CITY HOTEL PVT LTD	20,000,000.00	1	0.00
54800	LIPI LANKA ENTERPRISES	20,000,000.00	2	-10,000,000.00
55091	RAJJURUWATTE TEAS PVT LIMITED	20,000,000.00	2	-14,734,100.00
56598	D.DUSHANTHA	20,000,000.00	2	0.00
70179	F.K.I COMPANY LANKA PRIVATE LTD.	20,000,000.00	1	-12,000,000.00

ජාතික චිත්‍රපට සංස්ථාව

විමර්ශනය සිදු කළ දිනය : 2016.03.24

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. අධ්‍යක්ෂ මණ්ඩලය ක්‍රමාණුකූලව පත් නොකිරීම

අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා නිල බලයෙන් පත් විය යුතු, ගුවන් විදුලි සංස්ථාවේ අධ්‍යක්ෂ ජනරාල් සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් මෙතෙක් අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා පත් කර නොතිබීම සහ පනතේ 7 (ආ) (1) වගන්තිය අනුව යටත් පිරිසෙයින් දෙදෙනෙකුවත් විශ්ව විද්‍යාල නියෝජනය කළ යුතු අතර එම නියෝජනය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වෛද්‍යවරයෙකු පමණක් පත් කර තිබීම. චිත්‍රපට කර්මාන්තයට අදාල අයෙකු අධ්‍යක්ෂ මණ්ඩලය නියෝජනය නොකිරීම.

නිර්දේශ

අධ්‍යක්ෂ මණ්ඩලය සහ ඔවුන්ගේ සුදුසුකම් පිළිබඳ සවිස්තර වාර්තාවක් මසක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.16 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

2. භාණ්ඩාගාර ප්‍රතිපාදන යළි භාණ්ඩාගාරයට, භාණ්ඩාගාර බිල්පත් හරහා ආයෝජනය නිසා සිදුවූ අපැහැදිලි මූල්‍ය විශ්ලේෂණය

2014 වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශනවල කෙටිකාලීන ආයෝජන ලෙස රු.181,279,365/-ක් ද දිගු කාලීන ආයෝජන ලෙස රු. 127,000/- ක්ද වශයෙන් සඳහන් කර තිබීම.

මූල්‍ය විශ්ලේෂණය	2010	2011	2012	2013	2014
දිගු කාලීන ආයෝජන (රුපියල්)	127,000	127,000	127,000	127,000	127,000
කෙටි කාලීන ආයෝජන (රුපියල්)	82,851,875	97,737,181	105,56,896	124,798,484	181,279,365

<u>නිර්දේශ</u>

කෙටි කාලීන ආයෝජන, දිගු කාලීන ආයෝජන, විකුණුම් සහ වෙනත් ආදායම් යනු මොනවාද යන්න පිළිබඳ සවිස්තර වාර්තාවක් කාරක සභාව වෙත සහ විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම සහ භාණ්ඩාරයෙන් ලබා දෙන මුදල් භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීමට ලබා දී ඇති කැබිනට් අනුමැතියට අදාල ලිපි ලේඛන සතියක් ඇතුළත කාරක සභාව වෙත ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.16 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. <u>වසා දමා තිබූ සිනමා ශාලා සඳහා ලබා දුන් ණය අය කර නොගැනීම</u>

2001 වර්ෂයට කලින් වසා දමා ඇති සිනමා ශාලා 146 සඳහා ලබා දී තිබූ රු. 7,913,163/- හිඟ ණය ශේෂ අය කර ගැනීමේ කටයුතු සඳහා කමිටුවක් පත්කර එහි වාර්තාව හා ණය ලබා දී ඇති සිනමා ශාලා පිළිබඳ විස්තරයක් කාරක සභාව වෙත ඉදිරිපත් නොකිරීම.

<u>නිර්දේශ</u>

චිත්‍රපට සඳහා ගෙවන ලද මුදල් ප්‍රමාණය, යළි නොලැබුනු මුදල් ප්‍රමාණය, අය කර ගැනීමට නොහැකි වීමේ හේතු, ණයකරුවන්ගේ නාම ලේඛනයක්,වසා දමා ඇති සිනමාහල් පිළිබඳ නාම ලේඛනයක් සතියක කාලයක් තුළ කාරක සභාවට ඉදිරිපත් කිරීමට කටයුතු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.16 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර නොතිබුණි.

4. සිනමාශාලා නවීකරණය කිරීම (Digitalization)

<u>නිර්දේශ</u>

මේ පිළිබඳව පෞද්ගලික අංශය සම්බන්ධ කරගෙන වැඩ පිළිවෙලක් සැකසීම ආරම්භ කිරීම සහ එහි ප්‍රගතිය ගැන වාර්තාවක් ඉදිරිපත් කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.11 දින වන විටත් මේ සඳහා වැඩ පිළිවෙලක් ආරම්භ කලේද නැත්ද යන්න පිළිබඳ පොදු ව්‍යාපාර කාරක සභාව දැනුවත් කර නොමැත.

<u>පොදු ව්‍යාපාර කාරක සභාව විසින් අවධානයට යොමු කළ යෝජනා</u>

- අවශ්‍ය කාර්ය සාධනයක් ඇගයීමට තරම් වාර්තා, තොරතුරු ලේඛන විගණකාධිපති වෙත සහ පොදු ව්‍යාපාර දෙපාර්තමේන්තුවට ඉදිරිපත් නොකිරීමේ දුර්වලතා මගහැර ගෙන එම තොරතුරු නොපමාව ඔවුන් වෙත ලබාදීම.

- අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීම.

- ජාතික රූපවාහිනිය වැනි රාජ්‍ය සංස්ථාවන්හි සම්බන්ධීකරණය යටතේ අතීතයේ ක්‍රියාත්මක වූ ආකාරයෙන්ම චිත්‍රපට පෙන්වීම සඳහා සිකුරාදා, සෙනසුරාදා වැනි දිනයන් වෙන්කර ගෙන අර්ථවත් චිත්‍රපට ප්‍රදර්ශනය කිරීම.

- ජාතික චිත්‍රපට සංස්ථා පනත සංශෝධනය කිරීම සහ සංස්ථාවේ කටයුතු කිරීමේ බාධාවන් ඉවත් කිරීමට හැකි ඉක්මනින් කටයුතු කිරීම.

- කොන්ත්‍රාත් පදනමෙන් බඳවා ගැනීම් සඳහා නිසි අනුමැතිය ලබා ගැනීම.

- ප්‍රවාහන පහසුකම් හිමිකමක් නොමැති නීති නිලධාරීන් දෙදෙනෙකුට දෙනු ලබන ප්‍රවාහන පහසුකම් සඳහා නිසි අනුමැතිය ලබා ගැනීම.

සී/ස ඇල්කඩුව වැවිලි සමාගම

විමර්ශනය සිදු කළ දිනය-2016.04.06

හඳුනාගත් ප්‍රධාන ගැටලු

සී/ස ඇල්කඩුව වැවිලි සමාගම 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස ස්ථාපනය කර ඇති අතර 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කර ඇත.සමාගම සතු මුළු භූමි ප්‍රමාණය හෙක්ටයාර 4053 ක් වන අතර එයින් වගාකර ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර 1492 කි.

1 **නෙල්ලඔල්ල වත්ත බදු දීම**

i.හෙක්ටයාර් 358 ක් පමණ වන නෙල්ලඔල්ල වත්තේ හෙක්ටයාර් 125 ක් ඇග්‍රි ස්කොඩ් (**Agri Squad**) සමාගමට බදු දීම සහ ඉතිරි කොටස ප්‍රදේශවාසීන් විසින් බලෙන් අත්පත් කර ගැනිම.

ii. ඇග්‍රි ස්කොඩ් හි අතුරු බදුකරු වශයෙන් පුද්ගලයෙකු අනවසරයෙන් වත්ත භුක්ති විදීම

නිර්දේශ-

i.බදු ගිවිසුමට අදාලව කටයුතු කර නොමැති නම් අදාල සමාගමට එරෙහිව පියවර ගැනීම.

ii.නීති විරෝධී ලෙස යම් අයෙක් මෙම වත්තේ කටයුතු කරයි නම් ඔවුනට එරෙහිව පියවර ගැනීම.

iii.ඉඩම් බලෙන් අත්පත් කර ගෙන ඇති අය සම්බන්ධයෙන් අමාත්‍යාංශ මට්ටමින් පරීක්ෂණයක් කර වාර්තාවක් ඉදිරිපත් කිරීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

කාරක සභාව මගින් දෙනු ලැබූ නියෝග ක්‍රියාත්මක කිරීම කඩිනම් කරන ලෙස දන්වමින් අමාත්‍යාංශයේ ලේකම් විසින් සී/ස ඇල්කඩුව වැවිලි සමාගමේ සභාපති වෙත යවන ලද 2016.05.19 දිනැති ලිපියේ පිටපතක් කාරක සභාව වෙත එවා ඇති අතර නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය ගෙන ඇති පියවර 2016.05.15 දින වන විටත් කාරක සභාවට දැනුම් දී නැත.

2.සමාගම සතු කම්හලක් බදු දීම

සමාගම සතු කම්හලක් ප්‍රයිඩ් ටී (**Pried Tea**) නමැති ආයතනයට බදු දීම, ආයතනය සමාගමට බදු මුදල් ගෙවීම සම්පූර්ණයෙන් පැහැර හැරීම සහ කම්හලට

සමාගම මගින් ලබා දුන් රු. මිලියන 30ක වටිනාකමින් යුතු තේ දළු සඳහා මුදල් ගෙවීමද පැහැර හැර තිබීම.

නිර්දේශ

i. අමාත්‍යාංශ ලේකම් සහ සාමාන්‍යාධිකාරි එක්ව මාස 3 ක් ඇතුලත අයවිය යුතු මුදල් අය කර ගැනීමට කටයුතු කිරීම.

ii.මුදල් අය කර ගැනීම ප්‍රමාද කළ නිලධාරීන් සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.

iii.මෙම ගනුදෙනුව සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය ගත් තීරණ ඇතුලත් වාර්තාවක් මාස 3 ක් තුල එවීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

කාරක සභාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනය ගෙන ඇති පියවර 2016.05.15 දින වන විටත් කාරක සභාවට දැනුම් දී නැත.

3.සමාගම සතු කම්හල් 5 ක් සමබන්ධව

සමාගම සතු කම්හල් 5 ක් බදු ගිවිසුම් යටතේ වෙනත් ආයතන වලට ලබා දීම.

නිර්දේශ

මෙම ආයතන බදු ගිවිසුමේ අඩංගු කරුණු වලට පටහැනිව කටයුතු කරන්නේ නම් ඒ පිළිබඳව සහ එසේම පවතින සියළුම කම්හල් ඒවායේ අරමුණු වෙන් වෙන් වශයෙන් ආදායම, වත්කම්, අත්සන් කරන ලද බදු ගිවිසුම් සහ ඒවා අත්සන් කොට ඇත්තේ කුමන පාර්ශ්වයක් සමගද ? දැනට භුක්ති විදින්නේ කවුද යන්න ගැන සවිස්තර වාර්තාවක් මාසයක් ඇතුලත එවීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

කාරක සභාව මගින් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 දින වන විටත් අපොහොසත් වී ඇත.

4.රත්වත්ත වතුයාය

රත්වත්ත වතුයායෙන් රුපියල් මිලියන 15 ක පමණ විශාල පාඩුවක් ලැබීම.

නිර්දේශ

අමාත්‍යාංශ ලේකම් විගණන අංශයේද සහාය ඇතිව ටෙන්ඩර්කරුවන් 6 දෙනාම කැඳවා ඒ අයගේ සාක්ෂි සටහන් ද සමඟ මේ පිළිබඳ වාර්තාවක් කාරක සභාවට එවීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාව මඟින් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 දින වන විටත් අපොහොසත් වී ඇත.

5. <u>ගස් අලෙවි කිරීම</u>

i.විවිධ ගස් වර්ග 18,811 ක් පමණ 2016 වර්ෂයේදී රුපියල් මිලියන 140/- ක මුදලකට අලෙවි කිරීමට සැලසුම් කිරීම.

ii.ඉහත සඳහන් ගස් වලට අමතරව වෙනත් ගස් 99 ක් ජයසේන නමැත්තෙකුට අලෙවි කිරීම.

<u>**නිර්දේශ**</u>

i.කැපූ ගස් ප්‍රමාණය සහ ඇස්තමේන්තු කළ අගය ද ඇතුළත්ව මේ සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කිරීම.

<u>**වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම**</u>

කාරක සභාව මඟින් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ආයතනය 2016.05.15 දින වන විටත් අපොහොසත් වී ඇත.

ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය

විමර්ශනය සිදු කළ දිනය - 2016.04.07

හඳුනාගත් ප්‍රධාන ගැටලු

1. ජල සැපයුම් ව්‍යාපෘති සඳහා දේශීය බැංකු ණය ගැනීම රු. මිලියන 54,254

ජල සැපයුම් ව්‍යාපෘති 15 ක් සඳහා රු. මිලියන 54,254.3 ක ණය ලබා ගෙන ඇති බවත් ඉන් ව්‍යාපෘති 11 ක පිරිවැය15% සිට 338% ක් දක්වා වැඩි වී ඇති බවත් අනාවරණය විය. 2013.02.03 දිනැති කැබිනට් පත්‍රිකාව මත දේශීය බැංකු වලින් ණය ලබා ගැනීම සිදුවූ බවද සඳහන් කරන ලදී.

කැබිනට් පත්‍රිකාව අනුමත කිරීමෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ දී අදාල ව්‍යාපෘති යෝජනාව අනුමත කර ඇති බව අනාවරණය විය. මෙම ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගනු ලැබුයේ පුවත්පත් දැන්වීමක් පල කිරීමෙන් පසුව බවත් එම තෝරා ගැනීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලැබී ඇති බවද කාරක සභාව කළ විමසීමකදී අනාවරණය විය.

විශේෂ ඉල්ලීමක් නොමැති විදේශ අරමුදල් සම්පාදිත ව්‍යාපෘති (Unsolicited foreign funded project)

මිනුවන්ගොඩ, අත්තනගල්ල, ගම්පහ සමෝධානික ජල සැපයුම් ව්‍යාපෘතිය දැනට ණය ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව කොන්ත්‍රාත්කරුවන් විසින් ක්‍රියාත්මක කරමින් යනු ලබන බවත් ඉදිරියේදී ඒ සඳහා ගෙවීම් කිරීමට සිදුවන බවත් නිලධාරීන් විසින් පෙන්වා දෙන ලදී. එසේම 2020 දක්වා මෙම ව්‍යාපෘති සඳහා ණය ගෙවීම සිදු කරනු ලබන්නේ මහා භාණ්ඩාගාරයෙන් වන බවද අනාවරණය කර ගන්නා ලදී. කොන්ත්‍රාත්කරුට කොන්ත්‍රාත්තුව පිරිනැමීමට පෙර අධ්‍යක්ෂ මණ්ඩලය සැලකිල්ලෙන් සිතා බැලිය යුතු බවට SEMA ආයතනය විසින් දෙන ලද උපදෙස් සැලකිල්ලට නොගෙන කොන්ත්‍රාත්තුව පිරිනමා ඇති බව තවදුරටත් නිරීක්ෂණය විය.එසේම ඇ.ඩො. මිලියන 64 ක් වටිනා උප කොන්ත්‍රාත්තුවක් ප්‍රධාන කොන්ත්‍රාත්කරු විසින් නැවත ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය වෙතම පිරිනමා තිබුණි. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට ප්‍රදානය කළ කොන්ත්‍රාත්තුවක් සඳහා උප කොන්ත්‍රාත් කරුවෙකු ලෙස යළි ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයම කොන්ත්‍රාත්කරු විසින් නම් කිරීම ගැටලු සහගතය.

2. ඒකක පිරිවැය ඉහල නැගීම

ආයතනයේ ඒකක පිරිවැය ඉහල නැගීමට හේතුව මෙහෙයුම් පිරිවැය (operational cost) ඉහල නැගීම බවත් ඒ සඳහා මූලිකවම බලපා ඇත්තේ නව බඳවා ගැනීම්ද ඇතුළත් සේවකයන් සඳහා වැටුප් ගෙවීම් මත විශාල වශයෙන්

ඉහල යන ලද පරිපාලන වියදම් නිසා වන බව කාරක සභාව අනාවරණය කර ගන්නා ලදී.

<u>නිර්දේශ</u>

ආයතනය ලාභ ලබන මට්ටමට හෝ පාඩු නොලබන මට්ටමට පත්කිරීම සඳහා පරිපාලන වියදම් අවම කිරීමත් ආයතනය තුල යහපත් මූල්‍ය විනයක් ඇති කිරීමට කටයුතු කළ යුතුය.

3. <u>2015 වසරේදී සේවකයන් 500 ක් කොන්ත්‍රාත් පදනම මත බඳවා ගැනීම.</u>

තාවකාලික පදනම මත සේවය කරන 900 ක පමණ සේවක සංඛ්‍යාවක් ස්ථිර සේවයට බඳවා ගැනීමට ආයතනයට නොහැකිව තිබියදී පවා ආයතනයේ අයහපත් මූල්‍ය තත්ත්වයද නොසලකා 2015 වසරේදී කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ හා මහා භාණ්ඩාගාරයේ අනුමැතිය නොමැතිව, 2015 ජුනි මස 01 දින සිට මුලින් මාස 06 ක පුහුණු කාලයක් සඳහා හා මාස 06 අවසන් වූ පසු නැවත දීර්ඝ කර වසරකට පසු ආයතනයේ පුරප්පාඩු ඇති වූ පසු ස්ථිර සේවයට අන්තර්ග්‍රහණය කිරීමේ පදනම මත මාසිකව රු 20,000/- ක දීමනාවකට තම අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත බහුවිධ නිපුණතා කාර්යය පුහුණුව සඳහා පුවත්පත් වල දැන්වීම් පල කිරීමකින් තොරව සේවකයන් 500 දෙනෙකු බඳවා ගෙන ඇත. මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලැබීමේ අපේක්ෂාවෙන් මෙම බඳවා ගැනීම් සිදු කර ඇති අතර මේ සඳහා තම අනුමැතිය ලබා දිය නොහැකි බව මහා භාණ්ඩාගාරයේ 2015 ජුලි මස 15 දිනැති ලිපිය මගින් මණ්ඩලය වෙත දැනුම් දී ඇති බව ද කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. කළමනාකරණ දෙපාර්තමේන්තු චක්‍රලේඛ අංක 30 අනුව මෙවන් බඳවා ගැනීම සඳහා අනුමැතිය ලබා ගත යුතු වුවද ඒ සඳහා කටයුතු කර නොමැති බව ද කාරක සභාව නිරීක්ෂණය කරන ලදී. මෙම බඳවා ගැනීම් සඳහා අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී සාමාජිකයන් 07 දෙනෙකු එකඟත්වය පළ කර ඇති අතර මහා භාණ්ඩාගාරයේ නියෝජිත ඒ සඳහා තම විරුද්ධත්වය පළ කළ බව ප්‍රකාශ කරන ලදී. තවත් දෙදෙනෙකු අනුමැතිය දී ඇත්තේ කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ගැනීමට යටත්ව බැවින් භාණ්ඩාගාර අනුමැතිය ලැබී නොතිබියදී ද මාස 6 කට පසු පුහුණු කාලය තවදුරටත් දීර්ඝ කර ඇති බව කාරක සභාවට අනාවරණය විය.

<u>නිර්දේශ</u>

- ආයතනය සඳහා අවසන් වරට 2011 වසරේ අනුමත සේවක සංඛ්‍යාව කාරක සභාවට ඉදිරිපත් කිරීම.
- මෙම බඳවා ගැනීම් පිළිබඳව සති 2 ක් ඇතුළත කාරක සභාවට වාර්තාවක් ඉදිරිපත් කිරීම.
- මෙවන් වගකීම් රහිත කටයුතු සඳහා තම එකඟතාව පල කිරීමේදී අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් වඩා සැලකිලිමත්ව කටයුතු කිරීම.

- මෙම බඳවා ගැනීම් පිළිබඳව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ස්ථාවරය කාරක සභාවට දැනුම් දීම.
- විගණකාධිපති විසින් මේ පිළිබඳව විශේෂ විගණනයක් සිදු කිරීම.
- බඳවා ගැනීම් වහාම නවත්වන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරී විසින් මණ්ඩලයට ලිඛිතව දැන්වීම.
- මෙම ක්‍රියාමාර්ග නිසා පැන නැගිය හැකි නීති කටයුතු සඳහා ආයතනය නීති වියදම් නොදැරිය යුතු අතර අදාල වගකිය යුතු නිලධාරීන් පුද්ගලිකව ඒ සඳහා වගකිව යුතුය.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.25 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

4. <u>පරිපාලන සහ ගිණුම් කටයුතු වල පවතින අඩුපාඩු</u>

2014 ජුලි මස 09 වන දින පැවති කාරක සභා රැස්වීමේදී ආයතනයේ මූල්‍ය මෙහෙයුම් කටයුතු වාණිජ අංශයෙන් වෙන් කිරීම හා එය නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මූල්‍ය) යටතට පත් කරන ලෙස ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට කරන ලද නිර්දේශය මේ දක්වා ක්‍රියාත්මක නොකිරිම පිළිබඳව කාරක සභාවේ අවධානය ලක්විය. එසේ සිදු නොකිරීම හේතුවෙන් පාරිභෝගික බිල්පත් පිළිබඳ ගැටලු ද ආයතනයේ පරිපාලනමය ගැටලු ද මතුවී ඇති බවත් බැංකු ගිණුම් සසැඳීමේ කටයුතු ද අසීරු වී ඇති බවත් කාරක සභාවේදී අනාවරණය විය.

<u>නිර්දේශ</u>

- විගණකාධිපති විසින් මේ සම්බන්ධයෙන් වාර්තාවක් සැකසීම.
- කාරක සභාව 2014 ජුලි මස 09 වන දින මේ සම්බන්ධයෙන් ගනු ලැබූ ස්ථාවරයෙහිම සිටින බැවින් එම තීරණය භාණ්ඩාගාරය සමග නැවත සමාලෝචනය කර මේ සම්බන්ධයෙන් ගණන් දීමේ නිලධාරී විසින් නිගමනයකට පැමිණීම.
- කාරක සභාවේ නිර්දේශය ක්‍රියාත්මක නොකරන්නේ නම් ගණන් දීමේ නිලධාරී විසින් ඒ බව ලිඛිතව කාරක සභාව වෙත දැනුම් දීමට කටයුතු කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.25 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

5. <u>ආදායම් නොලබන ජලය (Non Revenue water)</u>

ආදායම් නොලබන ජලය අවම කිරීම සඳහා ගෙන ඇති ක්‍රියා මාර්ග සම්බන්ධයෙන් කාරක සභාව විමසන ලද අතර අදායම් නොලබන ජලය කොළඹ නාගරික ප්‍රදේශය තුල 47% ක පමණ ප්‍රතිශතයක් වන බවත් දිවයින පුරා එම අගය 27% ක පමණ ප්‍රතිශතයක් වන බවත් ආදායම් නොලබන ජල පිරිවැය අවම කිරීම සඳහා ව්‍යාපෘති 6ක් ක්‍රියාත්මක කර ඇති බවත් සඳහන් කරන ලදී.

<u>නිර්දේශ</u>

2015/2016 වසර සඳහා අදායම් නොලබන ජලය අවම කිරීම සඳහා දිස්ත්‍රික් මට්ටමින් සකසන ලද සැලසුමෙහි පිටපතක් ගණන් දීමේ නිලධාරී විසින් කාරක සභාවට ලබා දීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.25 දින වන විටත් අදාල වාර්තා පොදු ව්‍යාපාර කාරක සභාව වෙත ඉදිරිපත් කර නැත.

6. <u>අභ්‍යන්තර විගණන අංශය අතිරේක සාමාන්‍යාධිකාරිවරයකු යටතට පත් කිරීම</u>

ආයතනයේ අනෙකුත් සියළු අංශ අතිරේක සාමාන්‍යාධිකාරිවරුන් යටතේ පාලනය වන අතරතුර අභ්‍යන්තර විගණන අංශය පමණක් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරිවරයකු යටතේ මෙහෙයවීම නිසා විගණන කටයුතු සිදු කිරීමේදී යම් අපහසුතා ඇති වීමට ඉඩ ඇති බව කාරක සභාව පෙන්වා දෙන ලදී.

<u>නිර්දේශ</u>

අභ්‍යන්තර විගණන අංශයද වඩාත් ස්වාධීන වන ආකාරයට සංවිධාන ව්‍යුහය සකස්විය යුතු වීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.25 දින වන විටත් අභ්‍යන්තර විගණන අංශයද වඩාත් ස්වාධීන වන ආකාරයට සංවිධාන ව්‍යුහය සකස්කර ඒ බව පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවට දැන්වීමට කටයුතු කර නැත.

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව

විමර්ශනය සිදු කළ දිනය - 2016.04.08

හඳුනා ගත් ප්‍රධාන ගැටලු

1. දැනටමත් රුපියල් මිලියන 10,200 ක අලාභයක් රටට සිදු කළ හෙජින් ගිවිසුම

ඛනිජ තෙල් සංස්ථාවට බරපතල මූල්‍ය හානියක් සිදු කළ එමෙන්ම තවමත් නිමාවක් දක්නට නොමැති ප්‍රධානතම ගැටලුව වන ඛනිජ තෙල් මිල ඉහළ යන විට දැරීමට සිදුවන පාඩුව අවම කර ගැනීම සඳහා ස්ටෑන්ඩර්ඩ් චාටර්ට් බැංකුව, ඩොයිෂ් බැංකුව, කොමර්ෂල් බැංකුව, මහජන බැංකුව හා සිටි බැංකුව සමග ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අතර ඇති කර ගෙන තිබූ ඉදිරි සුරැකුම් ගනුදෙනුවේ (හෙජින් ගනුදෙනුව) වත්මන් තත්ත්වය පිළිබඳව කමිටුව දීර්ඝ ලෙස කරුණු විමසන ලද අතර මේ වන විට එම පාඩුව රුපියල් බිලියන 10.2 ක් බව අනාවරණය විය. (මෙම පාඩුව සැකසුනු ආකාරය දැක්වෙන සංක්ෂිප්ත ලේඛනය මෙම වාර්තාවේ ඇමුණුම 10 වශයෙන් දැක්වේ.) මෙම පාඩුව ඉදිරියේදී කළ යුතු යැයි අපේක්ෂා කරන ගෙවීම් ද එකතු කළ පසු රුපියල් බිලියන 15 ක් දක්වා වැඩි වන බවට ද කරුණු අනාවරණය විය.

සංස්ථාවේ වර්තමාන අධ්‍යක්ෂ මණ්ඩලය පත් වීමෙන් පසුව 2015 ඔක්තෝබර් මාසයේ සිට මෙතෙක් හෙජින් ගනුදෙනුවේ පාඩුව පිළිබඳව මූල්‍යමය හා භෞතික කාර්ය සාධන සමාලෝචනයක් සිදු කර නොමැත.

මේ සම්බන්ධව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ෂණ කොමිෂන් සභාව විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට පරීක්ෂණ කිරීමට භාර දී ඇති බවට නීතිපති විසින් 2009 දී අමාත්‍යාංශයේ ලේකම් වෙත දන්වා ඇති බව සභාපති විසින් දන්වන ලදි.

ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ වැඩ බලන නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මුදල්) පිළිතුරු දෙමින් මේ සම්බන්ධව එවකට සිටි අධ්‍යක්ෂ මණ්ඩලය වගකිව යුතු බවත් ගිවිසුමට එළඹීමේ දී නීතිපති උපදෙස් ලබා නොගැනීම මෙන්ම සභාපති හා කළමනාකාර අධ්‍යක්ෂ යන තනතුරු දෙකම එකම පුද්ගලයකු දැරීම වැනි අඩුපාඩු ඔහුට නිරීක්ෂණය වූ බවත් ප්‍රකාශ කරන ලදි.

නිර්දේශ

i. මේ පිළිබඳව අමාත්‍යාංශ මට්ටමින් නැවත විධිමත් පරීක්ෂණයක් පවත්වා වාර්තාවක් ලබා දීම.

ii. නීතිපතිවරයා, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව හා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව කරන පරීක්ෂණවල වර්තමාන තත්ත්වය පිළිබඳ සවිස්තර වාර්තාවක් මාසයක් ඇතුළත කාරක සභාවට ලබා දීම.

iii. නීතිපතිවරයා හරහා සිදු කරන පරීක්ෂණ පිළිබඳ එම වාර්තාව කාරක සභාව මගින් ද ලබා ගන්නා ලෙස උපදෙස් දීම.

iv. ඉදිරි දිනකදී මෙම ගනුදෙනුව සම්බන්ධව වෙනමම පරීක්ෂණයක් සිදු කිරීම

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.13 දින වන විටත් මෙම නිර්දේශ සම්බන්ධ වාර්තා කාරක සභාව වෙත ලැබී නොමැත.

2. <u>බැංකු ඇපකර නොමැතිව ණය ලබා දීම සහ බැංකු ඇපකර සීමාව ඉක්මවා ණය දීම</u>

2015.12.31 දිනට ඛනිජ තෙල් සංස්ථාවේ ලැබිය යුතු මුදල් ශේෂය රු. මිලියන 18,786 ක් වන අතර කාල විශ්ලේෂණ වාර්තාව අනුව ලැබිය යුතු මුදල් ශේෂය වර්ෂ 5 ට වැඩි රු. මිලියන 243 කි. 2015.12.31 දිනට ලැබිය යුතු ගිණුම් වල කාල විශ්ලේෂණ වාර්තාව ඇමුණුම 11 වශයෙන් දක්වා ඇත. එවැනි පසුබිමක් තුළ ඇපකර නොමැතිව ණය ලබා දීම සහ බැංකු ඇපකර සීමාව ඉක්මවා ණය දීම ගැටලු සහගත තත්ත්වයකි. 2011-2013 කාලපරිච්ඡේදය තුළ ඇපකර නොමැතිව ණය ලබා දීම් සහ බැංකු ඇපකර සීමාව ඉක්මවා ණය දීම් දැක්වෙන වාර්තාව ඇමුණුම 12 වශයෙන් දක්වා ඇත.

<u>නිර්දේශ</u>

මෙවැනි තත්ත්වයන් ඉදිරියේදී ඇති නොවීමට කටයුතු යොදන ලෙස කාරක සභාව ප්‍ර.ග.නි /ග.නි. වෙත උපදෙස් ලබා දීම.

3. <u>05 න් 03 ක්ම අක්‍රියව පවතින තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය</u>

සංස්ථාව සතු තෙල් ප්‍රවාහනය කරන නල මාර්ග ජාලයේ කොළඹ වරායේ සිට කොලොන්නාව තෙල් ගබඩාව දක්වා ස්ථාපිත නල මාර්ග 05 න් 03 ක්ම අක්‍රියව පවතින බව මෙහිදී අනාවරණය වු අතර නව නල පද්ධතියක් ඉතා ඉක්මනින් සැකසීම සඳහා කටයුතු යොදා ඇති බව සහ අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඒ සඳහා ලබා ගැනීමට කටයුතු යොදා ඇති බව සිලෝන් පෙට්රෝලියම් ස්ටෝරේජ් ටර්මිනල්ස් සමාගමේ **(CPSTL)** සභාපති විසින් ප්‍රකාශ කරන ලදි. මුතුරාජවෙල පර්යන්තයේ ධාරිතාවය ටොන් 5000 කින් පමණ වැඩි කිරීමට ද කටයුතු යොදා ඇති බව ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කරන ලදි.

මේ කරුණ නොසලකා හැරිය හොත් ඉදිරියේදී ඉතා බරපතල ගැටළු ඇති විය හැකි බව පැවසූ කාරක සභාව ඉතා ඉක්මන් ප්‍රතිකර්ම යොදන ලෙසට උපදෙස් ලබා දෙන ලදි.

නිර්දේශ

CPC සහ **CPSTL** සමාගම අතර ඇති සේවා ගිවිසුමෙහි පිටපතක් සහ මෙතෙක් එම කටයුතු සාර්ථකව ඉටු වී ඇත්ද යන්න පිළිබඳව වාර්තාවක් කාරක සභාවට සහ විගණකාධිපති වෙත ලබා දීම.

වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම

2016.05.13 දින වන විටත් මෙම නිර්දේශ සම්බන්ධ වාර්තා කාරක සභාව වෙත ලැබී නොමැත.

4. **උපරිම ලෙස ප්‍රයෝජනයට නොගත් අගනා සම්පතක් වන ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය**

වපසරිය හෙක්ටයාර් 358,553 ක් ඇති මෙම තෙල් ගබඩා සංකීර්ණයේ මෙට්රික් ටොන් 10,000 ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100 කින් දැනට එක් ටැංකියක් විනාශ වී ඇති අතර ටැංකි 14 ක් **LIOC** ආයතනය භාරයේ පවතී. මෙතෙක් මෙම සංකීර්ණය උපරිම ලෙස ප්‍රයෝජනයට නොගැනීම ගැන සහ රටේ සංවර්ධනය වෙනුවෙන් යොදා ගැනීමේ ඇති හැකියාව ගැන කමිටුව විසින් පුළුල් ලෙස සාකච්ඡා කරන ලදි.

මෙම ටැංකි වලින් ටැංකි 16 ක් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව භාරයට ගෙන තෙල් ගබඩා කිරීම සඳහා යොදා ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය අපේක්ෂාවෙන් සිටින බවට මෙහිදී කරුණු ඉදිරිපත් විය.

ඉදිරියේදී ත්‍රිකුණාමලය ආශ්‍රිත ව කරන සංවර්ධන වැඩ පිළිවෙළට ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක වීමට නියමිත බව ප්‍ර.ග.නි. අනාවරණය කළාය.

නිර්දේශ

i. මෙම ටැංකි සංකීර්ණයෙහි ඉදිරියේ දී සිදු කිරීමට අපේක්ෂා කරන සංවර්ධන වැඩසටහනේ ශක්‍යතා අධ්‍යයන වාර්තාවේ පිටපතක් අනුමැතියට යැවීමට පෙර කාරක සභාවට ලබා දීම.

ii. ත්‍රිකුණාමලය ආශ්‍රිත ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඒකාබද්ධ වැඩ පිළිවෙළ සඳහා යොමු කෙරෙන යෝජනා ඇතුළත් වාර්තාවක් කාරක සභාව වෙත ලබා දීම.

iii. මෙම තෙල් ටැංකි**,** තෙල් ගබඩා කිරීම සඳහා යොදා ගැනිමට යෝජනා කිරීම.

<u>වර්තමාන තත්ත්වය හා ප්‍රගතිය වාර්තා කිරීම</u>

2016.05.13 දින වන විටත් මෙම නිර්දේශ සම්බන්ධ වාර්තා කාරක සභාව වෙත ලැබී නොමැත.

ඇමුණුම 10

ඉදිරි සුරකුම් ගනුදෙනු (හෙජින්)

පහත සඳහන් නිරීක්ෂණ මේ සම්බන්ධයෙන් සිදු කරන ලදි.

විස්තරය	වටිනාකම(රු)
සංස්ථාව මගින් දැරූ අලාභය - ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව - ඩොයිෂ් බැංකුව - කොමර්ෂල් බැංකුව - මහජන බැංකුව	 508,160,338 664,299,578 53,118,229 52,953,561
ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුවට පියවීම (බේරුම් කිරීම) -	7,712,982,000
මුදල් ලැබීම් ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව - සිටි බැංකුව (මුදල් ලැබීම් - බේරුම් කිරීම) - සිටි බැංකුව (ගනුදෙනුව මත ලාභය)	 (152,160,848) (137,988,404)
නීති වියදම්	231,906,111
ගමන් වියදම්	5,261,827
බැංකු පොළී	250,570,863
අනෙකුත් වියදම්	20,139,947
උප එකතුව	**9,209,243,203**
සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කළ මහ බැංකුව විසින් දැරූ නීති වියදම්	567,487,381
ඉදිරි සුරකුම් ගනුදෙනුව මත සංස්ථාව දැරූ මුළු පාඩුව (හෙජින්)	**9,779,876,555**
සංස්ථාව වෙනුවෙන් මහ බැංකුව විසින් දැරූ නීති වියදම ප්‍රතිපූර්ණය නොකළ	3,145,971
ශ්‍රී ලංකා රජයට එරෙහිව ඩොයිෂ් බැංකුව ඒජී ආරම්භ කර ඇති බේරුම් කිරීමේ ක්‍රියාවලිය සඳහා පෙනී සිටි විදේශ නීතිඥයින් වෙනුවෙන් මහ බැංකුව විසින් ගෙවූ මුදල	404,293,575
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කළ වෙන් කිරීම් - ඩොයිෂ් බැංකුව ඒජී	13,079,333
ඉදිරි සුරකුම් ගනුදෙනුව (හෙජින්) මත රට විසින් දැරූ සමස්ත පාඩුව	**10,200,395,434**

ඇමුණුම 11

2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල කාල විශ්ලේෂණය

ගණුදෙනුකරු වර්ගය	2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ශේෂය රු.	2015 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම්වල කාල විශ්ලේෂණය					
		වර්ෂයකට අඩු රු.	වර්ෂ 1 සිට 2 දක්වා රු.	වර්ෂ 2 සිට 3 දක්වා රු.	වර්ෂ 3 සිට 4 දක්වා රු.	වර්ෂ 4 සිට 5 දක්වා රු.	වර්ෂ 5ට වැඩි රු.
බෙදුම්කරුවන්	814,620,088	783,717,567	10,981,377	3,267,723	1,379,217	252,922	15,021,283
ගුවන්සේවා	9,477,595,864	7,335,533,925	5,173,970	23,376,709	2,111,097,630	2,326,616	87,015
විදුලි ජනක පිරියත	4,497,947,417	3,500,944,742	243,391,845	753,610,830			-
රජයේ පාරිභෝගිකයින්	1,592,273,329	928,361,951	480,740,633	61,544,346	51,100,014	47,036,809	23,489,576
පුද්ගලික පාරිභෝගිකයින්	494,299,036	206,643,766	21,662,297	22,568,177	25,412,079	24,665,945	193,346,772
කෘෂි රසායනික	23,048,258	16,350,064	(421,790)	28,210	(30,360)	81,988	7,040,145
අනෙකුත්	1,886,997,518	1,884,788,387	(4,081,296)	1,362,001	65,474	(84,183)	4,947,135
එකතුව	**18,786,781,509**	**14,656,340,403**	**757,447,035**	**865,757,995**	**2,189,024,054**	**74,280,097**	**243,931,926**

ඇමුණුම 12

සංස්ථාව විසින් බැංකු ඇපකර නොමැතිව ණය පහසුකම් ලබා දී තිබූ හෝ බැංකු ඇපකර සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දී තිබූ අවස්ථා පහත පරිදි වේ.

වර්ෂය	විස්තරය	මුදල (රු.මි.)	අඩුපාඩුව
2011	පෞද්ගලික බෙදුම්කරුවන් 04 විදුලි ජනක පිරියත ගණුදෙනුකරුවකු පෞද්ගලික ගුවන් සේවා ගණුදෙනුකරුවකු	25.1	බැංකු ඇපකර වටිනාකම් සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දීම.
	රජයේ ගණුදෙනුකරුවන් 03	24.0	
2012	e-bank බෙදුම්කරුවන් සහ දින 05 ණය බෙදුම්කරුවන් 13 ගුවන් සේවා ගණුදෙනුකරුවන් සහ 06 විදුලි ජනක පිරියත ගණුදෙනුකරුවන් 02		බැංකු ඇපකර වටිනාකම් සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දීම.
	බෙදුම්කරුවන් 02 විදුලි ජනක පිරියත ගණුදෙනුකරුවකු සහ ගුවන් සේවා ගණුදෙනුකරුවන් 02	33,981.1	බැංකු ඇපකර නොතිබීම.
2013	ගුවන් සේවා ගණුදෙනුකරුවන් 02	3.6	බැංකු ඇපකර නොතිබීම. සංස්ථාව සම්පූර්ණ ණය මුදල සඳහාම බොල්ණය ප්‍රතිපාදනය කර තිබුණි.
	ගුවන් සේවා ගණුදෙනුකරුවන් 04		බැංකු ඇපකර වටිනාකම් සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දීම.
2014	දින 02 ණය බෙදුම්කරුවන් 21 (පර්යන්තයෙන් හා ඩිපෝවලින් චෙක්පත් බැංකු ගත කිරීම ප්‍රමාද වීම හේතුවෙන්) විදුලි ජනක පිරියත ගණුදෙනුකරුවන් 04 ගුවන් සේවා ගණුදෙනුකරුවන් 08		බැංකු ඇපකර වටිනාකම් සීමාව ඉක්මවා ණය පහසුකම් ලබා දීම.

Profit/ (Loss) before Tax (COPE – 2016)

No	Main	Profit / (Loss) before Tax of the YEAR (Rs.)		
		2015	2014	2013
1	Bank of Ceylon	25,278,915,000	20,290,957,000	15,708,772,000
2	Ceylon Electricity Board	** 19,766,273,000	(12,445,899,000)	22,264,544,000
3	LTL Holdings (Pvt) Ltd	5,609,759,807	4,261,873,482	4,278,038,681
4	Sri Jayawardenepura Hospital Board	Financial statements Not Submitted yet.	723,632,091	95,189,697
5	State Pharmaceutical Corporation	** 1,230,469,353	741,553,839	762,992,143
6	JEDB	Financial statements Not Submitted yet	(168,842,667)	(500,500,277)
7	Central Bank	(17,813,662,000)	(31,531,894,000)	(22,248,312,000)
8	Lanka puthra development bank	** 192,745,957	185,558,739	371,245,406
9	National film corporation	Financial statements Not Submitted yet.	36,807,353	11,622,173
10	Elkaduwa Plantations	Financial statements Not Submitted yet.	30,402,163	32,134,528
11	National Water supply & Drainage board	** 1,083,926,097	1,425,293,591	1,049,381,435
12	Ceylon petroleum corporation	** (15,653,160,000)	1,853,658,000	(7,889,407,000)
No	Main	Profit / (Loss) before Tax of the YEAR ended 31st March (Rs.)		
		2015/16	2014/15	2013/14
13	Sri Lanka Air Lines	** (11,478,460,000)	(16,433,030,000)	(32,357,980,000)
14	Rakna Arakshana Lanka Ltd	Financial statements Not Submitted yet.	Financial statements Not Submitted yet.	1,358,027,207

**** Unaudited figure**

No	Main	Surplus/(Deficit) before Tax for the YEAR (Rs.)		
		2015	2014	2013
15	National Council for Elders	** (2,378,580)	(602,642)	(8,737,765)
16	Agriculture & Agrarian Insurance Board	** 8,768,542	25,381,952	(81,920,566)
17	Sri Lanka Cricket Board	** 805,990,087	(392,785,480)	(1,111,022,034)
18	Palmyrah Development board	Financial statements Not Submitted yet.	(10,416,894)	(12,578,654)
19	Land reform commission	** 55,708,450	87,130,484	97,096,038

Net Surplus/ (Deficit) before Tax (COPE – 2016)

** Unaudited figure